# ජාතික විද්‍යා පදනම
# 2011 වාර්ෂික වාර්තාව

47/5, මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ - 07.
ශ්‍රී ලංකාව.

# සභාපතිතුමියගේ පණිවුඩය

2011 දෙසැම්බර් 31න් අවසන් වන මුදල් වර්ෂය සඳහා වන ජාතික විද්‍යා පදනමෙහි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකමි.

විශේෂයෙන් රජය මගින් මූල්‍යාධාර සපයනු ලබන ආයතනවලට 2011 මූල්‍ය වර්ෂය තුළ ජාතික ආර්ථිකය අඛණ්ඩ අභියෝගයක් විය. කෙසේවෙතත්, වසර තුළ මුහුණපෑමට සිදු වූ බාධක තිබියදීත්, විනිවිදභාවය, සහ කඩිනම් තීරණ ගැනීමෙහිලා ප්‍රශංසංසනීය බව සාක්ෂාත් කර ගන්නා අතරම, ජාතික විද්‍යා පදනම එහි අභිමතාර්ථයන් මුදුන්පත් කරගැනීමෙහිලා අඛණ්ඩව ක්‍රියාත්මක විය.

ජාතික විද්‍යා පදනමෙහි අනාගත කටයුතු සහ එහි සැපයුම් වැඩි දියුණු කිරීමට අවශ්‍ය කෙරෙන ක්‍රමෝපායික චින්තනය සහ ස්ථානගත කිරීම කළමනාකරණ මණ්ඩලයෙහි නිරන්තර සැලකිල්ලට බඳුන් විය. එනිසා, ජාතික විද්‍යා පදනමෙහි ක්‍රියාකාරිත්වය ශක්තිමත් කිරීම, ඉහළ ප්‍රතිඵල සහිත තාක්ෂණයන්ගෙන් සමන්විත වන නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම, සහ විද්‍යාත්මක ප්‍රජාවට සේවය සැපයීම සඳහා මාර්ග සම්පාදනය කිරීම, ස්වාර්ථයෙන් සහ මනෝවිහිතීන්ගෙන් තොරව ප්‍රබල ලෙස, එක තැන නොරඳා නොනැවතී සිදු කරන ලදී.

ගතවුණු වසර තුළ ජාතික විද්‍යා පදනමට විද්‍යාත්මක ව්‍යාපෘති බොහොමයක් ක්‍රියාත්මක කිරීම, කළමනාකරණ මණ්ඩලයෙහි, උපදේශක මණ්ඩලවල, සහ පර්යේෂණ මඩුලුවල මෙන්ම විශේෂයෙන් කාර්යමණ්ඩලයෙහි දැඩි කැපවීම මත සිදු කළ බව මෙහිලා සඳහන් කරන්නේ හද පිරි සතුටිනි.

මීට අමතරව, වසර තුළ තම අරමුණු කරා ළඟා වීමේ දී ජාතික විද්‍යා පදනම මගින් ක්‍රියාත්මක කරන ලද බොහොමයක් ක්‍රියාකාරකම් අතරින් ජාතික විද්‍යා පදනම විසින් මූලාරම්භය සපයන ලද SLINTEC මගින් සිදු කෙරුණු නැනෝතාක්ෂණ කටයුතු ඔස්සේ, විද්‍යාඥයින්, ව්‍යාපාර, සහ රජය අතර ගොඩනැගුණු සහක්‍රියාමය සම්බන්ධතාවය පිළිබඳ විශේෂයෙන් සඳහන් කිරීමට කැමැත්තෙමි.

2006 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද නැනෝතාක්ෂණ මූලාරම්භය, 2011 වසර තුළදී ද මනා ලෙස ක්‍රියාත්මක වූ අතර SLINTEC මගින් සොයාගන්නා ලද නව නිෂ්පාදිත ක්‍රියාවලි සඳහා එ.ජ. පේටන්ට් හතක් (07ක්) දැනටමත් අයදුම් කර තිබේ. පර්යේෂණ, වෙළෙඳපොළ වෙත ගෙන ඒම සඳහා පුද්ගලික අංශය සමග සහයෝගයෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාවය සපුරාලීම, සහ කුඩා, මධ්‍යම, මෙන්ම විශාල පරිමාණයේ සමාගම්වලට නවෝත්පාදන සඳහා සහයෝගය සැපයීම සඳහා රජය ධනාත්මක කාර්යභාරයක් ඉටු කළ යුතු බව මෙම මූලාරම්භය මගින් පෙන්නුම් කරන ලදී.

රට තුළ තිරසර දැනුම් ආර්ථිකයක් සඳහා අත්‍යවශ්‍ය ගාමක බලවේගයක් වන ත්‍රෛපාක්ෂික සංකලනයක් සපයමින්, සාර්ථකත්වයට පාදක වන, විද්‍යාඥයින්, ව්‍යාපාර, සහ රජය අතර සහක්‍රියාමය සම්බන්ධතාවය මෙම ප්‍රයත්නය මගින් අත්පත් කර ගෙන තිබේ. තවදුරටත්, 2011 දී IDRC මගින් මූල්‍යාධාර සපයනු ලබන ව්‍යාපෘතියක් මගින් ශ්‍රී ලංකාවේ නැනෝතාක්ෂණ යොදා ගැනීම් සඳහා අත්‍යවශ්‍යවන යාමන රාමුවක් සැකසීම ආරම්භ කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන ලදී.

කෙසේවෙතත්, පහත සඳහන් ප්‍රධාන බාධක සමහරකට ජාතික විද්‍යා පදනමට මුහුණ දීමට සිදු විය.

- බලාපොරොත්තු වූ ක්‍රියාකාරකම් සිදු කිරීමට අවශ්‍ය කෙරෙන කාර්යමණ්ඩලය; විශේෂයෙන්ම විද්‍යාත්මක කාර්යමණ්ඩලය ප්‍රමාණවත් පරිදි නොසිටීම

- අවශ්‍ය කෙරෙන අවස්ථාවල දී අරමුදල් නොතිබීම, සහ මහා භාණ්ඩාගාරය මගින් නිකුත් කරනු ලබන අයවැය හා සම්බන්ධ සැපයීම් පිළිබඳ පෙර නිමිත්තක් නොතිබීම

වාසනාවකට මෙන්, නිරන්තර අභියාචකයන්ගෙන් සහ පදනම නියෝජනය කිරීම්වලින් අනතුරුව ජාතික විද්‍යා පදනමෙහි සේවක සංඛ්‍යාව සඳහා 2011 දී අනුමැතිය ලැබුණු අතර සමහර ප්‍රධාන තනතුරු හැරුණු විට, සමහර කාර්යමණ්ඩල නිලධාරීන් පදනමෙහි කටයුතු සඳහා පත් කිරීමට මෙන්ම ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා ජාතික විද්‍යා පදනම වෙත ඉඩප්‍රස්තාව ලබා දෙන ලදී. පුළුල් වගකීම් සහිතව ව්‍යාපෘති සැලසුම් කිරීම සඳහා සහ ගුණත්වය සහතික කිරීම වැනි එයට අදාළ ක්‍රියාවලි සඳහා විශේෂඥයකු පත් කිරීම පිණිස දරණ ලද උත්සාහය, එකී සේවක මණ්ඩල ධුරය සඳහා අවශ්‍ය කෙරෙන අනුමැතිය ලබා නොදීම හේතු කොට ගෙන අසාර්ථක විය. කෙසේවෙතත්, ආයතනයෙහි සහ විද්‍යාත්මක ප්‍රජාවෙහි උන්නතිය සඳහා අතිශයින්ම වැදගත් වන මෙම ධුරය ස්ථාපිත කිරීම සඳහා අඛණ්ඩව වෙර දරණු ඇත.

ජාතික විද්‍යා පදනම ආදායම් උපද්දවන ආයතනයක් නොවේ. එය, මූලික වශයෙන් වර්තමානයෙහි රජයේ මුදල් මත යැපෙන, සේවා සපයන්නෙකු ලෙස හැඳින්විය හැකිය. ප්‍රමුඛතාවය මත විවිධ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රජය සතු සීමිත අරමුදල් වෙන් කිරීමේ අභියෝගයකට රජය මුහුණ පා සිටින අතර, ජාතික විද්‍යා පදනම මෙම උභතෝකෝටික ගැටළුව පිළිබඳ මනාව වටහාගෙන තිබේ. යටත් පිරිසෙයින්, පාර්ශ්වික හා තාවකාලික පදනම මත විද්‍යාත්මක කටයුතු සඳහා විදේශ මූල්‍යාධාර ලබා ගැනීම සහ පුද්ගලික අංශයේ දායකත්වය ප්‍රවර්ධනය කිරීම මෙම පසුබිම යටතේ සලකා බලන ලද විකල්ප ක්‍රියාමාර්ග විය. මෙය හඳුනාගැනීමෙන් පසුව, ජාතික විද්‍යා පදනම ව්‍යාපෘති කිහිපයක් සඳහා විදේශීය අරමුදල් ඉල්ලුම් කරන ලද අතර, ඊට අදාළ ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලදී. පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා මානව සම්පත් දියුණු කිරීම කඩිනම් කිරීමට සැලසුම් කරන ලද මෙකී ව්‍යාපෘති ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද නමුදු, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් මේ වන තෙක් ලැබී නොමැත. ජාතික විද්‍යා පදනම මගින් සොයාගන්නා ලද විදේශීය අරමුදල් පවා ලබා ගැනීමට අපහසු වීම 2011 වර්ෂය තුළ දී මුහුණ දීමට සිදු වූ ප්‍රධාන ගැටළුවක් විය.

ජාතික විද්‍යා පදනමෙහි කටයුතු කරන විට දී, අපගේ වැඩකටයුතු සිදු කිරීමේ දී, අප අපටම ආවේණික ආකාරයකට කටයුතු කරන්නෙමු. පර්යේෂණ ක්ෂේත්‍රවල සහ විද්‍යාව ප්‍රචලිත කිරීමේ දී නවෝත්පාදන සහ නිර්මාණශීලි බව උත්ප්‍රේරණය කිරීම සඳහා අපි ප්‍රයත්න දරා ඇත්තෙමු. සියලුම ක්ෂේත්‍රවල පර්යෙෂණ, වැඩසටහන්, සහ ජනතාව වෙත පදනමෙහි නොනැසී පැවතුණු කැපවීම, අප මහත් අගය කොට සලකන්නෙමු.

2011 වසර තුළ ජාතික විද්‍යා පදනමෙහි මෙහෙවර සම්පූර්ණ කරගැනීමෙහිලා වැඩ කටයුතු ක්‍රියාත්මක කරවීමේ වගකීමට ප්‍රධාන වශයෙන් උරදුන්, විශේෂයෙන් ජාතික විද්‍යා පදනමෙහි ප්‍රධාන විධායක නිලධාරී, ආචාර්ය සරත් අබේවර්ධන ඇතුළු ජාතික විද්‍යා පදනමෙහි සියලුම මට්ටම්වල කාර්යමණ්ඩල සමාජිකයින් වෙත මාගේ හෘදයාංගම ස්තූතිය මෙහිදී පළ කිරීමට කැමැත්තෙමි. මෙම කැප කිරීම ජයග්‍රහණය දක්වා ඉදිරියට ගෙන යනු ඇතැයි අපේක්ෂා කරමි.

විද්‍යාත්මක ප්‍රජාවට සහ රටට සේවය කිරීමේ දී ජයග්‍රහණය කරා ළඟාවීමට උර දුන් කළමනාකරණ මණ්ඩලයෙහි, උපදේශක මණ්ඩලවල,සහ පර්යේෂණ මඩුලුවල සමාජිකයින්ට ඔවුන්ගේ උද්‍යෝගිමත් නායකත්වය සැපයීම සහ කැපවීම වෙනුවෙන් මාගේ ස්තූතිය හිමිවේ.

මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු
සභාපතිනිය

# අධ්‍යක්ෂගේ වාර්තාව

මෙම සමාලෝචනය 2011.12.31න් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ ජාතික විද්‍යා පදනමෙහි කාර්යසාධනය කෙරෙහි අවධානය යොමු කරයි.

## මූල්‍ය විශ්ලේෂණය

රජයේ මූල්‍යාධාර නියමිත වේලාවට ලැබීමේ අස්ථිරභාවය කරණ කොට ගෙන දැඩි පිරිමැසුම් නිර්දේශ යොදා ගැනීමට සහ එහි වගකීම් කෙරෙහි පරීක්ෂාකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට කළමනාකාරීත්වයට සිදු විය. එනිසා, මානව සම්පත ද ඇතුළත්ව තිබෙන්නා වූ සම්පත්, ක්‍රියාත්මක තත්වයේ පවතින ප්‍රදාන අධීක්ෂණය සඳහා වඩා තීව්‍ර ලෙස යොදා ගැනීමට කටයුතු කරන ලදී. වසර සඳහා පර්යේෂණ කටයුතුවලට වෙන් කරන ලද මුළු මුදලෙහි වටිනාකම ආසන්න වශයෙන් රු. මිලියන 209ක් විය.

## අරමුණ සාක්ෂාත් කර ගැනීම

පවතින මූල්‍ය අස්ථිරතා මධ්‍යයේ වුව ද පදනමෙහි අරමුණු ඉටු කර ගැනීම සඳහා යොදා ගත් ක්‍රමෝපායයන් ප්‍රබල ලෙස නොනවත්වා සිදු කර ගෙන යෑමට කටයුතු කරන ලදී. අපගේ බොහාමයක් වැඩසටහන් ඔස්සේ ස්වභාවික සහ ව්‍යවහාරික විද්‍යා දෙවර්ගයෙහිම පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම, තාක්ෂණික දියුණුව ලබා ගැනීම, ව්‍යවසායකත්වය, සහ මතුව එන ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම, translational පර්යේෂණ, විද්‍යා සන්නිවේදනය සඳහා පහසුකම් සැලසීම, සහ විද්‍යාත්මක දත්තපාදක පවත්වා ගෙන යෑම යන අරමුණු සාක්ෂාත් කර ගන්නා ලදී.

## පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම

විද්‍යාත්මක පර්යේෂණ සඳහා අවශ්‍ය කෙරෙන අතිරේක මූල්‍යමය, භෞතික, සහ මිනිස් බල සම්පත් සැපයීමෙහි අදහස සහිත වූ තරඟකාරී පර්යේෂණ ප්‍රදාන වැඩසටහන මගින් වසර තුළ පර්යේෂණ ප්‍රදාන 68ක් පිරිනමන ලදී. පිරිනමන ලද පර්යේෂණ ප්‍රදානවල වැඩකටයුතු සඳහා පහසුකම් සැපයීම පිණිස පර්යේෂණ සහායකයින් සහ තාක්ෂණ සහායකයින් 20 දෙනෙකු සඳහා ප්‍රතිපාදන සපයන ලදී. පර්යේෂකයින් හට දර්ශන විශාරද (PhD) සහ දර්ශනපති (M.Phil) උපාධි අටක් (08ක්) ලබා ගැනීම සඳහා පහසුකම් සපයන ලද අතර ප්‍රදානවලින් උත්පාදනය වූ පර්යේෂණ පත්‍ර 24ක් වසර තුළ දී විදේශීය සහ දේශීය වාරසඟරාවල ප්‍රකාශනය කරන ලදී. තරඟකාරී පර්යේෂණ ප්‍රදාන වැඩසටහනෙහි නව ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද මුදල රු. මිලියන 120ක් වූ අතර වසර තුළ තරඟකාරී පර්යේෂණ ප්‍රදාන වැඩසටහන සඳහා වෙන් කරන ලද මුළු මුදල රු. මිලියන 170.8ක් විය.

## ජාතික තේමා මූලික පර්යේෂණ වැඩසටහන (NTRP)

ජාතික අවශ්‍යතා මත පදනම්ව ආරම්භ කෙරෙන සහ ජාතික සංවර්ධනය සඳහා යොදා ගත හැකි අවසන් පර්යේෂණ ප්‍රතිඵලයක් ජනිත කරමින් අවසන් කෙරෙන පර්යේෂණ ඔස්සේ රටේ ජාතික අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කෙරෙන විද්‍යා මෙහෙයක් වෙත දිශාභිමුඛ වූ බහු විෂයයික සහයෝගිතා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, ජාතික තේමා මූලික වැඩසටහනින් අදහස් කෙරේ. ආහාර සුරක්ෂිතතාවය, ජල සුරක්ෂිතතාවය, සහ දේශගුණ විපර්යාස, ප්‍රමුඛතා ක්ෂේත්‍ර ලෙස හඳුනා ගනු ලැබ ඇත. පර්යේෂණ අන්තර, සහ ප්‍රමුඛතා හඳුනා ගෙන ඇති අතර පළමු අවධිය වන ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ වැඩසටහන් 05ක් සඳහා සුදුසු වැඩපිළිවෙළක් සහ ක්‍රියාත්මක කිරීමෙහි ක්‍රමෝපාය සකස් කරන ලදී.

## පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා උපකාරක වැඩසටහන (SUSRED)

විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල පශ්චාත් පර්යේෂණ උපාධි (දර්ශනපති; M.Phil හා දර්ශන විශාරද; PhD) සඳහා පර්යේෂණ පවත්වන ශිෂ්‍යයන් අධීක්ෂණය කිරීමෙහි යෙදෙන විද්‍යාඥයින්/ඉංජිනේරුවන් පෙළඹවීම, උපකාර කිරීම, සහ පිළිගැනීමකට ලක් කිරීම සඳහා SUSRED ආරම්භ කරන ලදී. ඉහත වැඩසටහන යටතේ අයදුම්පත් කැඳවන ලද අතර, ලැබුණු අයදුම්පත් 24 අතරින් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් නව දෙනෙකු, පිරිනැමීම් සඳහා තෝරා ගන්නා ලදී.

## තාක්ෂණ සහ ව්‍යවසායකත්ව සංවර්ධනය

තාක්ෂණ ප්‍රදාන සහ මතුව එන ව්‍යාපාර වැඩසටහන්, සහ තේමා මූලික පර්යේෂණ වැඩසටහන හඳුන්වා දීම මගින් විමර්ශන පාදක කොට ගත් පර්යේෂණවල සිට ඉල්ලුම අනුව මෙහෙයවන පර්යේෂණ දක්වා වර්තමාන නැඹුරුව වෙනස් කිරීමේ ප්‍රයත්නයෙහි අප යෙදී සිටින අතර අයවැය වෙන්කිරීමේ දී මෙම අරමුණ පිළිබඳව වැඩි සැලකිල්ලක් දක්වා ඇත. ව්‍යවසායකත්ව අත්වේෂණයන්ගේ උනන්දුව හීනවීම ප්‍රතිඵලය බවට පත් කරවමින්, පර්යේෂකයින්ට/තාක්ෂණඥයින්ට සාධාරණ කාල සීමාවක් තුළ දී වෙන් කරන ලද ප්‍රතිපාදන පවා භාවිතයට ඉඩ නොදුන්, විශේෂයෙන් ප්‍රසම්පාදන පටිපාටි වැනි දැඩි නීති රීති සහිත ක්‍රියාමාර්ග හේතු කොට ගෙන, ආර්ථිකය දියුණු කිරීමට මග සූදානම් කරමින්, කර්මාන්ත පිළිබඳ බෙහෙවින් අවශ්‍ය වූ බලපෑම සහතික

කරමින්, උපයෝගිතා වැඩසටහනක් වේ යැයි අපේක්ෂා කරන ලද තාක්ෂණ, සංවර්ධන සහ මතුව එන ව්‍යාපාර පිළිබඳ ප්‍රදාන වැඩසටහනට වේගයෙන් ඉදිරියට යෑමට නොහැකි විය. කෙසේ වෙතත්, මෙම වැඩසටහන් හැකි තරම් ප්‍රවර්ධනය කිරීමටත්, මූලික වශයෙන් වක්‍රාකාරව හෝ ආර්ථිකය මත ධනාත්මක බලපෑමක් තිබෙන තාක්ෂණිකමය නවෝත්පාදන සහ නව ව්‍යාපාර මතුවීමට උපයෝගී ආකාරයකට උපකාර සැපයීමේ අපේක්ෂාවෙන් ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබුණි.

තාක්ෂණ ප්‍රදාන සඳහා සාමාන්‍යයෙන් ලැබෙන අයදුම්පත් ප්‍රමාණය සංඛ්‍යාවෙන් අඩු වන අතර වසර සඳහා ලැබුණු අයදුම්පත් 27න්, 7ක් සඳහා ප්‍රදාන පිරිනමන ලදී. මේ වර්ෂය තුළ නිම කරන ලද තාක්ෂණ ප්‍රදානවල ප්‍රතිඵල කිහිපයක් පිළිබඳ නිදර්ශන පහත දැක්වේ.

- සංඥා මීටරයක් සැලසුම් කිරීම සහ සකස් කිරීම
  ප්‍රධාන මොඩියුල තුනකින් එනම්, සංඥා ලබා ගන්නා සහ ශක්ති නිමානය කරන මොඩියුලයක්, ක්ෂුද්‍ර තරංග ඉහළ/පහළ පරිවර්තකයක් සහ නිවැරදි සැහැල්ලු වූ පුළුල් පරාස ඇන්ටනාවක් යන මොඩියුලවලින් සමන්විත මෙගා හර්ටස් 300-1300 දක්වා සංඛ්‍යාත පරාසයක් සඳහා සකස් කරන ලද ආරම්භක මූලාකෘතිය, සහ මෙම ව්‍යාපෘතිය නිම කිරීම, පුළුල් පරාස ක්ෂුද්‍රතරංග පරිපථ සහ ඇන්ටෙනා සහ අධිවේගී සංඛ්‍යාංක පරිපථ ශ්‍රී ලංකාවේ දී සැකසිය හැකි බව සනාථ කොට ඇත.

- භූමි අභ්‍යන්තරයේ ඇති ජල මාර්ගවල ප්‍රවාහන කටයුතු සඳහා භාවිත කිරීම පිණිස පරිසර හිතකාමී යාන්ත්‍රික බෝට්ටුවක් නිෂ්පාදනය කිරීම

  භූමි අභ්‍යන්තරයේ ඇති ජල මාර්ගවල භාවිත කිරීම සඳහා එම පරිසර පද්ධතියෙහි ඉවුරුවලට හානියක් සිදු නොකර, මගීන් 50 දෙනෙකු පමණ ප්‍රවාහනය කළ හැකි පරිසර හිතකාමී, යාන්ත්‍රික බෝට්ටුවක් සැලසුම් කර නිෂ්පාදනය කරනු ලැබ තිබේ.

## නැනෝතාක්ෂණ මූලාරම්භයන්

නැනෝතාක්ෂණය හා සම්බන්ධ අපගේ ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර තුළ සංඛ්‍යාත්මකව සහභාගීවන්නා වූ තනි පුද්ගල ක්‍රියාකාරීන්, රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය සංවිධාන සහ පුද්ගලික ආයතන යන සියල්ල අන්තර්ගත වන කණ්ඩායම් ගණනාවක් සමග ජාතික විද්‍යා පදනම සහයෝගයෙන් කටයුතු කිරීමට ප්‍රයත්න දරා ඇත.

ව්‍යාපෘති යෝජනාවලියට අනුකූලව ප්‍රතිඵල ලබා ගැනීම පිණිස අධීක්ෂණය සිදු කෙරෙන, ක්‍රියාත්මක තත්වයේ පවතින නැනෝතාක්ෂණය හා සම්බන්ධ ප්‍රදාන තුනක් (03ක්) තිබෙන අතර 2011 වසර තුළ නව ප්‍රදාන තුනක් පිරිනමනු ලැබ ඇත.

නැනෝතාක්ෂණය ප්‍රවර්ධනය කිරීම පිණිස දැනුම්වත් කිරීමේ සැසි පවත්වන ලද අතර ශ්‍රී ලංකාව තුළ නැනෝතාක්ෂණය භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීමට වැදගත්වන නැනෝතාක්ෂණය හා සම්බන්ධ කටයුතු සඳහා ජාතික ප්‍රතිපත්තියක් සහ යාමන රාමුවක් කෙටුම්පත් කරන ලදී.

විද්‍යා හා තාක්ෂණ ප්‍රමුඛතා සැකසීමේ දී සහ ජාතික ක්‍රමසම්පාදන ක්‍රියාවලියේ දී තාක්ෂණ පෙර දැක්ම භාවිත කරන විට තාක්ෂණය භාවිත කිරීමේ වැදගත්කම පිළිබඳව දේශීය විද්‍යාඥ හා තාක්ෂණික ප්‍රජාව, ප්‍රතිපත්ති සකස් කරන්නන්, සහ අදාළ රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීමට ප්‍රයත්න දරණ ලදී.

ඉන්දියාවේ සහ පාකිස්ථානයේ සහයෝගිතාවය සහිතව පාලන ව්‍යුහයක් සහ යාමන රාමුවක් සැකසීම පිළිබඳ IDRC මගින් මූල්‍යාධාර සපයනු ලබන පර්යේෂණ වැඩසටහනක් ආරම්භ කර, හවුල්කාර ආයතන මගින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා මත පදනම්ව, මූල්‍යාධාරවල පළමු වාරිකය එකී හවුල්කාර ආයතනය වෙත යවනු ලැබ ඇති අතර, එකී වැඩසටහන වසර තුළ ක්‍රියාත්මක තත්වයේ පැවතුණි.

නැනෝතාක්ෂණ මූලාරම්භයෙහි අංගයක් වූ SLINTEC, නැනෝතාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, වෙත සහයෝගය සපයමින්, එය ඉතාමත් සාර්ථක ව්‍යායාමයක් බව සනාථ කරමින්, මෙම රාජ්‍ය පෞද්ගලික හවුල්කාර ආකෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කෙරුණි.

මීට, අමතරව, නැනෝතාක්ෂණය සහ එහි යොදා ගැනීම් පිළිබඳව පාසල් ළමුන් දැනුම්වත් කිරීම පිණිස දේශීය වැඩමුළු කිහිපයක් පවත්වන ලදී.

## බුද්ධිමය දේපළ පිළිබඳව දැනුම්වත් කිරීම

පේටන්ට් ඒකාබද්ධ ගිවිසුම (PCT)-WIPO මාර්ගය ඔස්සේ ජාත්‍යන්තර පේටන්ට් සෙවුම් සඳහා සහයෝගය ලබා දීම ද ඇතුළත්ව බුද්ධිමය දේපළ පිළිබඳව විශ්ව විද්‍යාල තුළ අධ්‍යාපනය ලබා දෙමින්, පේටන්ට් අයදුම්පත්‍ර කෙටුම්පත් කිරීමට සහ නිසි අයුරින් සම්පූර්ණ කිරීමට උපදෙස් ලබා දෙමින් බුද්ධිමය දේපළ (IP) පිළිබඳව දැනුම්වත්භාවය සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු සිදු කරන ලදී.

නව නිෂ්පාදකයින් නව දෙනෙකුට (09) දේශීය පේටන්ට් පත්‍ර සම්පූර්ණ කිරීමට සහ ඒ අතරින් තිදෙනෙකුට (03) PCT ඔස්සේ ජාත්‍යන්තර පේටන්ට් පත්‍ර සම්පූර්ණ කිරීම සඳහා පහසුකම් සපයන ලදී. වසර තුළ විෂය පිළිබඳව ජාතික විද්‍යා පදනම් නිර්ණායක තර්කානුකූලව විස්තර කරන ලදී.

## විද්‍යාව සන්නිවේදනය කිරීම

- පාඨශාලීය විද්‍යා සමාජ වැඩසටහන, විද්‍යාත්මක පර්යේෂණ පාසල් ප්‍රජාව අතර ප්‍රවර්ධනය කිරීම, විදුරාව, විද්‍යා ප්‍රවෘත්ති පත්‍රිකාව, විද්‍යා ග්‍රන්ථ මාලාව වැනි ප්‍රකාශන, ළමුන් සහ දෙමාපියන් සහභාගිවන කුටුම්භ විද්‍යා වැඩසටහන්, කර්මාන්ත, පර්යේෂණ ආයතන, සහ පෞද්ගලික ආයතන අතර බන්ධුතා ගොඩනැගීම, මහජනතාව අතර විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන්, සහ නැනෝතාක්ෂණය පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන් යනාදී වැඩසටහන් මාලාවක් ඔස්සේ, එදිනෙදා ජීවිතයට, නිෂ්පාදන සහ සේවාවලට විද්‍යාව සහ තාක්ෂණය සම්බන්ධ කරවන, මහජනතාව අතර, විශේෂයෙන් පාසල් ළමුන් අතර, දැනුම පදනම් කරගත් සංස්කෘතියක් ගොඩනැගීම උදෙසා විද්‍යාව හා තාක්ෂණය ප්‍රචලිත කිරීමට කටයුතු කරන ලදී. නව පාඨශාලීය විද්‍යා සමාජ 131ක් ලියාපදිංචි කිරීමත් සමග ලියාපදිංචි පාඨශාලීය විද්‍යා සමාජ සංඛ්‍යාව 622 දක්වා ඉහළ නංවන ලදී.

- වර්තමානයේ තොම්සන් රොයිටර් දත්තපාදකයෙහි සුචිගත කරනු ලැබ ඇති එකම ශ්‍රී ලාංකීය වාරසඟරාව වන ජාතික විද්‍යා පදනම් වාරසඟරාව ද ඇතුළත්ව ජාතික විද්‍යා පදනම් ප්‍රකාශන මගින් අදාළ ක්ෂේත්‍රයේ නියැළෙන්නන් වෙත කාර්යක්ෂමව විද්‍යාව සන්නිවේදනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

- අනාගතයේ දී ශක්තිමත් ජාලයක් ගොඩනැගීමේ අපේක්ෂාව සහිතව ශ්‍රී ලාංකික විද්‍යා සහ තාක්ෂණ ප්‍රජාව අතර අඛණ්ඩ සන්නිවේදනය සඳහා මාසික ඉ-ප්‍රවෘත්ති පත්‍රිකාවක් නිර්මාණය කරන ලදී. එය සතුව ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල වෙසෙන විද්‍යාඥයින් 4,000 පමණ වන දායකත්ව ලයිස්තුවක් සකස් කොට තිබේ.

- **ඉ-විද්‍යා හා තාක්ෂණය**
  දැනුම මූලික සමාජයක් ගොඩනැගීමේ අරමුණ සහිතව ජාතික රූපවාහිනී නාළිකා ඔස්සේ විකාශය වුණු, විද්‍යාව හා තාක්ෂණ ක්ෂේත්‍රයෙහි විවිධ මාතෘකා ඔස්සේ නිෂ්පාදනය කරන ලද විද්‍යාත්මක වැඩසටහන් 12කින් සමන්විත වන “මිහිමඬල” වීඩියෝ වැඩසටහන් මාලාව සඳහා ICTA මගින් සංවිධානය කරන ලද “ඉ-ස්වාභිමානී සම්මාන උළෙලේ දී විශේෂ කුසලතා සම්මානයක් ද ඉන්දියාවේ නවදිල්ලි නුවර ‘ඩිජිටල් එම්පවර්මන්ට් ෆවුන්ඩේෂන්’ මගින් ප්‍රදානය කෙරෙන “මන්තන් සම්මානය” ද හිමිවිය.

## ජාත්‍යන්තර සබඳතාවය

ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ට තම පර්යේෂණ සොයාගැනීම් ජාත්‍යන්තර වැඩසටහන්වල දී ඉදිරිපත් කිරීමට හෝ විද්‍යාත්මක ක්ෂේත්‍රයෙහි නව සංවර්ධනයන් පිළිබඳව දැනුම ලබා ගැනීමට හෝ අවස්ථා සපයන ජාතික විද්‍යා පදනම් චාරිකා ප්‍රදාන, සහ විදේශයන්හි උසස් විද්‍යාගාර සහ විශිෂ්ට තලයේ පර්යේෂණ මධ්‍යස්ථානවල පුහුණුව සඳහා අවස්ථා සැපයීම මගින් විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය තුළ ජාතික හැකියාව ඉහළ නැංවීම සඳහා වූ විදේශීය විශේෂ පුහුණු වැඩසටහන වැනි කේන්ද්‍රීයව වැදගත් වැඩසටහන් ඔස්සේ විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සම්බන්ධීකරණ කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යන ලදී.

## දේශීය හා ජාත්‍යන්තර විද්‍යාත්මක දැනුම බෙදා ගැනීම

“ශ්‍රී ලාංකීය විද්‍යාඥයින්ගේ ගෝලීය සංසදය : ජාලකරණයෙන් සහ දැනුම බෙදා ගැනීමෙන් ශ්‍රී ලංකාව බලාත්මක කිරීම” පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයක් විදෙස්ගත ශ්‍රී ලාංකික විද්‍යාඥයින්, දේශීය හා විදේශීය විද්‍යාඥයින්, ප්‍රතිපත්ති සකස්කරන්නන්, සහ රාජ්‍ය හා පුද්ගලික අංශවල අදාළ ක්ෂේත්‍රවල නියැලෙන්නන්, යනාදීන්ගේ දැනුම අප රටේ පශ්චාත් ගැටුම් ආර්ථිකය සහ සමාජ සංවර්ධනය සඳහා යොදා ගැනීම පිණිස පුද්ගලයින් 420ක පමණ සංඛ්‍යාවක සහභාගිත්වයෙන් 2011 දෙසැම්බර් 13 – 15 දක්වා පැවැත්විණි.

ජාල ගොඩනැගීම, තාක්ෂණය පදනම් කොට ගත් පර්යේෂණ සහ කර්මාන්තවල දියුණුව සඳහා දැනුම බෙදා ගැනීම, සහ රටේ ආර්ථිකය සංවර්ධනය කිරීමට පහසුකම් සැපයීම පිණිස මෙම ව්‍යායාමය අඛණ්ඩව සිදු කර ගෙන යයි. එකඟ වූ කටයුතු පිළිබඳ අඛණ්ඩ අධීක්ෂණයක් සිදු කිරීමට සහ සංසදයේ දී සාකච්ඡාවට ලක් වූ

ප්‍රධාන ව්‍යාපෘති යථාර්ථයක් බවට පත්වේදැයි නිරීක්ෂණය කිරීමට ජගත් සංසද කුටියක් ජාතික විද්‍යා පදනමෙහි ස්ථාපිත කරන ලදී.

## විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආසියාතික ජාලය

STEPANහි වර්තමාන සභාපතිත්වය දරණ ජාතික විද්‍යා පදනම, ආසියා ශාන්තිකර කලාපයේ රටවල් දහයක සහභාගිත්වය ඇතිව ජාත්‍යන්තර වැඩමුළුවක් 2011 නොවැම්බර් මාසයේ දී සංවිධානය කළාය. STEPAN සමාජික රටවල් නියෝජනය කරමින් සමුළුවට සහභාගිවූවන්ට පුද්ගලික සහ රාජ්‍ය අංශවල සහභාගිත්වයෙන් ජාතික නවෝත්පාදන පද්ධතිය දියුණු කළ හැක්කේ කෙසේ ද යන්න සමාලෝචනයකට ලක් කිරීම මගින් ජාතික නවෝත්පාදන පද්ධතිය සහ එමගින් සිදු කරනු ලබන කාර්යභාරය පිළිබඳ දැනුමක් සැපයීමට, සහ නවෝත්පාදන පද්ධති අධ්‍යයන, දත්ත විශ්ලේෂණය, සහ අර්ථ නිරූපණය යනාදියෙහි යොදා ගැනෙන විවිධ ක්‍රමවේද පිළිබඳ සාකච්ඡා කිරීම යන අරමුණු සහිතව මෙම වැඩමුළුව සංවිධානය කරන ලදී. ජාතික නවෝත්පාදන පද්ධතිය වැඩි දියුණු කිරීමේ මෙම ප්‍රයත්නය අඛණ්ඩව සිදු කරගෙන යාමට නියමිතය.

## ප්‍රතිපත්ති සකස් කරන්නන් සහ ශාස්ත්‍රඥයින් සඳහා සංඛ්‍යා ලේඛන

විද්‍යාත්මක විෂය පිළිබඳ දත්ත එකතු කිරීම, අර්ථ නිරූපණය, සහ විශ්ලේෂණය සඳහා මධ්‍යම නිෂ්කාශන මධ්‍යස්ථානයක් සම්පාදනය කිරීමට, සහ මෙම අවශ්‍ය කෙරෙන විෂයන් පිළිබඳ ඉතා වැදගත් තොරතුරු අදාළ ක්ෂේත්‍රයෙහි නියැළෙන්නන්ට සැපයීමට, සහ රටේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා විද්‍යාව, තාක්ෂණය, සහ නවෝත්පාදනවලට අදාළ කරුණු පිළිබඳව සමාජය දැනුම්වත් කිරීමට තිබෙන්නාවූ නීතිකාරක පැවරුම අභියෝගාත්මක ඉලක්කයක් වූ නමුදු, වසර තුළ අවශ්‍ය ප්‍රමාණයට කාර්යමණ්ඩලය නොසිටීම මගින් ඇති වූ බාධක නොසලකා ජයග්‍රහණය ලබා ගැනීම සඳහා සිදු කළා වූ ප්‍රබල ප්‍රයත්නය අගය කළ යුතුය.

අදාළ ක්ෂේත්‍රවල නියැළෙන්නන් හට යාවත්කාලීන කරන ලද තොරතුරු ලබා දීමට, විශේෂයෙන් "ජාතික පර්යේෂණ සහ සංවර්ධන සමීක්ෂණය 2010" ට සම්බන්ධ තොරතුරු ලබා දීමට, විද්‍යාව සහ තාක්ෂණය හා සම්බන්ධ විවිධ දත්තපාදක පවත්වාගෙන යෑම සිදු කරන ලදී.

## තොරතුරු අවශ්‍යතාවය සපුරාලීම

ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ තොරතුරු ජාලයෙහි (SLSTINET) කේන්ද්‍ර ලක්ෂ්‍යය ලෙස ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය අඛණ්ඩව ක්‍රියාත්මක විය.

නව තාක්ෂණික සංවර්ධනයන් පිළිබඳ සම මට්ටමක තබා ගනිමින් භාවිත කරන්නන්ගේ වෙනස්වන අවශ්‍යතා සපුරාලීම සඳහා වසර තුළ දී නොයෙකුත් ක්‍රමෝපාය හඳුන්වා දී ඒවාට අනුහුරුවීමට ක්‍රියා කරන ලදී. අපි නව වැඩසටහන් සහ සහයෝගිතා හවුල්කරුවන් එක් කිරීම අඛණ්ඩව සිදු කළෙමු. පහත සඳහන් දෑ ඇතුළත්ව, රට පුරා "තොරතුරු කළමනාකරණය" පිළිබඳ සාමූහික විශේෂඥතාවය නවතම ව්‍යාපෘති මගින් ඉටු කරගන්නා ලදී.

- අප රටේ සිටින සියලුම විද්‍යාත්මක පාර්ශවකරුවන් සමග ඉලෙක්ට්‍රොනිකව මාර්ගගත සම්බන්ධතාවයක් ගොඩනැගීමේ අදහස ඇතිව විද්‍යාව හා තාක්ෂණය ආශ්‍රිත කරුණු අඩංගු කිරීම මගින් ශ්‍රී ලංකා විද්‍යා දර්ශකය (SLSI) දත්තපාදකය පූර්ණ පාඨ සංඛ්‍යාංක පුස්තකාලයක් බවට තත්වයෙන් උසස් කිරීම ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන නියෝජිතායතනය (ICTA) මගින් සංවිධානය කරන ලද 'ඉ-ස්වභිමානී - 2011" සම්මාන ප්‍රදානෝත්සවයේ දී SLSI දත්තපාදකය විශේෂ කුසලතා සම්මානයක් දිනා ගත්තාය.

  අදාළ ආයතන ඒ අයුරින් පවත්වා ගෙන යනු ලබන තනි ආයතනික කෝෂ්ඨාගාර (IR) ඉලෙක්ට්‍රොනිකමය ලෙස අන්තර්ගත කිරීමේ අදහස ඇතිව රටේ එක් එක් විද්‍යා හා තාක්ෂණික ආයතනවල ස්ථාපිත කර ඇති දේශීය විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ ආශ්‍රිත කරුණු සංඛ්‍යාංකකරණය සඳහා උපකාර කිරීම පිණිස වූ පස් අවුරුදු ජාතික සංඛ්‍යාංකකරණ ව්‍යාපෘතිය. එකවිට සමීක්ෂණ පහසුකම් සහිත ජාතික ජාලයක් සකස් කිරීමට සියලුම තනි කෝෂ්ඨාගාර මාර්ගගතව එකිනෙකට සම්බන්ධ කිරීමට නියමිතය.

- පසුගිය වසර 25 තුළ දී ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය මගින් එහි සැසිවල දී ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍ර (සාර සංග්‍රහ සමග) වාර්තා කිරීම.

- එක් සෙවුමක දී තනි අඩවියක් හෝ සියලුම අඩවි සෙවුම් කිරීමට පහසුකම් සපයමින් වෙනත් ඉ-කෝෂ්ඨාගාර සහ අනෙකුත් මාර්ගගතව ප්‍රකාශයට පත් කරන ලද වාරසඟරා බොහාමයක් එකිනෙක ඔස්සේ සෙවුම් කිරීමට, එක විට සෙවුම් කිරීමේ පහසුකම, ජාතික විද්‍යා පදනම මගින් දියත් කරන ලද ජාතික ඉ-කෝෂ්ඨාගාරයෙහි අන්තර්ගත කරන ලදී.

## ඵලදායක ව්‍යාපෘති කළමනාකරණය

ජාතික විද්‍යා පදනම මගින් මූල්‍යාධාර සපයන ලද ව්‍යාපෘතිවල කළමනාකරණ කටයුතු සමස්තයක් ලෙස දියුණු කිරීමේ අවශ්‍යතාවය හඳුනාගන්නා ලදී. ජාතික විද්‍යා පදනමෙහි ක්‍රියාකාරකම් ඒකීකරණය කොට මාර්ගගත පරිගණක මෘදුකාංග වැඩසටහනක් සකස් කිරීමට කටයුතු කර තිබෙන අතර, එහි සාර්ථක නිමාව සමග කළමනාකරණය ඇගයීමේ පරාමිතික වඩා හොඳින් ස්ථාපිත කිරීමට හැකි වන, විවිධ ව්‍යාපෘතිවල කළමනාකරණ ආකෘති පිළිබඳ තොරතුරු ගබඩා කිරීම් සහ නැවත ලබා ගැනීමේ සැලසුම් සහගත ප්‍රයත්නයක් දැරීමට ජාතික විද්‍යා පදනමට හැකිවනු ඇත.

## කළමනාකරණ පද්ධතියෙහි ගුණාත්මක භාවය

ජාතික විද්‍යා පදනම මගින් සපයනු ලබන සේවාවලට ගුණාත්මක භාවයක් සැපයීම සහතික කිරීම සඳහා ගුණත්ව කළමනාකරණ පද්ධතිය (QMS) නැවත දියත් කිරීමේ ප්‍රයත්නයක් දරණ ලදී. එදිනෙදා කටයුතු ඔස්සේ වඩා යහපත් ගුණාත්මක සේවාවක් සම්පාදනය කිරීමට එකිනෙකට සම්බන්ධ කළ යුතු සැලසුම් සහ ක්‍රමෝපය සඳහා මග පෙන්වන, ව්‍යුහයක්, සන්දර්භයක් සහ එකී රාමුව තුළ කටයුතු කරන්නන් සඳහා සවිස්තරාත්මක නිර්ණායක සඳහා QMS මගින් පහසුකම් සලසනු ලබන හෙයින් මෙම ව්‍යායාමය අපේක්ෂිත සම්පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතුය.

## කාර්යසාධන කළමනාකරණ පද්ධතිය

ජාතික විද්‍යා පදනමෙහි කාර්යසාධන කළමනාකරණ පද්ධතිය නැවත අධීක්ෂණයට සහ සංශෝධනයට ලක් කිරීම සිදු කෙරුණි. ඉලක්කයෙහි සහ කැපවීමෙහි පැහැදිලි බව සමග ක්‍රමෝපාය මගින් දිවෙන අරමුණු සම්බන්ධ කිරීමේ පද්ධතියක් ස්ථාපිත කොට තිබෙන අතර, එය ක්‍රියාවට නැංවීම සිදු කෙරෙමින් පවතී. ජාතික විද්‍යා පදනමෙහි ව්‍යාපාරික ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම සඳහා හැකියාව ලබා දෙන්නා වූ තිරසර ආයතනික සංස්කෘතියක් කරා සේවක කාර්යසාධනය ගෙන යැම අලුතින් ස්ථාපිත කරනු ලැබූ කාර්යසාධන කළමනාකරණ පද්ධතියෙන් අපේක්ෂා කෙරේ. ආයතනයෙහි සාර්ථකත්වය සහතික කරනු ලබන්නේ, සේවක කාර්යසාධනය මගින් වන බැවින් එය පහතට ඇද දැමීමට ඉඩ නොතබා සේවක කාර්යසාධන සංවර්ධනය ඵලදායක ලෙස ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

අවසාන වශයෙන්, ප්‍රධාන විධායක නිලධාරිනිය වශයෙන් මාගේ භූමිකාව ක්‍රියාත්මක කිරිමෙහි ලා මවෙත තබන ලද විශ්වාසය පිළිබඳව කළමනාකරණ මණ්ඩලයට මම විශේෂයෙන් ස්තූතිවන්ත වෙමි. සැලකිය යුතු ප්‍රමාණයක අපහසුතා මධ්‍යයේ වුව ද, ගෞරවාන්විත සේවයක නිරත වන විශිෂ්ට විද්‍යාඥයින් සහ තාක්ෂණඥයින් සමාජිකයින් ලෙස කටයුතු කරන, උපදේශක මණ්ඩල, පර්යේෂණ මඩුලු, සහ තාක්ෂණික මඩුලු, සහ වෙනත් බොහෝ උපදේශක ව්‍යුහවලට ද ස්තූතිය පළ කිරීමට මම කැමැත්තෙමි. තරඟකාරී පර්යේෂණ සහ මහජනතාවගේ සුබසාධනය සඳහා ජාතිය ශීඝ්‍ර දියුණුවක් කරා මෙහෙයවමින් විද්‍යාව සහ තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ගාමක බලවේගය බවට පත්වීම යන දැක්ම මගින් පිබිදුනු ජාතික විද්‍යා පදනමෙහි සියලුම මට්ටම්වල කාර්යමණ්ඩල සමාජිකයින් වෙහෙස වී කටයුතු කිරීම සහ කැපවීම අපගේ ශක්තිය වූ අතර වසර තුළ අප ලබා ගත් ජයග්‍රහණවලට හේතු වූ කණ්ඩායම් වැඩ සහ කාර්යසාධනය තවදුරටත් ශක්තිමත් කිරීමට හැකි වේවා යැයි ප්‍රාර්ථනා කරමින් ඔවුන් සියලු දෙනාටම මාගේ ස්තූතිය පිරිනමමි. ජාතික විද්‍යා පදනම විද්‍යාත්මක පර්යේෂණ සංවර්ධනය කිරීම සඳහා සැම විටම ක්‍රියාකාරීව තම දායකත්වය අඛණ්ඩව ලබා දීම සිදු කරනු ලබන අතර අපගේ මාතෘභූමිය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීම ස්ථාපිත කිරීම පිණිස ඒවා උපයෝගී ආකාරයට ඵලදායි ලෙස මෙහෙය වනු ඇත.

අනුෂා අමරසිංහ
අධ්‍යක්ෂිකා

# පටුන


- දැක්ම, මෙහෙවර, අරමුණු සහ ක්‍රියාකාරකම් 1
- කළමනාකරණ මණ්ඩලය 3
- ආයතනික ව්‍යුහය 4
- විද්‍යා සහ තාක්ෂණ පර්යේෂණ විශේෂ සිදුවීම් 5

**විද්‍යාත්මක අංශ**

1. පර්යේෂණ අංශය 11
2. තාක්ෂණ අංශය 17
3. ජාත්‍යන්තර සබඳතා අංශය 27
4. විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශය 31
5. විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය 39
6. ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය 44

**සහයෝගිතා අංශ/ඒකක**

7. පරිපාලන අංශය 48
8. මූල්‍ය අංශය 49
9. මුද්‍රණ අංශය 49
10. තොරතුරු තාක්ෂණ අංශය 49
11. අභ්‍යන්තර විගණන අංශය 50

**මූල්‍ය ප්‍රකාශ**

12. කාර්යසාධනය පිළිබඳ ගිණුම් නිලධාරිනියගේ නිරීක්ෂණ 50
13. 2011 දෙසැම්බර් 31න් අවසන් වන වසර සඳහා ආදායම් සහ වියදම් ගිණුම 52
14. 2011 දෙසැම්බර් 31 දක්වා ශේෂ පත්‍රය 53
15. මුදල් ප්‍රවාහ ප්‍රකාශය - 2011 54

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** 63

**විගණකාධිපතිවරයාගේ වාර්තාව පිළිබඳ ජාතික විද්‍යා පදනමේ අදහස්** 70

**ඇමුණුම්**

| | | | | |
|---|---|---|---|---|
| **1** | **අ** | **ඇමුණුම** | 2011 වර්ෂයේ පර්යේෂණ ප්‍රදාන වැඩසටහනෙහි සාරාංශය | 76 |
| **1** | **ආ** | **ඇමුණුම** | 2011 වර්ෂය තුළ ප්‍රදානය කරන ලද පර්යේෂණ ප්‍රදාන | 77 |
| **1** | **ඇ** | **ඇමුණුම** | 2011 වර්ෂය තුළ ලබාගත් පශ්චාත් උපාධි පිළිබඳ තොරතුරු | 90 |
| **1** | **ඈ** | **ඇමුණුම** | තුළ 2011 වර්ෂය නිම කරන ලද පර්යේෂණ ප්‍රදාන | 92 |
| **1** | **ඉ** | **ඇමුණුම** | තාක්ෂණය යටතේ ඇති ප්‍රදාන පිළිබඳ තොරතුරු | 98 |
| **1** | **ඊ** | **ඇමුණුම** | 2011 වර්ෂය තුළ ප්‍රදානය කරන ලද තාක්ෂණ ප්‍රදාන | 99 |
| **1** | **උ** | **ඇමුණුම** | විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශයේ ක්‍රියාකාරකම් | 100 |
| **2 වන** | | **ඇමුණුම** | ආයතනික ව්‍යුහය | 104 |
| **3 වන** | | **ඇමුණුම** | ප්‍රධාන කාර්යමණ්ඩලය | 105 |
| **4 වන** | | **ඇමුණුම** | 2011 වර්ෂය තුළ ලබා දුන් කාර්යමණ්ඩල පුහුණුව | 108 |

# දැක්ම, මෙහවර සහ අරමුණු

ජාතික විද්‍යා පදනම තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ පවතින රජය මගින් මූල්‍යාධාර සැපයෙන ආයතනයකි. ජාතික විද්‍යා පදනම පිහිටුවන ලද්දේ, 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධිත පනත යටතේ 1998 වර්ෂයේ දී ය. ශ්‍රී ලංකා ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය (නරේසා) එහි පූර්වජයා විය. වර්ෂ 1968 දී පිහිටුවනු ලැබූ ජාතික විද්‍යා සභාව පසුව නරේසා නමින් හඳුන්වනු ලැබී ය.

## අපගේ දැක්ම වනුයේ,

මහජන සුබසිද්ධිය පිණිස තරඟකාරී ජයග්‍රහණයක් සහ ජාතියේ ශීඝ්‍ර දියුණුවක් කරා මෙහෙයවන විද්‍යාව හා තාක්ෂණයේ ප්‍රමුඛතම බලවේගයක් බවට පත්වීම.

## අපගේ මෙහෙවර

රාජ්‍ය, පෞද්ගලික, ආයතන, කර්මාන්ත සහයෝගිතා ගොඩනැංවීම තුළින් දැනුම් ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම.

මහජනතාවගේ ජීවන මට්ටම වැඩිදියුණු කිරීමට, හැකියාවන් ඉහළ නැංවීම, යටිතල පහසුකම් සංවර්ධනය, තාක්ෂණය ගෙන යාම සහ සියලුම විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල දැනුම උත්පාදනය සහ බෙදා දීම සඳහා පහසුකම් සැපයීම.

හැකියාවන් මත ක්‍රියාත්මක සහ ප්‍රතිඵලාභිමුඛ කාර්යය කිරීමට උපකාරී වන වටපිටාවක් තුළ කුසලතා පිරි ශ්‍රම බලකායක් ඇති කිරීම තුළින් අපගේ අභිමතාර්ථයන් කරා ළඟා වීම.

## අරමුණු සහ කාර්යය

- විශ්ව විද්‍යාල, විද්‍යා හා තාක්ෂණ ආයතන සහ විද්‍යාඥයන් විසින් සිදු කරනු ලබන මූලික සහ ව්‍යවහාරික විද්‍යා පර්යේෂණවලට මූලාරම්භය සැපයීම, පහසුකම් ලබා දීම සහ ආධාර ලබා දීම.
  මේ යටතේ,
  - සමාජ විද්‍යා පර්යේෂණ සහ විද්‍යා අධ්‍යාපන වැඩසටහන් ද ඇතුළත්ව විද්‍යාත්මක පර්යේෂණවල විභවය ඉහළ නැංවීම,
  - ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් වැඩි දියුණු කිරීම,
  - ශ්‍රී ලාංකිකයන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම,
  - විද්‍යා හා තාක්ෂණ අංශවල පර්යේෂකයින් පුහුණු කිරීම

  යනාදිය පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ.

- ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල විද්‍යාඥයින් අතර තොරතුරු හුවමාරු කිරීම සඳහා උපකාර කිරීම.

- පිළිගත් විද්‍යා හා තාක්ෂණ ආයතනවල විද්‍යාත්මක අධ්‍යාපන සහ විද්‍යාත්මක කටයුතු සඳහා ශිෂ්‍යත්ව සහ අධි ශිෂ්‍යත්ව පිරිනැමීම.

- විද්‍යාත්මක සහ තාක්ෂණික කටයුතුවල නියුතුවූවන්ගේ වලංගු නාම ලේඛනයක් පවත්වාගෙන යාම සහ වර්තමානයේ තිබෙන ප්‍රමාණය සහ ප්‍රක්ෂිප්ත අවශ්‍යතා සඳහා වන, ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක හා තාක්ෂණික සම්පත් පිළිබඳව දත්ත එකතු කිරීම, විශ්ලේෂණය කිරීම සහ විවරණය සඳහා මධ්‍යම නිෂ්කාශන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම සහ විද්‍යා හා තාක්ෂණ මෙන්ම අනෙකුත් ක්ෂේත්‍රවල ප්‍රතිපත්ති සැකසීමෙහි ලා අවශ්‍ය කෙරෙන තොරතුරු සම්පාදනය කෙරෙන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.

- විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන් සඳහා ප්‍රතිපාදන සම්පාදනය කරමින් මහජනතාව අතර විද්‍යාව ප්‍රචලිත කිරීම පිණිස කටයුතු කිරීම.

- ජාතික විද්‍යා පදනම එහි ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී පහත සඳහන් මූලධර්මවලට අනුගතව කටයුතු කරයි.

***විද්‍යාවෙහි සාර්විකතාව:***
ජාත්‍යන්තර විද්‍යාත්මක කටයුතු මගින් ලබා ගත්තා වූ විද්‍යාත්මක යෝග්‍යතාව හැර භූමිය පිළිබඳව වෙනසක් නොකොට තම විද්‍යාත්මක කටයුතු වැඩි දියුණු කරගැනීම පිණිස තනි පුද්ගලයින් ලෙස අනෙකුත් විද්‍යාඥයින් ඇසුරු කිරීමේ සහ ඔවුන් සමග සන්නිවේදනයේ යෙදීමේ විද්‍යාඥයින් සතු නිදහස පිළිගන්නා අතර ජාතික විද්‍යා පදනම ඊට අනුකූලව කටයුතු කරයි.

***විද්‍යාව පරිශීලනයේ නිදහස:***
විද්‍යාත්මක ක්‍රමය සමග එකඟවන ආකාරයට සහ වගකීමක් සහිතව විද්‍යාව පරිශීලනය කිරීමට විද්‍යාඥයින් සතු අයිතිය පිළිගන්නා අතර ජාතික විද්‍යා පදනම ඊට අනුකූලව කටයුතු කරයි.

## කළමනාකරණ මණ්ඩලය

ජාතික විද්‍යා පදනම, සභාපතිනිය, අධ්‍යක්ෂ, විශ්ව විද්‍යාල ප්‍රතිපාදක කොමිසම, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, සහ මුදල් අමාත්‍යාංශය නියෝජනය කරමින් සමාජිකයින් සිව්දෙනෙකු, සහ තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරිය විසින් පත්කරනු ලබන සමාජිකයින් සිව්දෙනෙකු යන අයගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් මගින් පාලනය කෙරේ. අධ්‍යක්ෂ, ආයතනයෙහි ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කරයි.

**මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු -** සභාපතිනිය
*ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ මහාචාර්ය, වෛද්‍ය පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.*

**ආචාර්ය එස්.ඒ.කේ. අභයවර්ධන -** අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී

**දේශබන්දු මහාචාර්ය ටියුලි ද සිල්වා -** සාමාජික
*විශ්‍රාම ලත් විශේෂ උපදේශක, රසායනික කර්මාන්ත අංශය, UNIDO, ඔස්ට්‍රියාව.*
*රසායන විද්‍යාව පිළිබඳ හිටපු මහාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය*
*ලින්ක් නැචුරල් ප්‍රඩක්ට්ස් හි උපදේශක*

**මහාචාර්ය උමා කුමාරස්වාමි -** සාමාජිකා
*උද්භිද විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය.*
*විද්‍යාව පිළිබඳ ජාතික ඇකඩමිය, ලයිෆ් ලෝන්ග් ලර්නින්ග් (L3) ව්‍යාපෘතියෙහි උපදේශිකා (විවෘත විශ්ව විද්‍යාලය)*

**ඉංජිනේරු (මහාචාර්ය) ඒ.කේ.ඩබ්. ජයවර්ධන -** සාමාජික (2010.09.14 දින සිට)
*සභාපති, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය*

***මහාචාර්ය එච්. අබේගුණවර්ධන -*** සාමාජික (2011.06.08 දින සිට)
*මහාචාර්ය, පශු වෛද්‍ය සහ සත්ව විද්‍යා පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය*

***ආචාර්ය උපාලි සේදර -*** සාමාජික (2010.09.01 දින සිට 2011.01.04 දක්වා)
*අධ්‍යක්ෂ ජෙනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය*

***මහාචාර්ය රොහාන් රාජපක්ෂ -*** සාමාජික (2011.04.08 දක්වා)
*ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කෘෂිකාර්මික ජීවවිද්‍යා දෙපාර්තමේන්තුව, රුහුණු විශ්ව විද්‍යාලය*
*සාමාජික, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම (UGC)*
*විධායක අධ්‍යක්ෂ, කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (CARP)*

***ඉංජිනේරු ආනන්ද හෙට්ටිආරච්චි -*** සාමාජික
*කළමනාකරණ උපදේශක, පී ඇන්ඩ් ඊ කන්සල්ටන්ට්ස්*

***ජගත් ඩී. ඩයස් මයා -*** සාමාජික (2010.07.07 සිට 2011.01.14 දක්වා)
*අධ්‍යක්ෂ (පාර්ලිමේන්තු කටයුතු), මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශය*

***මහාචාර්ය ජයන්ත විජේරත්න -*** සාමාජික (2010.10.11 සිට)
*සත්ව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කැලණිය විශ්ව විද්‍යාලය*

***එස්.ඩබ්.සී. ජයමිණි මිය -*** සාමාජිකා (2011.04.08 සිට)
*සහකාර අධ්‍යක්ෂ, මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය*

***සී.එම්.ආර්. ඇන්තනි මයා -*** සාමාජික (2011.06.10 සිට)
*අධ්‍යක්ෂ (විද්‍යාව, සෞඛ්‍ය, සහ කායික අධ්‍යාපනය), විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය*

## ආයතනික ව්‍යුහය

විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතෙහි සඳහන් කොන්දේසිවලට අනුව සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත වන කළමනාකරණ මණ්ඩලයක් මගින් ජාතික විද්‍යා පදනම පාලනය කෙරේ. ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂ ද කළමනාකරණ මණ්ඩලයේ සමාජිකයෙක් ලෙස ක්‍රියා කරයි.

මූල්‍ය සහ පරිපාලන, මුද්‍රණ, තොරතුරු තාක්ෂණය, සහ අභ්‍යන්තර විගණක සේවා යන අංශවල උපකාරය ඇතිව ජාතික විද්‍යා පදනමෙහි ඇති විද්‍යාත්මක අංශ හය තම අරමුණු කරා ළඟා වීමට කළමනාකරණ මණ්ඩලයට සහාය වේ. විද්‍යාත්මක අංශ, එනම්, පර්යේෂණ, තාක්ෂණ, ජාත්‍යන්තර සබඳතා, විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ, සහ විද්‍යාව ප්‍රචලිත කිරීම යන අංශ මගින් විද්‍යාත්මක කටයුතු ක්‍රියාත්මක කරනු ලබන අතර ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය දිවයින පුරා විද්‍යාත්මක තොරතුරු ව්‍යාප්ත කිරීම මෙන්ම ජාලගත කිරීම සිදු කරයි. කළමනාකරණ මණ්ඩලයට / සභාපතිනියට වාර්තා කෙරෙන ස්වාධීන අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ගැනීම මගින් යහපාලනයක් කරා ආයතනය මෙහෙයවන අභ්‍යන්තර පාලනය පවත්වා ගැනීමේ අවශ්‍යතාවය සපුරාගෙන ඇත.

## විද්‍යාත්මක කටයුතු සංවිධානය

එහි මෙහෙවරට අනුකූලව, ජාතික විද්‍යා පදනම පුළුල් ලෙස විද්‍යාව හා තාක්ෂණයට සේවා සැපයීම සිදු කරන විවිධ විද්‍යාත්මක වැඩසටහන් සඳහා මූල්‍ය සම්පාදනය කරයි.

නිර්දේශ කරන ලද පර්යේෂණ/තාක්ෂණ ව්‍යාපෘති විචාරය කිරීම, සුසංගත කිරීම සහ ප්‍රමුඛතාවය අනුව පෙළගැස්වීම මගින් සහ අදාළ අංශවල නියුතු පර්යේෂකයින් අතර වඩා ක්‍රමානුකූල සන්නිවේදන කටයුතු වැඩි කිරීම, ප්‍රවර්ධනය කිරීම මගින් විද්‍යාත්මක අංශවල කටයුතු සිදු කරගෙන යාම සඳහා **පර්යේෂණ/තාක්ෂණ උපදේශක මණ්ඩල** විද්‍යාත්මක දර්ශනයක් සම්පාදනය කිරීම සිදු කරයි. උපදේශක මණ්ඩල, සමායෝජිත උපදේශකත්වය සැපයීම මෙන්ම, පර්යේෂණ ප්‍රජාවෙන් ලැබෙන ප්‍රතිචාර සහ ජාතික විද්‍යා පදනමට සහ පර්යේෂණ ප්‍රජාවට පොදු වැදගත්කමක් සහිත කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම යන කාරණා ද්විත්වයට ඉඩ හසර සලසයි.

විවිධ විද්‍යාත්මක පර්යේෂණ ක්ෂේත්‍රවල කටයුතු ක්‍රියාවෙහි යෙදවීමට පිහිටුවනු ලැබ ඇති **පර්යේෂණ මඩුලු** අදාළ විෂයයන්ගේ පර්යේෂණ ප්‍රදාන ක්‍රියාත්මක කිරීමට භාර දී ඇති ජාතික විද්‍යා පදනමෙහි ව්‍යාපෘති සම්බන්ධීකාරකයින්ට මඟ පෙන්වීම මගින් කළමනාකරණ මණ්ඩලයට සහයෝගය දක්වයි.

**ජාතික විද්‍යා පදනමෙහි ජාතික කමිටු,** ඒවායේ ඉලක්ක සහ අරමුණු වෙත ළඟාවීමෙන් සහ විශේෂිත ක්ෂේත්‍රවල විද්‍යාත්මක මගපෙන්වීම සැපයීම මගින් කළමනාකරණ මණ්ඩලයට සහායවීම, සහ විශේෂිත කොන්දේසි මත පදනම් වූ ඒවායේ වැඩ සැලැස්ම සහ එහි ප්‍රගතියෙහි/ප්‍රතිඵලවල වාර්තාවක් නිශ්චිත කාල වකවානුවලට අනුව කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරේ. අවදානම් සාධක මගහැරවීම පිණිස එවැනි දෑ හඳුනාගැනීම සහ තම ඉලක්ක සම්පූර්ණ කිරීම තහවුරු කිරීමෙහි ලා බලපාන ප්‍රධාන තීරණකාරක හඳුනාගැනීම මෙම කමිටුවලින් අපේක්ෂා කෙරේ. අවශ්‍ය කරන සහයෝගීතාවය ලබාගැනීමට අදාළ නියෝජිතායතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම කමිටුවල ඉලක්ක සම්පූර්ණ කිරීමේ දී පූර්ව අවශ්‍යතාවයක් වනු ඇත.

සංස්කරණ මණ්ඩලය, ජාතික විද්‍යා පදනමෙහි වාරසඟරාව, සමාජ විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකා වාරසඟරාව සහ ජාතික විද්‍යා පදනම මගින් ප්‍රකාශනය කෙරෙන අනෙකුත් විද්‍යාත්මක ප්‍රකාශන අඛණ්ඩව ප්‍රකාශනය කිරීම සහතික කරයි. සංස්කරණ මණ්ඩලය, සංස්කාරකවරුන්ට, කර්තෘවරුන්ට, විචාරකයින්ට සහ ජාතික විද්‍යා පදනමේ සංස්කරණ කාර්ය මණ්ඩලයට අවශ්‍ය මඟ පෙන්වීම සපයයි.

## විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ විශේෂ සිදුවීම්

අප හට වසර සඳහා වෙන් කරන ලද මුදල ප්‍රමාණවත් නොවුන ද දැනුමෙහි නිදහස සහ නොබැඳි අන්වේෂණය දිරිගන්වන විමර්ශනයෙහි යෙදෙන්නා වූ සංස්කෘතියක් නිර්මාණය කරමින් විද්‍යාව හා තාක්ෂණයට සේවයක් ඉටු කොට ඇති විද්‍යාත්මක පර්යේෂණවලට සහයෝගය දැක්වීම සඳහා ලාක්ෂණික මොඩලයක් සකසනු ලැබ ඇත.

මූලික හා ව්‍යවහාරික විද්‍යා පර්යේෂණවලට මූලාරම්භය සැපයීම, පහසුකම් සැලසීම සහ සහයෝගය දැක්වීම ජාතික විද්‍යා පදනමෙහි මූලික අරමුණ වන අතර පර්යේෂණ දියත් කරන ලද අදාළ ආයතනය සමග සහයෝගිත්වයෙන් කටයුතු කිරීම මගින් මහජනතාවගේ සුබ සිද්ධිය තකා සමහර පර්යේෂණ ප්‍රතිඵල/නිෂ්පාදනවල ප්‍රතිලාභ යොදාගැනීමට සාමූහික උත්සාහයක් ගෙන තිබේ.

වසර තුළ හඳුනාගත් වැදගත් ජයග්‍රහණ සමහරක් පහත දැක්වේ.

**ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ගේ ජගත් සංසදය : ජාලකරණය සහ දැනුම බෙදාගැනීම ඔස්සේ ශ්‍රී ලංකාව බලාත්මක කිරීම.**

රටේ පශ්චාත් ගැටුම් ආර්ථිකය සහ සමාජ සංවර්ධනය සඳහා රටින් බැහැරව වෙසෙන විද්‍යාඥයින්ගේ දැනුම යොදා ගැනීමට, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශයේ විෂය පථය යටතේ යුනෙස්කෝ ආයතනයෙහි සහයෝගය ඇතිව ජාතික විද්‍යා පදනම ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ගේ ජගත් සංසදය සංවිධානය කළාය. ප්‍රබල සම්බන්ධතා ගොඩනැගීමට සහ ජාතියේ ඉදිරි ගමනට, තාක්ෂණය පදනම් කරගත් පර්යේෂණ සහ කර්මාන්තවල වැඩි දියුණුව සඳහා දැනුම බෙදාගැනීම පහසු කිරීම පිණිස ජාල ගොඩනැගීමට, රටින් බැහැරව සිටින සහ දේශීය විද්‍යාඥයින් එකට මුණගැස්සවීම මෙම සංසදයේ ප්‍රධාන ඉලක්ක අතරින් එකක් විය.

වර්තමානයේ ශ්‍රී ලංකාවෙන් ආනයනය කෙරෙන නිෂ්පාදන අතරින් උසස් තාක්ෂණය පදනම් කොට ගෙන ඇත්තේ නිෂ්පාදන 1.5%ක් පමණකි. පශ්චාත් ගැටුම් සංවර්ධන සන්දර්භයක් තුළ ශ්‍රී ලංකීය විශේෂඥ ඥානය සහ නවෝත්පාදන මත පදනම්ව නව ප්‍රවණතා සමග එකට ගමන් කිරීම හා නව වෙළෙඳපොළ අවස්ථා නිර්මාණය කිරීම එළැඹුණු පැයේ අවශ්‍යතාවය වේ. එනිසා, මෙම සංසදය ආර්ථික වර්ධනය පිණිස වූ අඛණ්ඩ සහයෝගීතාවය සඳහා වන ආයෝජනයක් විය.




වැඩමුළුවෙන් පසු, ශ්‍රී ලාංකික විද්‍යාඥයින් විසින් ගෝලීය සංසදයේ දී නිර්දේශ කරන ලද කටයුතුවලට ආධාර කිරීම සඳහා ජගත් සංසද කුටිය පිහිටුවන ලදී.

## විද්‍යාත්මක පර්යේෂණ වේදිකාව පුළුල් කිරීම



විද්‍යාත්මක පර්යේෂණ වේදිකාව පුළුල් කිරීමට දැඩි ප්‍රයත්නයක් දරමින්, දිගු කලක් විශේෂඥයින් ස්වල්ප දෙනෙකුට පමණක් සීමා වීමට ඉඩ නොතබා, මූලික සායනික හා ව්‍යවහාරික පර්යේෂණවල ක්‍රම හැකියාවන් විදහා දැක්වීමට විද්‍යාත්මක ප්‍රජාව දිරිමත් කරමින්, නව විද්‍යාත්මක සොයාගැනීමේ අපේක්ෂාවෙන් ජාතික විද්‍යා පදනම වැඩසටහන් මාලාවක් දියත් කළාය. තරඟකාරී පර්යේෂණ ප්‍රදාන, පර්යේෂණ අධිශිෂ්‍යත්ව සහ ශිෂ්‍යත්ව, පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂණ විද්‍යාඥයෝ, පර්යේෂණ

උපකරණ ප්‍රදාන, පර්යේෂණ උපකරණ සඳහා අමතර කොටස් ප්‍රදාන සහ පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා උපකාරක වැඩසටහන් යනාදිය ඇතුළත්ව විවිධ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන් සඳහා මූල්‍ය සම්පාදනය කිරීමේ ප්‍රයත්නයට අමතරව අරමුණු සාක්ෂාත් කරගැනීමේ අභිප්‍රාය සහිතව ව්‍යාපෘති යෝජනාවලි ලේඛනය පිළිබඳව පුහුණු වැඩමුළු පවා සංවිධානය කෙරුණි.

## තාක්ෂණ විද්‍යාත්මක නවෝත්පාදන උත්ප්‍රේරණය

තාක්ෂණික විද්‍යාත්මක නවෝත්පාදන සවිමත් කිරීම ඉලක්ක කරගෙන තාක්ෂණ ප්‍රදාන වැඩසටහන් දෙකක් මගින් ජාතික විද්‍යා පදනම තරඟකාරී ක්‍රමෝපායක් ලෙස තාක්ෂණ නවෝත්පාදනයෙහි යෙදෙන ව්‍යාපාරවලට අත්‍යවශ්‍ය උපකාර සහ සම්පත් ලබා දුන් අතර තාක්ෂණය පිළිබඳ උනන්දුවක් දක්වන මහජනතාව අතරින් ඕනෑම කෙනෙකුට තාක්ෂණ නවෝත්පාදනයට වැයවන මුදල පියවාගැනීමට ජාතික විද්‍යා පදනම උපකාර කළාය. එකී තාක්ෂණ ප්‍රදාන වැඩසටහන් දෙක නම්,

- තාක්ෂණ සංවර්ධනය සඳහා උපකාර කිරීම (Tech – D)
- නව තාක්ෂණය පදනම් කොටගත් ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා උපකාර කිරීම (Start Ups)

## බුද්ධිමය දේපළ අයිතිය සුරකීම

පහත සඳහන් දෑ ඔස්සේ බුද්ධිමය දේපළෙහි නිමැවුම්කරුවන්ගේ සහ නිර්මාණකරුවන්ගේ අයිතිය ලබා ගැනීම, ආරක්ෂා කිරීම, සහ කළමනාකරණය කිරීම සඳහා සහයෝගය සපයන ලදී.

- ක්‍රියාවලියට පහසුකම් සැපයීමට මධ්‍යස්ථාන පිහිටුවීම
- ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි සහයෝගය ඇතිව බුද්ධිමය දේපළ විගණන
- විශ්ව විද්‍යාල තුළ බුද්ධිමය දේපළ අධ්‍යාපනය සහ කෙටුම්පත් සැකසීම හා පේටන්ට් අයදුම් පත්‍ර සම්පූර්ණ කිරීම පිළිබඳ තාක්ෂණික උපදෙස් සැපයීම
- මාර්ග ගත PCT පිරවීම සහ පේටන්ට් තොරතුරු සෙවීම හා දළ පිටපත් සැකසීම සඳහා පහසුකම් සැපයීමට පේටන්ට් උපකාරක අංශයක් පිහිටුවීම
- පේටන්ට් දීර්ඝ කිරීම සහ පේටන්ට් කෙටුම්පත් කිරීම සඳහා මූල්‍යාධාර සැපයීම

## ජාතික නැනෝතාක්ෂණ මූලාරම්භය




වේගයෙන් ඉදිරියට යන නැනෝතාක්ෂණය ලෝකයේ සාර්ථක කොටස්කරුවකු බවට පත්වීමේ දැක්ම සහිතව ඉහළ ගුණත්වයක් සහිත නිෂ්පාදන බොහාමයක් ඉතා අඩු පිරිවැයක් සහිතව සහ වැඩි වේගයකින් සෑදීම ප්‍රවර්ධනය කිරීමට "ජාතික නැනෝතාක්ෂණ මූලාරම්භය (NNI)" තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය සමග එක්ව ජාතික විද්‍යා පදනම මගින් දියත් කරන ලදී. නිෂ්පාදනයෙහි ස්වයං මාර්ග පුනර්ජනනය කිරීමට හා වඩාත්ම විචක්ෂණය වීමට සහ අනාගතය සුරක්ෂිත කිරීමට හැකියාව ඇති මෙම විශිෂ්ට තාක්ෂණයේ ප්‍රතිලාභ නෙලා ගැනීමට රට සූදානම් කරවීම සඳහා ජාතික විද්‍යා පදනම උත්සාහයක් ගනිමින් සිටී.

### නැනෝතාක්ෂණයේ යාමන රාමුව

ජාත්‍යන්තර පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය (IDRC) සමග සහයෝගය ඇතිව ශ්‍රී ලංකාවේ නැනෝතාක්ෂණයට අදාළ වන කටයුතු සඳහා යාමන රාමුවක් සකස් කිරීම ආරම්භ කරන ලද අතර ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ රැස්වීම, ඉන්දියාවේ බලශක්ති සහ සම්පත් ආයතනය (TERI), නැනෝ විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ ප්‍රෙස්ටන් ආයතනය/පාකිස්ථානය, IDRC සහ ශ්‍රී ලංකා හවුල්කාර ආයතන යනාදියෙහි සහභාගිත්වයෙන් 2011 මාර්තු 8 – 9 දිනවල ජාතික විද්‍යා පදනමෙහි පවත්වන ලදී. විශේෂිත බෙදාහැරීම් සහිත කාර්ය පැකේජ යෝජනාවලියට අනුව කටයුතු සිදු කෙරෙමින් පවතී.

**ජාතික නැනෝතාක්ෂණ ප්‍රතිපත්තිය**

ජාතික විද්‍යා පදනම, ප්‍රතිපත්ති සකස් කිරීම, යාමන රාමුව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, ඇතුළු මූලික වැඩකටයුතු, වැඩමුළු සහ පුහුණු සම්මන්ත්‍රණ යනාදිය මගින් ක්‍රියාත්මක කරමින් පවතින අතරම අපේක්ෂිත කටයුතු සිදු කිරීමේ ප්‍රයත්නයක නිරතවෙමින් පවතී.

**ශ්‍රී ලංකා නැනෝතාක්ෂණ ආයතනය (SLINTEC)**

රජය වෙනුවෙන් ජාතික විද්‍යා පදනමට 50%ක කොටස් අයිතියක් ද ඉතිරි 50% පුද්ගලික අංශය සතුව ද පවතින වර්ෂ 2009 දී පිහිටුවන ලද ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය වසර තුළ නිසි ලෙස ක්‍රියාත්මක විය. 2011 වසර තුළ සොයා ගත් නවනිෂ්පාදන සහ ක්‍රියාවලි සඳහා එක්සත් ජනපද පේටන්ට් පහක් සඳහා අයදුම් කරනු ලැබ ඇත.

**විද්‍යාත්මක ප්‍රකාශන**

ජාතික විද්‍යා පදනම විසින් මූල්‍යාධාර සපයන ලද පර්යේෂණ කණ්ඩායම් මගින් සිදුකරන ලද පර්යේෂණවල පුළුල් බව සහ ගුණාත්මක බව පෙන්වා දෙනු ලබන විශේෂිත ක්ෂේත්‍රවල කැපී පෙනෙන දියුණු කිරීම් සහ වසර තුළ සකස් කෙරුණු වෙනත් ශාස්ත්‍රීය විද්‍යාත්මක වාර්තා ජාතික විද්‍යා පදනම් වාරසඟරාවෙහි, සමාජ විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකා වාර සඟරාවෙහි සහ විදුරාව විද්‍යා සඟරාවෙහි ප්‍රකාශනය කරන ලදී.

**ජාතික විද්‍යා පදනම් වාර සඟරාව (JNSF)**

සයන්ස් සයිටේෂන් ඉන්ඩෙක්ස් එක්ස්පැන්ඩඩ් හි අන්තර්ගත කරන ලද ශ්‍රී ලංකාවේ එකම වාරසඟරාව JNSF වන අතර එහි, 29 වන කලාපයේ අංක 1 – 4 දක්වා නිකුතු 2011 තුළ ප්‍රකාශනය කරන ලදී.




පහත සඳහන් තොම්සන් රොයිටර් දත්ත පාදකවල මෙම වාරසඟරාව සුචිගත කරනු ලැබ ඇත.

- සයන්ස් සයිටේෂන් ඉන්ඩෙක්ස් එකස්පැන්ඩඩ්: ග්‍රන්ථ නාමාවලිය සහ උපුටාගැනීමේ තොරතුරු වෙත පර්යේෂකයින්ට, පරිශීලකයින්ට, ඇඳුරු මඩුල්ලට සහ ශිෂ්‍යයින්ට වේගවත් ප්‍රවේශයක් සිදු කිරීමට මෙම දත්ත පාදකය ඉඩකඩ සලසයි. මෙමගින්, විෂය ක්ෂේත්‍ර 150ක් ඔස්සේ විද්‍යාත්මක හා තාක්ෂණික වාරසඟරා 6,650ක් ආවරණය කෙරේ.
- වාරසඟරා උපුටාගැනීමේ වාර්තා/විද්‍යා සංස්කරණ
- බයෝසිස් විමසුම
- ජෛව විද්‍යාත්මක සාරාංශ
- රසායන විද්‍යාත්මක සාරාංශ
- ස්කෝපස්

**සමාජ විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකා වාරසඟරාව (SLJSS)**




දේශීය පර්යේෂණ සොයාගැනීම් සඳහා කඩිනම් ප්‍රචාරයක් ලෙස සහ සමාජ විද්‍යාව පිළිබඳ ප්‍රකාශන ප්‍රවර්ධනය කිරීම මෙම ප්‍රකාශය මගින් ඉටු කර ගන්නා ලදී.

සමාජ විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකා වාරසඟරාවෙහි කලාප 31/32, අංක 1 සහ 2 ප්‍රකාශනය කරන ලදී.

## මිනිසා සහ ජෛව ගෝලය (MAB) වැඩසටහන

සොබාදහම සහ මානව සම්බන්ධතා පිළිබඳ අවධානය යොමු කරමින්, MAB වැඩසටහන, දැනුම බෙදාගැනීම, සමෝධානය සඳහා අනුබලය සහ තිරසර ලෙස කළමනාකරණය කරන ලද පරිසර පද්ධති සංරක්ෂණය, සංවර්ධනය සහ විද්‍යාත්මක පර්යේෂණ සඳහා ප්‍රවේශයක් අන්තර්ගත කොට ඇත. එය වර්තමාන කටයුතුවල අනාගත බලපෑම පිළිබඳ පුරෝකථනයක් කරන අතර එමගින් මානව ජනගහනයේ මෙන්ම පරිසරයෙහි ද යහපැවැත්ම සඳහා ස්වභාවික සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට ජනතාව සතු හැකියාව ඉහළ නංවයි.




ජෛවගෝල සංරක්ෂිතයක් ලෙස මහනුවර නාමයෝජනා කිරීමේ ප්‍රයත්නයක් 2011 දී දරණ ලද අතර එකී උත්සාහය ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

## පර්යේෂණ සහ සංවර්ධනයේ දී මානව සම්පත්

පර්යේෂණ අධීක්ෂණය උපාධි අපේක්ෂකයින් හට ඉගැන්වීමෙන් වෙනස් වූ එකිනෙකට ඉතාමත් වෙන්ව පිහිටි නිපුණතා සමූහයකින් සමන්විත වන අතර පර්යේෂණ ශිෂ්‍යයෝ තමන්ට අවශ්‍ය කරන දැනුම තම ආචාර්යවරුන්ගේ සිට සිසුන් වෙත සිදු කෙරෙන බුද්ධි ප්‍රවාහයෙන් පමණක් ලබා ගැනීමට අපේක්ෂා නොකරති. ආචාර්ය උපාධිය සඳහා වන ව්‍යාපෘති එකිනෙකට වෙනස්වන අතර ඒවා පිළිබඳ වෙන්වෙන්ව ක්‍රියා කළ යුතු ය. ඒවා අධීක්ෂණය සඳහා සරල ක්‍රම නොමැත.

අධීක්ෂකයින් තම දැනුම සහ කුසලතා ඉහළ නැංවීමට මූලාරම්භය ගත යුතු යැයි බලාපොරොත්තු වන අතර එලෙස සිදු කෙරෙන මනා අධීක්ෂණවලට ත්‍යාග ලබා දිය යුතු ය.

වර්තමාන සහ අඛණ්ඩව ඉදිරියට ගෙන යන පර්යේෂණවල විශිෂ්ටත්වය සඳහා අතිශය වැදගත්කමකින් යුක්ත වූ පශ්චාත් ආචාර්ය උපාධි විද්‍යාඥයෝ ජාතික විද්‍යා පදනමෙහි 'පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂණ විද්‍යාඥයෝ' වැඩසටහන මගින් සම්මානයට පාත්‍ර කරන ලද්දාහ.

ගතවුණු වසර තුළ පර්යේෂණ අධිශිෂ්‍යත්ව දෙකක්, දර්ශනශූරී (PHD) උපාධි තුනක් සහ දර්ශනපති (MPhil) උපාධි පහක් සම්පූර්ණ කරන ලදී. පශ්චාත් පර්යේෂණ උපාධිවලට මග පාදන විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදු කරන සිසුන් අධීක්ෂණය කිරීමේ යෙදී සිටින විද්‍යාඥයින්/ඉංජිනේරුවන් පිළිගැනීමකට ලක් කෙරෙන සම්මාන වැඩසටහනක් වූ පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා සහයෝගිතා වැඩසටහන (SUSRED) යටතේ පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍රයේ මානව සම්පත් වැඩිදියුණු කිරීමට ජාතික විද්‍යා පදනම විසින් දරණ ලද ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස උපාධිධාරී ශිෂ්‍යයන් හය දෙනෙකු, එක් පශ්චාත් උපාධි ශිෂ්‍යයෙකු සහ තාක්ෂණික සහායකයින් සිව් දෙනෙකු හට ද ජාතික විද්‍යා පදනමෙහි සහයෝගය ලැබුණි.

## විද්‍යාව සරල ලෙස ප්‍රකාශ කිරීම සහ අදාළ ක්ෂේත්‍රවල වූවන් කාර්යයෙහි නියුතු කරවීම

පණිවුඩය යැවීම සඳහා වැදගත් දත්ත සහ අවශ්‍ය ස්ථාන සඳහා ප්‍රතිපත්ති සමග ජාතික විද්‍යා පදනම මූලාධාර සැපයූ පර්යේෂණ සහ ප්‍රතිපත්ති සකස් කරන්නන් සඳහා ලබා ගත හැකි වෙනත් ආශ්‍රිත කරුණු පිළිබඳ සම්බන්ධතාවය දැනුම් දීම ඉලක්ක කරගත් වැදගත් උපකරණයක් ලෙස ජාතික විද්‍යා පදනම් ප්‍රතිපත්ති ලුහුඬුව හැඳින්විය හැකිය.


POLICY BRIEF
Biodiversity Conservation in Sri Lanka

ජාතික විද්‍යා පදනමෙහි මෙකී විෂයයන් පිළිබඳ නිර්දේශ 2009 වර්ෂයේ සිට වාර්ෂිකව සිදු කෙරෙමින් පවතින අතර අද පවතින තත්වය වැඩි දියුණු කිරීම උදෙසා සොයාගත් දෑ සංස්ලේශණය කොට ප්‍රායෝගිකව යොදා නොගන්නේ නම් පර්යේෂණ අත්‍යාවශ්‍යයෙන් ම අසම්පූර්ණ වන හෙයින් අදාළ අමාත්‍යාංශ, ආයතන සහ පුස්තකාලවලට බෙදා හැරීම සිදු කරනු ලැබේ.

## සයිනොටෙක් ඇලර්ට් විද්‍යුත් ප්‍රවෘත්ති පත්‍රිකාව




විද්‍යාව, නවෝත්පාදන සහ තාක්ෂණය මෙන්ම ජීවන වෘත්තිය වැඩිදියුණු කරගැනීම සඳහා අවස්ථා, සෘජුව ම විද්‍යාඥයින්ගේ මේසය මතට යැවෙන බලවත් සහ ප්‍රධාන එක බලාගන්නා මෙවලමක් ලෙස මෙම විද්‍යුත් ප්‍රවෘත්ති පත්‍රිකාව අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙයට, බොහෝ දෙනෙකු වෙත කඩිනමින් සහ පහසුවෙන් ළඟා විය හැකි නිසා, මුල් ප්‍රවෘත්ති නිවේදනය කිරීමටත්, ඉන් නොනැවතී විද්‍යාත්මක ප්‍රජාවට වඩාත් වැදගත්වන මාතෘකා විශ්ලේෂණය කිරීමේ තත්වයට උසස් කිරීමටත් අපේක්ෂා කෙරේ.

## මිහිමඬල වීඩියෝ වැඩසටහන් මාලාව

ඉ - අන්තර්ගතයෙහි සහ නිර්මාණශීලිත්වයෙහි විශිෂ්ටතම ව්‍යවහාරය අගයමින් 2011 දකුණු ආසියා මන්තන් සම්මාන උළෙලේ දී ඉ - විද්‍යා කැටගරිය යටතේ, ජාතික විද්‍යා පදනම විසින් නිෂ්පාදනය කරන ලද මිහිමඬල වීඩියෝ වැඩසටහන් මාලාව ජාත්‍යන්තර සම්මානයකින් පිදුම් ලැබුවා ය. එමගින්, ජාතික විද්‍යා පදනමෙහි තොරතුරු සන්නිවේදන තාක්ෂණයෙහි ඵලදායී භාවිතය ඇගයීමකට සහ පිළිගැනීමකට ලක් කරනු ලැබ තිබේ.

## ශ්‍රී ලංකා විද්‍යා දර්ශකය - සංඛ්‍යාංක පුස්තකාල දත්තපාදකය

තොරතුරු සන්නිවේදන තාක්ෂණයෙහි ප්‍රශංසනීය භාවිතය සඳහා ජාතික විද්‍යා පදනම ඇගයීමකට ලක් කරමින්, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සංවිධානය කරන ලද ජාතික ඉ - අන්තර්ගත සම්මාන ප්‍රධානෝත්සවයේ දී ඉ - ස්වාභිමානී 2011 විශේෂ කුසලතා සම්මානයකින් ශ්‍රී ලංකා විද්‍යා දර්ශකය - (සංඛ්‍යාංක පුස්තකාල දත්ත පාදකය) පුදනු ලැබුවාය.

## පර්යේෂණ සේවා

## පද්ධතිය විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු (STMIS)

පර්යේෂකයින්ට පර්යේෂණ ප්‍රදාන සඳහා විශ්වාසයකින් යුක්තව අයදුම් කිරීමට හැකිවන පරිදි විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධති (STMIS) උත්පාදකය වැඩි දියුණු කිරීම මගින්, පර්යේෂකයින් හට පර්යේෂණ සිදු කිරීම සඳහා අවශ්‍ය කෙරෙන යටිතල පහසුකම්වල ඉතා වටිනා සංඝටකයක් වන අපගේ පර්යේෂණ සේවා සංවර්ධනය කිරීම අපි අඛණ්ඩව කරගෙන ගියෙමු.

STMIS යනු ජාතික විද්‍යා පදනම මගින් සකස් කරනු ලැබ පවත්වාගෙන යනු ලබන පරිගණකගත කළ තොරතුරු පද්ධතියකි. වසර 2011 තුළ දී ජාතික විද්‍යා පදනමෙහි තොරතුරු තාක්ෂණ සමෝධාන වැඩසටහන යටතේ UCSCහි සහයෝගය ඇතිව STMIS වෙබ්අඩවිය (www.nsf.mis.ac.lk) සහ ඒ ආශ්‍රිත දත්තපාදක යාවත්කාලීන කිරීමට සහ නවීකරණයට මූලාරම්භයක් ගනු ලැබුණි. මාර්ගගත දත්ත ඇතුළත් කිරීමේ පහසුකම්, දත්ත සෙවීමේ පහසුකම්, දත්ත පාදකය යාවත්කාලීන කිරීම සහ දත්ත පාදකයේ ධාරිතාවය පුළුල් කිරීම යනාදිය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබුණි. ඒ අනුව, විද්‍යාඥයින් පිළිබඳ යාවත්කාලීන කරන ලද තොරතුරු විද්‍යා හා තාක්ෂණ ආයතන මගින් පිළිගන්වනු ලබන සේවා සහ පුහුණු වැඩසටහන් පිළිබඳව තොරතුරු STMIS දත්ත පාදකයෙහි අන්තර්ගතවේ. 2011 වසර අවසාන වන විට දත්ත පාදකයට තොරතුරු සම්පාදනය කරන ලද මුළු ආයතන සංඛ්‍යාව 191ක් වන අතර රාජ්‍ය විශ්ව විද්‍යාලවල විද්‍යා හා තාක්ෂණ පීඨ 37ක් පර්යේෂණ සහ සංවර්ධන ආයතන මෙන්ම සේවා සම්පාදනය කරන ආයතන ද ඇතුළත්ව විද්‍යා හා තාක්ෂණ අංශයේ ආයතන 46ක් ද ඊට අන්තර්ගත වේ.



## ජාතික සංඛ්‍යාංකකරණ ව්‍යාපෘතිය

විද්‍යාත්මක පාර්ශවයට පහසුවෙන් පරිහරණය කිරීම සඳහා මාර්ගගත ප්‍රවේශයක් ලබා දීමේ අදහසක් ඇතිව දේශීය පුස්තකාලවල තිබෙන දේශීයව උත්පාදනය කෙරුණු විද්‍යාව හා තාක්ෂණය ආශ්‍රිත තොරතුරු සියල්ල සංඛ්‍යාංක ආකාරයට පත් කිරීමේ අරමුණ ඇතිව ජාතික සංඛ්‍යාංකකරණ ව්‍යාපෘතියක් (NDP) දියත් කරන ලදී. මෙම ව්‍යාපෘතිය පස් වසරක ව්‍යාපෘතියක් වන අතර ව්‍යාපෘතියේ I වන අදියර 2011 දී ආරම්භ කරන ලදී. I වන අදියර යටතේ, අප රටේ ඇති පුස්තකාල හයක් (06ක්), සංඛ්‍යාංකකරණය සඳහා හඳුනා ගන්නා ලදී. ව්‍යාපෘතියෙහි ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා මෙහෙයුම් කමිටුවක් පත් කරන ලද අතර ජාතික විද්‍යා පදනම සහ හවුල්කාර පුස්තකාල අතර අත්සන් කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් ද සකස් කරන ලදී. දේශීය පුස්තකාල තුළවූ අදාළ ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු රැස් කරන ලද අතර වසර පහක ව්‍යාපෘති කාලය සඳහා වැඩසැලැස්මක් සකස් කරන ලදී. සංඛ්‍යාංකකරණ කාර්යභාරය ඉටු කිරීම සඳහා සුදුසු බාහිර සැපයුම්කරුවෙකු ද හඳුනා ගන්නා ලදී.

සංඛ්‍යාංකකරණ ක්‍රියාවලියට සමාන්තරව කෝෂ්ඨාගාර (IR) පිහිටුවීම ප්‍රවර්ධනය කෙරුණි; කාලානුරූපව ඔවුන්ට අවශ්‍ය වන වෙනත් විද්‍යාත්මක තොරතුරු සැපයීම සහ විද්‍යාත්මක ප්‍රජාවට රට තුළ තිබෙන සියලුම ශාස්ත්‍රීය කරුණු ලබාගත හැකි බව සහතික කිරීමට ජාතික ආයතනික ඉ - කෝෂ්ඨාගාර ජාලයක් පිහිටුවීම, ඵලදායක පර්යේෂණවලට උපකාර කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නයක් ලෙස 2011 වසර තුළ ඉටුකරන ලද දායකත්වය විශේෂයෙන් සටහන් කළ යුතු ය.

## ශ්‍රී ලංකා විද්‍යා දර්ශක (SLSI) දත්ත පාදකය

පූර්ණ පාඨ ප්‍රලේඛනවල සංඛ්‍යාංක පුස්තකාලයක් බවට පත් කෙරුණු SLSI දත්තපාදකය මෙම වසර තුළ ශීඝ්‍ර ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී. 2011 දෙසැම්බර් 31 වන විට NSFLAN ඔස්සේ මාර්ගගතව ප්‍රවිෂ්ට විය හැකි පූර්ණ පාඨ ප්‍රලේඛන මුලු ගණන 23,553ක් ලෙස වාර්තා විය. මෙය, දත්තපාදකයෙහි වූ මුලු වාර්තා ගණනින් 59%ක් විය.

## ජාතික ඉ - කෝෂ්ඨාගාරය

ජාතික විද්‍යා පදනම මගින් දියත් කරන ලද ජාතික ඉ-කෝෂ්ඨාගාරය වෙනත් ඉ - කෝෂ්ඨාගාර සහ බොහොමයක් දේශීයව ප්‍රකාශනය කරන ලද මාර්ගගත වාරසඟරා (SLJOL දත්ත පාදකයන්හි වූ සියල්ල සමගින්) ඔස්සේ සෙවුම් කිරීමට සංයුක්ත සෙවුම් පහසුකම සමග ඒකාබද්ධ කරන ලදී. මෙමගින් එක් සෙවුමක් ඔස්සේ අඩවි එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ සෙවුම සඳහා පහසුකම් සපයයි.

## SLAAS දත්ත පාදකය

පර්යේෂකයින්ට තම කාර්යය සම්පූර්ණ කරගැනීමට පහසුකම් සපයමින් සහ දිරිමත් කරමින් පසුගිය වසර 25 තුළ SLAAS සැසිවල ඉදිරිපත් කරන ලද සියලුම පර්යේෂණ පත්‍රිකාවල (ආශ්‍රිත ග්‍රන්ථ සහ සාරාංශ) තොරතුරු මෙම දත්ත පාදකය තුළ අන්තර්ගත කොට ඇත.

## පර්යේෂණ අංශය (RD)

පර්යේෂණ සහ සංවර්ධන පාදක කොටගත් නවෝත්පාදන දිගුකලක සිට දියුණු ආර්ථිකයන් දරා සිටින කුළුණක් බවට පත්ව තිබෙන අතර එමගින් ජාතියේ ධනයට, රැකියා අවස්ථාවලට සහ ජනතාවගේ දිවි පැවැත්මට ඉතා වැදගත් දායකත්වයක් ලබා දී තිබේ.

විද්‍යාවේ සියලුම ක්ෂේත්‍රවල සහ ඉංජිනේරු විද්‍යාව යටතේ සිදු කෙරෙන පර්යේෂණවලට ජාතික විද්‍යා පදනම සහයෝගය සපයමින් සිටින අතර ඊට අනුකූලව එහි පර්යේෂණ අංශයට පහත සඳහන් වගකීම් පවරනු ලැබ තිබේ.

- ජාතික වැදගත්කමකින් යුත් තේමා කෙරෙහි යොමු වූ යම් මෙහෙවරක් වෙත එල්බ ගත් බහුවිෂයයික සහයෝගිතා පර්යේෂණ ද ඇතුළත්ව ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල සහ විද්‍යා හා තාක්ෂණ ආයතන මගින් සිදුකරනු ලබන මූලික හා ව්‍යවහාරික පර්යේෂණවලට මූලාරම්භය සැපයීම, පහසුකම් සැපයීම හා උපකාර කිරීම.
- විශ්ව විද්‍යාලවල සහ විද්‍යා හා තාක්ෂණ ආයතනවල විද්‍යාත්මක කටයුතු සඳහා විශිෂ්ට තලයේ සිටින ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි සහ පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂකයින්ට, ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්ව පිරිනැමීම.

පහත සඳහන් යෝජනා ක්‍රම/වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පර්යේෂණ අංශය එහි ක්‍රියාකාරකම් සහ කටයුතු සිදු කරගෙන යයි.

- තරඟකාරී පර්යේෂණ ප්‍රදාන වැඩසටහන
- පර්යේෂණ අධිශිෂ්‍යත්ව
- පර්යේෂණ ශිෂ්‍යත්ව
- පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂණ විද්‍යාඥයෝ
- පර්යේෂණ උපකරණ ප්‍රදාන
- පර්යේෂණ උපකරණ සඳහා අමතර කොටස්
- ජාතික තේමා මූලික පර්යේෂණ වැඩසටහන
- සමායෝජිත තේමා මූලික පර්යේෂණ වැඩසටහන (NTRP)
- ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ සම්මාන (CTRP)
- පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා උපකාර කෙරෙන වැඩ සටහන

## 1. ගුණත්වයෙන් ඉහළ පර්යේෂණ දිරිමත් කිරීම

### 1.1 තරඟකාරී පර්යේෂණ ප්‍රදාන වැඩසටහන

විද්‍යාඥයින්ගේ ආයතන තුළ සිදු කෙරෙන මූලික සහ ව්‍යවහාරික පර්යේෂණ සඳහා උපකාර කිරීම මගින් විද්‍යාත්මක පර්යේෂණ සඳහා අවශ්‍ය කෙරෙන මූල්‍යමය, භෞතික සහ මිනිස් බල සම්පත් සම්පාදනයට සහයෝගය ලබා දීම මෙම වැඩසටහන මගින් අදහස් කෙරේ. විද්‍යාඥයින්ගේ ස්වාධීන, පෞද්ගලික සහ බුද්ධිමය හැකියාව යොදා ගැනීමට පහසුකම් සැපයීම සහ අප රටේ සමාජ, ආර්ථික සංවර්ධනය කරා යොමු වූ උසස් මට්ටමේ පර්යේෂණ සිදු කිරීම සඳහා විද්‍යාඥයින් දිරිමත් කිරීම මෙමගින් සිදු කෙරේ.

“නේවාසික ඇගයීමේ” රැස්වීමක් සංවිධානය කිරීම මගින් අයදුම්පත් සඳහා වන දෙවන කැඳවුම් කාලය තුළ දී පර්යේෂණ ප්‍රදාන අයදුම් සැකසීම කඩිනම් කරන ලදී. ජාතික විද්‍යා පදනම මගින් ප්‍රථම වරට යොදාගන්නා ලද මෙම යාන්ත්‍රණය ඉතාමත් ඵලදායක බැව් තහවුරු විය. මෙය දෙදින වැඩසටහනක් වූ අතර ප්‍රථම දිනයේ දී විචාරකයින් මගින් අයදුම්පත් ඇගයීම සිදු කරන ලද අතර දෙවන දිනයේ දී මූල්‍යාධාර සැපයීමට සුදුසු ව්‍යාපෘති නිර්දේශ කිරීම සඳහා පර්යේෂණ මඬුලු රැස්වීම පවත්වන ලදී.

වසර තුළ පර්යේෂණ ප්‍රදාන 68ක් ප්‍රධානය කෙරුණි. මෙම ප්‍රදාන සඳහා පළමු වසරට වෙන් කරන ලද මුළු මුදල රු. මිලියන 56.5ක් විය.

2011 වසර තුළ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන යටතේ ලබාගත් ජයග්‍රහණ පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| 2011.12.31 වන විට ක්‍රියාත්මක තත්වයේ පැවතුණු ප්‍රදාන ගණන | 145 |
| පිරිනමන ලද ප්‍රදාන ගණන | 68 |
| නිම කරන ලද ප්‍රදාන ගණන | 37 |
| නවතන ලද ප්‍රදාන ගණන | - |

| | |
|---|---|
| පත්කරන ලද පර්යේෂණ සිසුන්/පත් කිරීමට නියමිත පර්යේෂණ සිසුන් | 10/34 |
| ලියාපදිංචි කරන ලද පර්යේෂණ සිසුන්/ලියාපදිංචියට නියමිත පර්යේෂණ සිසුන් | 03/31 |
| පත් කරන ලද තාක්ෂණ සහායකයින්/පත් කිරීමට නියමිත තාක්ෂණ සහායකයින් | 10/21 |
| ලබාගත් පශ්චාත් උපාධි | |
| • දර්ශනශූරි (Phd) | 03 |
| • දර්ශනපති (M.Phil) | 05 |
| • විද්‍යාපති (MSc) | - |
| • උසස් වෛද්‍ය උපාධි (MD) | - |
| ප්‍රදාන ඇසුරින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශන ගණන (විදේශීය) | 16 |
| ප්‍රදාන ඇසුරින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශන ගණන (දේශීය) | 08 |
| සන්නිවේදන ගණන | 114 |
| පවත්වනු ලැබූ කමිටු රැස්වීම් ගණන | 40 |

## 1.2 පර්යේෂණ අධිශිෂ්‍යත්ව

ජාතික සංවර්ධනයට, රටේ අවශ්‍යතාවයන් සඳහා, සහ රට තුළ සිදු කෙරෙන පර්යේෂණවල ප්‍රතිඵල ජාත්‍යන්තර/සුවිගත කරන ලද වාරසඟරාවල ප්‍රකාශනය කිරීම මගින් එකී පර්යේෂණ ජාත්‍යන්තර තලයට ගෙන ඒම ඉහළ නැංවීම සඳහා විශිෂ්ට, ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින්ගේ/ඉංජිනේරුවන්ගේ දැනුම, අත්දැකීම් සහ විශේෂඥ ඥානය භාවිතයට ගැනීම පිණිස මෙම උපකාර කිරීම සිදු කරයි.

**පර්යේෂණ අධිශිෂ්‍යත්ව වැඩසටහනෙහි සාරාංශය :**

| | |
|---|---|
| 2005 වසරේ සිට ප්‍රදානය කරන ලද අධිශිෂ්‍යත්ව ගණන | 10 |
| 2011 වසර තුළ ප්‍රදානය කරන ලද අධිශිෂ්‍යත්ව ගණන | 02 |
| 2011.12.31 වන විට ක්‍රියාත්මක තත්වයේ පැවතුණු අධිශිෂ්‍යත්ව ගණන | 03 |
| 2011 වසර තුළ නිම කරන ලද අධිශිෂ්‍යත්ව ගණන | 01 |
| මේ වන විට නිම කරන ලද අධිශිෂ්‍යත්ව මුළු ගණන | 07 |

## 1.3 පර්යේෂණ ශිෂ්‍යත්ව

පශ්චාත් උපාධි සඳහා යොමුවුණු මෙරට තුළ පූර්ණ කාලීන පර්යේෂණ සිදු කිරීම සඳහා ඉහළ සමත්කම් දක්වන විද්‍යා/ඉංජිනේරු උපාධිධාරීන් හට මෙම වැඩසටහන මගින් අවස්ථාවක් සැපයෙනු ඇත.

**පර්යේෂණ ශිෂ්‍යත්ව වැඩසටහනෙහි සාරාංශය:**

| | |
|---|---|
| 2011.12.31 වන විට ක්‍රියාත්මක තත්වයේ පැවති ශිෂ්‍යත්ව ගණන | 04 |
| පිරිනමන ලද ශිෂ්‍යත්ව ගණන | 01 |
| නිමකරණ සහ සම්පූර්ණ නිබන්ධ ලැබුණු ශිෂ්‍යත්ව ගණන | 02 |

## 1.4 පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂණ විද්‍යාඥයෝ

රට තුළ පූර්ණ කාලීන පර්යේෂණ සිදු කිරීම සඳහා ආචාර්ය උපාධිය සහ පර්යේෂණ පිළිබඳ මනා වාර්තා සහිත විද්‍යාඥයින්ට/ඉංජිනේරුවන්ට අවස්ථාවක් ලබාදීම මෙම වැඩසටහන යටතේ සිදු කෙරේ. අයදුම්පත් දෙකක් ලැබුණු නමුදු ප්‍රදාන ලබා ගැනීමේ දී අයදුම්කරුවන් අසමර්ථ වූහ.

## 1.5 උපකරණ ප්‍රදාන

ජගත් මට්ටමේ විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ සමග උරෙන් උර ගැටීමට දේශීය පර්යේෂණ සඳහා නවීන පහසුකම් සහිත පර්යේෂණාගාර අවශ්‍ය වේ. පර්යේෂණ සඳහා පර්යේෂණ ආයතන සහ විශ්ව විද්‍යාලවලට මිලදී ගැනීම පිණිස අධික වියදමක් දැරි යුතු උපකරණ ලබා ගැනීමට සහය වීම මෙම වැඩසටහන මගින් සිදු කෙරේ. තිරසර පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම සඳහා පහසුකම් සැපයීම හා උපකාර කිරීම මෙම වැඩසටහන මගින් සිදු කෙරේ.

මෙම වසර තුළ මුළු පිරිවැය රු.මිලියන 46.8ක ප්‍රදාන 31ක් ප්‍රදානය කර ඇත.

## 1.6 අමතර කොටස් සඳහා ප්‍රදාන

මූල්‍ය සීමා කිරීම් නිසා විශ්ව විද්‍යාලවල සහ පර්යේෂණ හා සංවර්ධන ආයතනවල පර්යේෂණ උපකරණවලට අවශ්‍ය කෙරෙන අමතර කොටස් මිලට ගැනීම ප්‍රධාන ගැටළුවක් බවට පත්ව ඇති නිසා උපකරණ අළුත්වැඩියාවට/නඩත්තු කිරීමට අවශ්‍ය අමතර කොටස් පර්යේෂකයින්ට ලබා ගත

හැකි වන පරිදි අමතර කොටස් සඳහා ප්‍රදාන වැඩසටහන ජාතික විද්‍යා පදනම මගින් හඳුන්වා දෙන ලදී.

රටේ සමාජ ආර්ථික සංවර්ධනය කරා මෙහෙයවන පර්යේෂණ සංවර්ධන කටයුතු සඳහා තිබෙන පහසුකම් මෙම වැඩසටහන මගින් ශක්තිමත් කෙරේ.

ගතවුණු වසර තුළ මුළු පිරිවැය රු. මිලියන 1.75ක් වූ ප්‍රදාන හයක් (06ක්) පිරිනමා තිබේ.

## 2. ජාතික තේමාමූලික පර්යේෂණ වැඩසටහන (NTRP)

රටේ ජාතික අවශ්‍යතා පිළබඳ කටයුතු කෙරෙන මෙහෙවර දිශාභිමුඛ, බහුවිෂයයික, සමායෝජිත පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම ජාතික තේමාමූලික පර්යේෂණ වැඩසටහන මගින් සිදු කෙරේ. මෙම වැඩසටහනින් බලාපොරොත්තු වන්නේ ජාතික අවශ්‍යතාවය මත ආරම්භ කරන ලදුව ජාතික සංවර්ධනයට යොදා ගත හැකි අවසන් ප්‍රතිඵලයක් ලබා ගෙන නිම කළ හැකි පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමය. පහත සඳහන් තේමා, ප්‍රමුඛතා ක්ෂේත්‍ර ලෙස හඳුනා ගනු ලැබී ය.

### 2.1 ආහාර සුරක්ෂිතතාවය

තේමා පත්‍රය සකස් කරන ලද අතර පර්යේෂණ අන්තර් ප්‍රමුඛතා සහ ආහාර සුරක්ෂිතතාවය හා සම්බන්ධ කාරණා/ගැටළු ආමන්ත්‍රණයට විවිධ අංශ යටතේ සුදුසු වැඩසටහන් හඳුනාගැනීම සඳහා ආදාළ අංශවල නියැලෙන්නන්ගේ රැස්වීමක් ද පවත්වන ලදී. එයට අනුව, වැඩසටහන් පහක් (05ක්) හඳුනා ගන්නා ලදී. සෑම වැඩසටහනක් සඳහාම සවිස්තරාත්මක වැඩසටහන් ප්‍රලේඛන සකස් කරන ලද අතර ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය ද සකසන ලදී.







### 2.2 ජල සුරක්ෂිතතාවය

ජල පර්යේෂණ පිළිබඳ ජාතික සංසදයේදී හඳුනාගත් අන්තර සහ ප්‍රමුඛතා මත පදනම්ව තේමා පත්‍රය සකස් කොට අවසන් කරන ලදී. ජල සුරක්ෂිතතාවයට අදාළ කරුණු/ගැටළු ආමන්ත්‍රණය සඳහා වැඩසටහන් හතක් (07ක්) හඳුනා ගන්නා ලදී.




### 2.3 දේශගුණ විපර්යාස

පර්යේෂණ අන්තර සහ ප්‍රමුඛතා හඳුනාගැනීමට පර්යේෂණ මඩුළු රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. සිදුකරන ලද සාකච්ඡාවලට අනුව තේමා පත්‍රය සකස් කෙරුණි.

දේශගුණ විපර්යාසවලට අදාළ ගැටළු ආමන්ත්‍රණය කිරීම පිණිස වැඩසටහන් අටක් (08ක්) හඳුනාගන්නා ලදී.

## 3. සමෝධානිත තේමාමූලික පර්යේෂණ වැඩසටහන (CTRP)

අප රටේ ආර්ථිකයට සහ සමාජ සුබසාධනයට සෘජුව ම දායකත්වයක් දැක්විය හැකි මනාව නිර්වචනය කරන ලද නිෂ්පාදන ලබා ගැනීමේ අරමුණ ඇතිව ජාතික විද්‍යා පදනම මගින් මෙම බහුවිෂයයික තේමා මූලික පර්යේෂණ වැඩසටහන ආරම්භ කරන ලදී.

තේමා 06ක් යටතේ ප්‍රදාන 24ක් මේ වන විට ප්‍රධානය කොට තිබේ. 2011 වර්ෂය වන විට අවසන් වාර්තා 18ක් ලැබී තිබුණු අතර මෙම වාර්තාවල ප්‍රතිඵල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන සුදානම් කිරීම් සිදු කිරීම පිණිස ආදාළ ආයතනවලට දන්වා යවන ලදී.

ඉහත වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ ව්‍යාපෘති පදනම් කොටගත් වාර්තාවක් සකස් කරන ලදී.

**1 වන වගුව : CTRP හි තේමාවක් යටතේ සිදුකරන ලද පර්යේෂණවල ප්‍රගතිය**

| තේමාව | අවසන් වාර්තාව ලැබීමට නියමිත | නිම කරන ලද | අත්හරින/ නවතන ලද | මුළු ගණන |
|---|---|---|---|---|
| ස්වශක්තිය සඳහා විකල්ප කෘෂිකර්මය (AASR) | - | 3 | 1 | 4 |
| ස්වභාවික සම්පත් ධරණීය පරිභෝජනය (SUNR) | 1 | 1 | - | 2 |
| පරිසරය සුරැකීම සහ ධරණීය සංවර්ධනය (EPSD) | 2 | 2 | - | 4 |
| බෝ නොවන රෝග (NCD) | - | 2 | - | 2 |
| ව්‍යසන අවම කිරීම සහ කළමනාකරණය (DMM) | 1 | 8 | - | 9 |
| ග්‍රාමීය සංවර්ධනය සඳහා තාක්ෂණය (TFRD) | - | 2 | 1 | 3 |
| **මුළු එකතුව** | **4** | **18** | **2** | **24** |

## 4. SUSRED වැඩසටහන

පශ්චාත් පර්යේෂණ උපාධි (M.Phil සහ PhD) සඳහා යොමු කෙරෙන විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල පර්යේෂණ සිදු කරන සිසුන් අධීක්ෂණය කිරීමෙහි යෙදෙන විද්‍යාඥයින්/ඉංජිනේරුවන් අභිප්‍රේරණය කිරීමට, උපකාර කිරීමට සහ පිළිගැනීමකට ලක් කිරීමට පර්යේෂණ උපාධි අධීක්ෂණය කිරීම සඳහා උපකාර කෙරෙන වැඩසටහන (SUSRED) ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන යටතේ අයදුම්පත් කැඳවන ලද අතර ඉහත ප්‍රදානයට සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගන්නා ලදී.

| | |
|---|---|
| ලැබුණු අයදුම්පත් මුළු ගණන | 24 |
| 2011 තුළ සකසන ලද අයදුම්පත් | 14 |
| ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් | 05 (M.Phil උපාධි) |
| ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් | 04 (PhD උපාධි) |

## 5. රෝග කාරකය අනියත නිධන්ගත වකුගඩු රෝගය (CKDU)

ශ්‍රී ලංකාවේ බොහෝමයක් ප්‍රදේශවලින්, විශේෂයෙන්ම උතුරු මැද පළාතෙන් මතු වූ, සෙමින් ආරම්භ වී, වැඩිවන, රෝග ලක්ෂණ නොපෙන්වන, වර්ධනය වන, සමහර විට අවුරුදු 20කට වඩා අඩු වයසේදීත් ආරම්භ කෙරෙන, රෝග කාරකය අනියත, නිදන්ගත වකුගඩු රෝගයේ (CKD) නව ආකාරයට හේතුව විමර්ශනය කිරීමට සහ තිරසර විසඳුමක් සොයාගැනීමේ අරමුණ ඇතිව ලබා ගත්තා වූ මූලාරම්භය 2011 තුළදීත් අඛණ්ඩව ඉදිරියට ගෙන යන ලදී. භෞතික සහ මූල්‍යමය යන දෙඅංශයෙහිම ප්‍රගතිය අධීක්ෂණය කරන ලද අතර අවසන් වාර්තාව 2012 දී ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

## 6. විශේෂ කටයුතු

පර්යේෂණ ප්‍රදාන පරිපාලනය කිරීමට අමතරව ජාතික ජෛව තාක්ෂණ ප්‍රතිපත්තීන් ස්ථාපිත කිරීමට පනතක් සැකසීම, ක්‍රියාත්මක තත්වයේ පවතින පර්යේෂණ ප්‍රදාන පිළිබඳව දත්ත පාදකයක් සැකසීම, ජාතික විද්‍යා පදනමෙහි ජාතික කමිටු සහ පර්යේෂණ මඩුලු ක්‍රියාකාරීව තබාගැනීමට කටයුතු කිරීම හා ජාතික විද්‍යා පදනමෙහි ජාතික කමිටු පිළිබඳ දත්ත පාදකයක් සැකසීම යනා දී විශේෂ කටයුතු බොහොමයක් ක්‍රියාත්මක කරන ලදී.

### 6.1 ප්‍රකාශන

2011 වසර තුළ පහත සඳහන් ප්‍රකාශන නිම කරන ලදී.
සමාජ විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකා වාරසඟරාව (SLJSS)
31/32 කලාප සහ අංක 1 හා 2 ප්‍රකාශනය කරන ලදී.

## 7. වැඩමුළු / සම්මන්ත්‍රණ

වසර තුළ සංවිධානය කරන ලද ප්‍රධාන වැඩමුළු වන්නේ,

**අ) ව්‍යාපෘති යෝජනාවලි ලේඛනය පිළිබඳ වැඩමුළු**

තරඟකාරී පර්යේෂණ ප්‍රදාන වැඩසටහන සඳහා ව්‍යාපෘති යෝජනා කැඳවීමත් සමගම "ඵලදායී ව්‍යාපෘති යෝජනාවලි ලේඛනය" පිළිබඳ වැඩමුළු දෙකක් 2011 පෙබරවාරි සහ ඔක්තොම්බර් මාසවල දී පවත්වන ලදී. මෙම වැඩ පිළිවෙළෙහි අරමුණ වූයේ, පර්යේෂණ ප්‍රදාන ලබාගැනීම සාර්ථක කරගැනීම පිණිස ජාතික විද්‍යා පදනම වෙත ඉහළ ප්‍රමිතියකින් යුත් පර්යේෂණ යෝජනාවලි භාරදීම පිළිබඳ අපේක්ෂිත අයදුම්කරුවන් අතර දැනුවත්භාවයක් ඇති කිරීමයි.

**ආ) ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ සමායෝජිත වැඩමුළු - පර්යේෂණ අන්තර හා ප්‍රමුඛතා ව්‍යාපෘති**

ආහාර සුරක්ෂිතතාවය යන තේමාව යටතේ ජාතික තේමා මූලික පර්යේෂණ වැඩසටහනෙහි (NTRP) විෂයපථය තුළ ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනා ගැනීමේ අරමුණ සහිතව, "ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ සමායෝජිත වැඩමුළුව - පර්යේෂණ අන්තර සහ ප්‍රමුඛතා ව්‍යාපෘති" යන මැයෙන් දෙදින වැඩසටහනක් 2011 ජූනි 21 – 22 යන දිනවල ගලධාරී හෝටලයේදී පැවැත්විණි. පෝෂණය, ආරක්ෂාව සහ ගුණත්වය, පාත්‍රීතාවය, නිෂ්පාදනය සහ සමාජ සාධක යනාදී ආහාර සුරක්ෂිතතාවය හා බැඳුණු විවිධ අංශ පිළිබඳ කරුණු ආරාධිත කථිකයින් විසින් ඉදිරිපත් කරන ලදී.

**ඇ) නියාමකයින්/විද්‍යාඥයින් සඳහා ජෛව තාක්ෂණ වැඩමුළුව - "හරිත විප්ලවයේ සිට ජාන විප්ලවය දක්වා"**

එක්සත් ජනපද තානාපති කාර්යාලය සහ ජීන්ටෙක් ආයතනයෙහි සහයෝගය ඇතිව මෙම වැඩමුළුව සංවිධානය කර 2011 සැප්තැම්බර් 29 – 30 යන දෙදින තුළ පවත්වන ලදී.

**ඈ) 'දේශගුණ විපර්යාස සහිත යුගයක තිරසර ආහාර සුරක්ෂිතතාවය' පිළිබඳ දේශනය**

සැප්තැම්බර් 30 දින මහාචාර්ය එස්.එන්. ස්වාමිනාදන් විසින් මෙම දේශනය පවත්වන ලදී.

**ඉ) ආචාර්ය මාල්ලා රාඕගේ ඉදිරිපත් කිරීම**

අසාත්මික සහ බෝවන රෝග පිළිබඳ ජාතික ආයතනයෙහි ආචාර්ය මාල්ලා රාඕ සහ වොෂින්ටන්හි වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශ්ව විද්‍යාල පාසලේ ආචාර්ය ප්‍රෝ වෙයිල් විසින් පිළිවෙළින් එක්සත් ජනපදයේ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයෙහි තිබෙන ජගත් සෞඛ්‍ය පිළිබඳ පර්යේෂණ අවස්ථා සහ වසාවාහී බරවා රෝගය සහමුලින්ම ඉවත් කිරීමට දරණ ජගත් ප්‍රයත්නය යන මැයෙන් ඉදිරිපත් කිරීම් දෙකක් කොළඹ විශ්ව විද්‍යාලයේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව පෙබරවාරි 11 දින පවත්වන ලදී.

## 8. පර්යේෂණ අංශය මගින් ක්‍රියාත්මක කෙරෙන කමිටු

**ජාතික කමිටු**

- පර්යේෂණ සහ සංවර්ධනය පිළිබඳ ජාතික කමිටුව
- MAB වැඩසටහන පිළිබඳ ජාතික කමිටුව
- සාගර සහ මුහුදු විද්‍යාව පිළිබඳ ජාතික කමිටුව
- ඛනිජ සම්පත් තිරසර භාවිතය පිළිබඳ ජාතික කමිටුව

**විශේෂ කමිටු**

- පර්යේෂණ අංශය සඳහා උපදේශක මණ්ඩලය

**පර්යේෂණ මඩුලු**

- කෘෂිකර්මය සහ ආහාර විද්‍යා පිළිබඳ පර්යේෂණ මඩුල්ල
- මූලික විද්‍යා පිළිබඳ පර්යේෂණ මඩුල්ල
- ජෛව තාක්ෂණය පිළිබඳ පර්යේෂණ මඩුල්ල
- පරිගණක විද්‍යාව සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ පර්යේෂණ මඩුල්ල
- ඉංජිනේරු විද්‍යා හා වාස්තු විද්‍යාව පිළිබඳ පර්යේෂණ මඩුල්ල
- පාරිසරික විද්‍යාව පිළිබඳ පර්යේෂණ මඩුල්ල
- සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ පර්යේෂණ මඩුල්ල
- ජල විද්‍යාව පිළිබඳ පර්යේෂණ මඩුල්ල
- පුස්තකාලය සහ තොරතුරු විද්‍යා පිළිබඳ පර්යේෂණ මඩුල්ල
- නැනෝතාක්ෂණය පිළිබඳ පර්යේෂණ මඩුල්ල
- ස්වභාවික සම්පත් සහ ජෛව විවිධත්වය පිළිබඳ පර්යේෂණ මඩුල්ල
- විද්‍යා අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ මඩුල්ල
- විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති අධ්‍යයනය පිළිබඳ පර්යේෂණ මඩුල්ල
- සමාජ විද්‍යාව පිළිබඳ පර්යේෂණ මඩුල්ල

## තාක්ෂණ අංශය (TD)

දේශීය ව්‍යාපාර සහ මහජනතාව අතරින් යමෙක් විද්‍යාව හා තාක්ෂණය යොදා ගෙන සිදු කරන ව්‍යාපෘතිවල නිෂ්පාදන, ක්‍රියාවලි සහ ව්‍යාපාර මොඩල සකස්කිරීමට සහ වැඩිදියුණු කිරීම පිණිස දැරීමට සිදුවන වියදම පියවාගැනීම සඳහා තාක්ෂණ ප්‍රදාන වැඩසටහන මගින් මූල්‍යාධාර සපයනු ලැබේ.

### 1. තාක්ෂණ ප්‍රදාන

තරඟකාරී පර්යේෂණ ප්‍රදාන වැඩසටහනෙහි ප්‍රතිඵල වන නිෂ්පාදන වාණිජකරණය ප්‍රවර්ධනය කිරීමත්, තාක්ෂණික සංවර්ධනය හා නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීමත් සඳහා තාක්ෂණ ප්‍රදාන වැඩසටහන් දෙකක් ක්‍රියාත්මක කරන ලදී.

1. තාක්ෂණ සංවර්ධනය සඳහා උපකාර කිරීම (Tech-D)
2. නූතන තාක්ෂණය පදනම් කොටගත් ව්‍යාපාර ආරම්භය සඳහා උපකාර කිරීම (Start Ups)

2011 දී තාක්ෂණ ප්‍රදාන පිළිබඳ පුවත්පත් දැන්වීමක් පල කරන ලද අතර ලැබුණු අයදුම්පත් 27න් ("තාක්ෂණ සංවර්ධනය සඳහා උපකාර කිරීම" සඳහා අයදුම්පත් 19ක් සහ "නූතන තාක්ෂණය පදනම් කොටගත් ව්‍යාපාර ආරම්භය සඳහා උපකාර කිරීම" සඳහා අයදුම්පත් 09ක්) "තාක්ෂණ සංවර්ධනය සඳහා උපකාර කිරීම" වැඩසටහන යටතේ ප්‍රදාන පහක් සහ "නූතන තාක්ෂණය පදනම් කොටගත් ව්‍යාපාර ආරම්භය සඳහා උපකාර කිරීම" යටතේ එක් ප්‍රදානයක් ද ප්‍රදානය කරන ලදී.

### 2. පර්යේෂණ ප්‍රදාන

#### 2.1 නැනෝතාක්ෂණය

නැනෝතාක්ෂණය පිළිබඳ ක්‍රියාත්මක තත්වයේ පවතින ප්‍රදාන තුනක් තිබුණු අතර මුල් ව්‍යාපෘති යෝජනාවලියට අනුව ඉලක්ක සපුරාගැනීම සඳහා පර්යේෂණ ව්‍යාපෘති වසර පුරා අධීක්ෂණය කරනු ලැබුණි.

### 3. ජාතික නැනෝතාක්ෂණ මූලාරම්භය

#### 3.1 නැනෝතාක්ෂණය පිළිබඳ ප්‍රතිපත්තිය

ප්‍රතිපත්තියක් සැකසීම යන්නෙන් අදහස් කෙරෙන්නේ විශ්වාසය ගොඩනැංවීමේ දී ඉතා වැදගත්වන අදාළ විද්‍යාත්මක ක්ෂේත්‍රයෙහි කාර්යක්ෂම සහ ඵලදායී ක්‍රියාකාරිත්වය ඇති කිරීමට අවශ්‍ය කෙරෙන පාරදෘශ්‍ය, විවෘත සහ අපක්ෂපාතී ක්‍රියාකාරකම් සහ දෙනු ලබන විෂයක් තුළ ක්‍රියාත්මක වන පරාමිතික සියල්ල එක තැනකට ගෙන ඒමයි. නැනෝතාක්ෂණය පිළිබඳ ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම මගින් ජාතික විද්‍යා පදනම ඒකී ක්ෂේත්‍ර තුළ වූ අවශ්‍යතාවන් සපුරාලීමට දායක විය.

#### 3.2 දැනුවත් කිරීමේ වැඩසටහන්

ආර්ථික විද්‍යාඥයින්ට සහ බැංකු ක්ෂේත්‍රයේ වෘත්තිකයින් හට නැනෝතාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් බැංකු කටයුතු අධ්‍යයනය පිළිබඳ මධ්‍යස්ථානයේ දී 2011 ඔක්තොම්බර් 20 දින පවත්වනු ලැබී ය.

#### 3.3 "ශ්‍රී ලංකාවේ නැනෝතාක්ෂණයට අදාළ කටයුතු සඳහා නියාමන රාමුවක් සකස් කිරීම" පිළිබඳ IDRC ව්‍යාපෘතිය

TERI ඉන්දියාව, නැනෝ විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ප්‍රෙස්ටන් ආයතනය/පාකිස්ථානය, IDRC සහ ශ්‍රී ලංකා සහයෝගිතා ආයතනවල සහභාගිත්වය ඇතිව ව්‍යාපෘතීන් ආරම්භ කිරීමේ රැස්වීම මාර්තු 08 – 09 දෙදින තුළ පවත්වන ලදී. අවබෝධතා ගිවිසුමේ සකස් කිරීම සිදු කර හවුල්කාර ආයතන සමග ඒවා අත්සන් කිරීම සිදු කරන ලදී. IDRC සහ ජාතික විද්‍යා පදනම අතර ප්‍රදාන කොන්දේසි පිළිබඳ අවබෝධතාවය අත්සන් කිරීම සිදු කෙරුණි. ඉදිරියට ක්‍රියාත්මක කළ හැකි කර්තව්‍ය ඇතුළත් යෝජනාවලි හවුල්කාර ආයතනවලින් ලබා ගැනුණි. අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමෙන් අනතුරුව හවුල්කාර ආයතන වෙත මූල්‍යාධාරවල පළමු වාරිකය නිකුත් කිරීමට කටයුතු කරන ලදී. ව්‍යාපෘතියෙහි ප්‍රගතිය විමර්ශනය කිරීම පිණිස ව්‍යාපෘති නියමුවන් සහ හවුල්කාර ආයතන සමග නිරන්තර රැස්වීම් සංවිධානය කරන ලදී. කාර්ය සැලසුම්වලට අනුව කටයුතු සිදු කෙරෙමින් පැවතුණි.

## 4. තාක්ෂණ පෙර දැක්ම

### 4.1 පෙරදැක්ම විශ්ලේෂණය පිළිබඳ පුහුණු වැඩමුළුව

විද්‍යාඥයින්, ඉංජිනේරුවන්, වෛද්‍යවරුන්, කර්මාන්තකරුවන් සහ ජාතික විද්‍යා පදනමේ විද්‍යාත්මක නිලධාරීන්ගේ සහභාගිත්වය ඇතිව "තාක්ෂණ පෙර දැක්ම" පිළිබඳ වැඩමුළුව 2011 ඔක්තොම්බර් 27 – 29 දක්වා ජාතික විද්‍යා පදනම් ශ්‍රවනාගාරයේ දී පවත්වන ලදී.

මෙහි අරමුණු වූයේ;

1. විද්‍යා හා තාක්ෂණ ප්‍රමුඛතා පිළියෙළ කිරීමේ දී සහ ජාතික සැලසුම්කරණ ක්‍රියාවලියේ දී තාක්ෂණ පෙරදැක්ම භාවිතයේ ඇති වැදගත්කම දේශීය විද්‍යාත්මක සහ තාක්ෂණික ප්‍රජාව, ප්‍රතිපත්ති සකස්කරන්නන් සහ අනෙකුත් රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීම.
2. පර්යේෂණ ප්‍රමුඛතාකරණයට සහ ක්‍රමෝපාය සකස් කිරීම සඳහා පෙරදැකුම් ක්‍රමවේද සහ පෙරදැකුම් ප්‍රතිඵල යොදා ගැනීම පිළිබඳ සවිස්තරාත්මක පුහුණුවක් පර්යේෂකයින්ට, ශාස්ත්‍රීය පුද්ගලයින්ට සහ කර්මාන්තකරුවන්ට ලබාදීම.
3. සංවර්ධන ක්‍රියාවලියේ දී ජාතික නවෝත්පාදක පද්ධතිය තුළ ක්‍රියාකාරිත්වයේ සහභාගිත්වය ඉහළ නැංවීම සහ මෙකී ක්‍රියාකරුවන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය ශක්තිමත් කිරීම.

විදේශීය සම්පත්දායකයින් දෙදෙනෙකු ; ආචාර්ය ඔස්කාන් සරිටාස් සහ එල්ක් ඩාල් මිය විසින් වැඩමුළුව පවත්වන ලදී. විවිධ ආයතනවලින් ලැබුණු අයදුම්පත් 75ක් අතරින් සහභාගිවන්නන් 26ක් තෝරා ගනු ලැබීය. සහභාගිවූවන් කණ්ඩායම් 3ක කටයුතු කළ අතර අනාගතයේ දී ක්‍රියාත්මක කරනු පිණිස පෙරදැකුම් යෙදීම් තුනක් යෝජනා කරනු ලැබීය. ඉදිරියට කටයුතු කරගෙන යෑම සඳහා සංකල්පමය යෝජනාවලි තුනක් සකස් කරන ලදී. විද්‍යාඥයින්ගේ සහ විවිධ ආයතනවල හවුල්කාරත්වයෙන් යුත් කමිටුවක් සමග ජාතික පෙර දැකුම් කටයුත්තක් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කෙරෙන වඩා යහපත් පදනමක් සකස් කරන ලදී.

- දේශගුණ විපර්යාස සහ ඉදිරි වසර 15 තුළ බෝවෙන රෝග සඳහා එහි බලපෑම
- 2020 දී දකුණු ආසියාවේ පර්යේෂණ කේන්ද්‍රය වීම
- 2025 දී බලශක්ති පරිභෝජනයෙන් 25%ක් සපුරා ගැනීම පිණිස නැනෝ-සූර්යකෝෂ සැකසීමේ ව්‍යාපෘතිය

## 5. බුද්ධිමය දේපල (IP) පිළිබඳ දැනුම්වත්වීම සහ ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම

### 5.1 NIPOහි සහයෝගිතාවය ඇතිව 'විදාතා' මධ්‍යස්ථාන කේන්ද්‍ර කොටගෙන IP පහසුකම් සැලසීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම

මෙම ක්‍රියාවලිය සඳහා පහසුකම් සැපයීම පිණිස මධ්‍යස්ථාන පිහිටුවීම මගින් නව නිෂ්පාදකයින්ට සහ බුද්ධිමය දේපළ නිර්මාණකරුවන්ට තම අයිතීන් ලබාගැනීමට, ආරක්ෂා කරගැනීමට සහ කළමනාකරණය කිරීමට සහය වීමේ අරමුණ ඇතිව "විදතා මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගෙන IP පහසුකම් සැලසීමේ මධ්‍යස්ථාන ක්‍රියාවට නැංවීම (IPFC)" පිළිබඳ යෝජනාවලියක් සකස් කරන ලදී. මෙම කර්තව්‍යය ප්‍රවර්ධනය කිරීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම පිහිටුවා ඇති විදතා සම්පත් මධ්‍යස්ථාන, IP පහසුකම් සැපයීමේ මධ්‍යස්ථාන ලෙස යෝජනා කරනු ලැබ ඇත.

මෙය, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (NIPO), තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය, සහ ජාතික විද්‍යා පදනම යන ආයතනවල සහයෝගිතාවය මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය මගින් ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර සපයනු ලැබේ.

වසර 2015 දක්වා දීර්ඝ කරන ලද අදියර තුනකින් සමන්විත වන කාර්ය සැලැස්මක් සකසනු ලැබ ඇත. ව්‍යාපෘතිය අදියර තුනකින් සමන්විතය.

1 වන අදියර : පළාත් මට්ටමින් IP පහසුකම් සැලසීමේ මධ්‍යස්ථාන පිහිටුවීම (නියාමක ව්‍යාපෘතිය - 2012 දී මධ්‍යස්ථාන දෙකින්)

2 වන අදියර : ඉතිරි පළාත්වල මධ්‍යස්ථාන පිහිටුවීම

3 වන අදියර : දිස්ත්‍රික් මට්ටමේ මධ්‍යස්ථාන පිහිටුවීම

නියාමක ව්‍යාපෘතිය දියත් කිරීමේ සම්මන්ත්‍රණය ශ්‍රී ලංකා පදනම් ආයතන ශ්‍රවණාගාරයේ දී 2011 දෙසැම්බර් 22 දින පවත්වනු ලැබීය. ජාතික බුද්ධිමත් දේපළ කාර්යාලයේ සහයෝගය ඇතිව ජාතික විද්‍යා පදනම මගින් මෙම වැඩසටහන සංවිධානය කරන ලදී.

පළාත් නවය නියෝජනය කරමින් විද්‍යා හා තාක්ෂණ නිලධාරීහු 115 දෙනෙකු මෙම සම්මන්ත්‍රණයට සහභාගි වූහ. IPFC පිළිබඳ විද්‍යා සම්පත් මධ්‍යස්ථානවලට සම්බන්ධ විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් (STO) දැනුවත් කිරීමට මෙම වැඩසටහන පවත්වන ලදී. NIPOහි නිලධාරීහු සම්පත්දායකයන් ලෙස තම දායකත්වය ලබා දුන්හ.

## 5.2 NIPO සහ WIPOහි සහයෝගය සහිත IP විගණන ව්‍යාපෘතිය

පසු කටයුතු ලෙස සාකච්ඡා කිරීමට සහ ස්ථාපිත කිරීමට සංකල්ප පත්‍රයක් කෙටුම්පත් කරන ලදී.

## 5.3 විශ්ව විද්‍යාලවල IP අධ්‍යාපනය (පවත්නා ව්‍යාපෘතිය අඛණ්ඩව කරගෙන යෑම) 2වන අදියර (වෙනත් පීඨ)

පාසල් සහ විශ්ව විද්‍යාල විෂය ධාරා තුළට IP හඳුන්වා දීම සඳහා සිදු කරන ලද යෝජනාවට අනුව 1 වන අදියර ලෙස සකස් කරන ලද IP මොඩියුල විශ්ව විද්‍යාලවල විද්‍යා සහ විද්‍යාවට සම්බන්ධ පීඨවලට හඳුන්වා දීම සිදුකරන ලදී. විශ්ව විද්‍යාලවල විද්‍යා නොවන පීඨ සඳහා වන දෙවන අදියර ක්‍රියාත්මක කිරීමට පෙර පළමු අදියරෙහි ප්‍රගති සමාලෝචනය සිදු කරන ලදී.

## 5.4 පේටන්ට් අයදුම්පත් කෙටුම්පත් කිරීම සහ ගොනු කිරීම/පේටන්ට් තොරතුරු සෙවුම සඳහා තාක්ෂණික උපදෙස් සම්පාදනය කිරීම

දේශීයව මෙන්ම පේටන්ට් සහයෝගිතා ගිවිසුම (PCT) යටතේ පේටන්ට් අයදුම්පත් ගොනු කිරීම සඳහා නව නිෂ්පාදකයින්ට ජාතික විද්‍යා පදනම සහයෝගය සපයයි.

මේ සම්බන්ධයෙන්, ප්‍රදීප් පීරිස්, එස්.එස්.ආර්. ජයතිලක, හර්ෂ කුමාර, ජේ.අයි. උයන්ගොඩ යන මහත්වරුන්ට PCT අයදුම්පත් කෙටුම්පත් කිරීම සහ ගොනු කිරීම සඳහා තාක්ෂණ අංශය සහයෝගය ලබා දුන් අතර උඩුනුවර විද්‍යා මධ්‍යස්ථානයෙහි ඉල්ලීම පරිදි පේටන්ට් අයදුම්පත්‍ර දෙකක් කෙටුම්පත් කිරීම සඳහා උපදේශකත්වය සපයන ලදී.

පොල් කැඩීමේ/ගස් නැගීමේ උපකරණ පිළිබඳ පේටන්ට් සෙවුම් සිදු කර, හර්ෂ කුමාර ගාල්ලගේ මහතාට එම සෙවුම් ප්‍රතිඵල ලබා දෙන ලදී. වෙනත් නව නිෂ්පාදකයින් සිව් දෙනෙකුට පොල් ලෙලි ගැසීමේ යන්ත්‍ර, බල ශක්ති උත්පාදක පොම්ප සහ ඉටි සීල් කිරීමේ යන්ත්‍ර පිළිබඳ පේටන්ට් සෙවුම් තොරතුරු සපයන ලදී.

නිෂ්පාදකයෙකු වන ටී.එස්.එස්.ගෝමස් මහතාට ජාතික විද්‍යා පදනමෙහි උපකාරය ඇතිව ගොනු කළ තම PCT අයදුම් පත්‍රය සඳහා ජාත්‍යන්තර සෙවුම් වාර්තාව සහ ලිඛිත උපදෙස් ලැබී ඇත (වර්ෂ 2010 දී ජාතික විද්‍යා පදනම මගින් ඔහුට තාක්ෂණික සහයෝගය ලබා දෙන ලදී). ඔහුගේ PCT අයදුම් පත්‍රය (PCT/IB 2010/052604) පේටන්ට් කිරීම සඳහා වන අවශ්‍යතා තෘප්ත කරනු ලැබ ඇත. එනිසා, ඔහුට ජාතික අවධියට ඇතුල්වීම සඳහා අවශ්‍ය කෙරෙන තොරතුරු සපයන ලදී.

### 5.5 මාර්ගගත PCT ගොනු කිරීම සහ පේටන්ට් තොරතුරු සෙවුම සහ කෙටුම්පත් කිරීම සඳහා පහසුකම් සපයමින් පේටන්ට් උපකාරක අංශයක් ස්ථාපිත කිරීම

PCT-SAFE මෘදුකාංගය යොදා ගනිමින් පහත සඳහන් PCT අයදුම්පත් ද්විත්වය ඉලෙක්ට්‍රොනිකව ගොනු කරන ලදී.

1. ප්‍රසාද් පීරිස් මහතාගේ Shopping portal දෘශ්‍යමාන කිරීම
   (අයදුම්පත් අංකය : PCT/IB/2011/051356)
2. හර්ෂ කුමාර ගාල්ලගේ මහතාගේ, ගස් නගින්නන් සඳහා ආරක්ෂිත ගස් නැගීමේ උපකරණය
   (අයදුම්පත් අංකය : PCT/IB/2011/051395)

පේටන්ට් උපකරණ අංශය ජාතික විද්‍යා පදනමෙහි වෙබ් අඩවිය ඔස්සේ ස්ථාපනය කරන ලද අතර නිෂ්පාදකයින්ට පේටන්ට් දත්ත පාදක සෙවුම් සිදු කිරීමට සහ PCT අයදුම්පත් මාර්ගගතව ගොනු කිරීමට තාක්ෂණ අංශය තුළ පහසුකම් සලසන ලදී.

### 5.6 පේටන්ට් කිරීම, දීර්ඝ කිරීම සහ පේටන්ට් කෙටුම්පත් කිරීම සඳහා මූල්‍යමය සහයෝගය ලබා දීම

මහාචාර්ය වෙරන්ජ කරුණාරත්න විසින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව "ලයිකනවලින් නව ඇල්ෆා ග්ලූකොසිඩේස් නිශේධක" සඳහා එක්සත් ජනපද පේටන්ට් පත්‍රයක් ලබා ගැනීම පිණිස අවශ්‍ය කරන එකසත් ජනපද ඩොලර් 2000ක් වන පේටන්ට් ගාස්තුව ලබා දී පේරාදෙනිය විශ්ව විද්‍යාලයට ජාතික විද්‍යා පදනම මූල්‍යමය වශයෙන් උපකාර කළාය.

## 6. තාක්ෂණය සොයා යෑමේ යාන්ත්‍රණවලට පහසුකම් සැපයීම

### 6.1 නිමකරන ලද ජාතික විද්‍යා පදනම් ව්‍යාපෘති සියල්ලෙහි පසු ක්‍රියාකාරකම් / ව්‍යාපෘති ප්‍රතිඵල ව්‍යාප්ත කිරීම

තාක්ෂණ අංශය මගින් 2010 දී නිමකරන ලද ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ ප්‍රදාන අවසන් වාර්තා 41ක් පසු ක්‍රියාකාරකම් සඳහා අධ්‍යයනය කරන ලදී. නිමකරන ලද පර්යේෂණ ප්‍රදානවල ප්‍රතිඵල පහත සඳහන් පරිදි කාණ්ඩ කරන ලදී.

| | | |
|---|---|---|
| 1. | ප්‍රකාශන පමණක් | ප්‍රදාන 22යි |
| 2. | ප්‍රදානලාභියා තවදුරටත් පර්යේෂණ කළ යුතු කරුණු හඳුනාගෙන ඇත | ප්‍රදාන 10යි |
| 3. | පේටන්ට් ලබාගෙන ඇත | ප්‍රදාන 02යි |
| 4. | IP ආරක්ෂාව ලබා ගත හැකි විභවය සහිත | ප්‍රදාන 02යි |
| 5. | මූලාකෘති/නිෂ්පාදන සංවර්ධනය/පරිමාණය පුළුල් කිරීමේ ව්‍යාපෘති පිළිබඳ පසු කටයුතු | ප්‍රදාන 06යි |
| 6. | IP/ නිෂ්පාදන වාණිජකරණය කිරීමට හැකියාව ඇති - | ප්‍රදාන 02යි |
| 7. | පරීක්ෂා කිරීමේ පහසුකම/සේවය සැපයීම - | ප්‍රදාන 01යි |

තාක්ෂණ අංශය ප්‍රදාන 09ක් සඳහා පසු කටයුතු සූදානම් කළාය.

### 6.2 තාක්ෂණ දත්ත බැංකුව

වාණිජ හා කර්මාන්ත දෙපාර්තමේන්තුවට සම්බන්ධ ප්‍රදර්ශනවලින් (ප්‍රෝෆුඩ් ප්‍රෝපැක්, කන්ස්ට්‍රක්ට් 2011) ලබා ගත් තොරතුරු සමගින් දත්ත බැංකුව යාවත්කාලීන කරන ලදී. සමාගම් 5000ක පමණ විස්තර දත්ත බැංකුවෙහි අන්තර්ගත වේ.

### 6.3 "ටෙක්වොච් ලංකා" ඉ - ප්‍රවෘත්ති පත්‍රිකාව

"ටෙක්වොච් ලංකා" ඉ - ප්‍රවෘත්ති පත්‍රිකාවේ ජූනි සහ දෙසැම්බර් කලාප නිකුත් කරන ලදී. ආහාර විද්‍යාව සහ තාක්ෂණය, වෛද්‍ය විද්‍යාව සහ ඖෂධ, ජෛව තාක්ෂණය, නැනෝතාක්ෂණය, කසළ කළමනාකරණ තාක්ෂණ, සහ දියුණු කළ ද්‍රව්‍ය යන ක්ෂේත්‍ර පිළිබඳ ලියැවුණු ලිපි මෙම ඉ - ප්‍රවෘත්ති පත්‍රිකාවේ අන්තර්ගත වේ.

## 7. දැනුම් පදනම සංවර්ධනය

### 7.1 ශ්‍රී ලංකා ජාතික නවෝත්පාදක සමීක්ෂණය (SLNIS - 1) - 2010 සිට අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

වසර අවසානය වන විට දෙවන ප්‍රශ්නාවලියට (Q2) සමාගම් 42ක් ප්‍රතිචාර දක්වා තිබුණු අතර දත්ත වගුගත කරන ලදී. සමීක්ෂණය සිදු කෙරෙමින් පවතී.

### 7.2 පේටන්ට් කොමිස් සහ දේශීය පර්යේෂණ හා සංවර්ධන ආයතන මගින් තාක්ෂණය පැවරීම පිළිබඳ අධ්‍යයනය

ප්‍රශ්නාවලියක් සකස් කොට පර්යේෂණ හා සංවර්ධන ආයතන 33කට යවන ලද අතර 21කින් ප්‍රතිචාර ලැබී තිබුණි.

## 8. වෙනත් කටයුතු

### 8.1 සයිනොටෙක් ඇලර්ට්

2011 වසර සඳහා නිකුතු 12ක් මුද්‍රා හරින ලදී.

“සයිනොටෙක්” පාඨක සමීක්ෂණ වාර්තාව සකස් කොට කළමනාකරණ මණ්ඩලය වෙත භාර දෙන ලදී.

### 8.2 තාක්ෂණ වෙළෙඳපොළ

BMICHහි ඔක්තොම්බර් 24 – 25 දෙදින තුළ පවත්වනු ලැබූ “තාක්ෂණ වෙළෙඳපොළ” සඳහා ජාතික විද්‍යා පදනම සහභාගි විය. ජාතික විද්‍යා පදනම මගින් ප්‍රධානය කරන ලදුව සාර්ථක ලෙස නිමකරන ලද තාක්ෂණ ප්‍රදානවල නිෂ්පාදන මූලාකෘති/මොඩියුල ජාතික විද්‍යා පදනම් ප්‍රදර්ශන කුටියෙහි ප්‍රදර්ශනය කරන ලදී. බුද්ධිමය දේපළ ආරක්ෂණය සඳහා ජාතික විද්‍යා පදනම ලබා දෙන සහයෝගය පිළිබඳව කර්මාන්ත අංශය දැනුවත් කිරීමට ජාතික විද්‍යා පදනමේ ප්‍රදර්ශන කුටිය තුළ පේටන්ට් උපකාරක අංශයක් සූදානම් කරන ලදී.

පෝස්ටර් ඉදිරිපත් කිරීම් සහ අත් පත්‍රිකා මගින් අදාළ අංශයේ කටයුතු කරන්නන් සහ වෙනත් කර්මාන්ත වෙත නැඹුරු වූ සේවා සපයන්නන් හට තාක්ෂණ ප්‍රදාන පිළිබඳව දැනුම්වත් කිරීම සිදු කරන ලදී.

- **ජාතික කමිටු**

තාක්ෂණ අංශය පහත සඳහන් ජාතික කමිටු සමායෝජනය කළාය.

- නවෝත්පාදනය සහ තාක්ෂණ - ව්‍යවසායකත්වය පිළිබඳ ජාතික කමිටුව
- නැනෝ තාක්ෂණය පිළිබඳ ජාතික කමිටුව
- දියුණු කළ ද්‍රව්‍ය පිළිබඳ ජාතික කමිටුව
- රොබොටික්ස්, දියුණු කළ සැලසුම් සහ නිෂ්පාදන පිළිබඳ ජාතික කමිටුව
- ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ ICT පිළිබඳ ජාතික කමිටුව
- ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ නිෂ්පාදනය පිළිබඳ ජාතික කමිටුව
- ජෛව තාක්ෂණය පිළිබඳ ජාතික කමිටුව

2012 වසර සඳහා කාර්ය සැලසුම් සකස්කොට නිම කරන ලදී.

- **නවෝත්පාදනය සහ තාක්ෂණ - ව්‍යවසායකත්වය පිළිබඳ ජාතික කමිටුව**

රැස්වීම් 07ක් පවත්වන ලදී. කාර්ය සැලැස්මක් සකස් කොට 2011 ඔක්තෝම්බරයේ පැවැත්වුණු සභාපතිවරුන්ගේ රැස්වීමේදී ඉදිරිපත් කරන ලදී.

- **දියුණු කළ ද්‍රව්‍ය පිළිබඳ ජාතික කමිටුව**

කමිටු රැස්වීම් හයක් (06) 2011 වසර තුළ පවත්වන ලද අතර එයට අදාළ 2011 -2012 වසර සඳහා කාර්ය සැලැස්ම නිමකරන ලදී. ශ්‍රී ලංකාවේ දියුණු කළ ද්‍රව්‍ය හැකියාව අත්පත් කරගැනීමට අවශ්‍ය කෙරෙන ඉදිරි ගමන් මගෙහි දළ පිටපතක් සකස් කිරීම සිදු කෙරෙමින් පැවතුණි.

දියුණු කළ ද්‍රව්‍ය භාවිත කළ හැකි විභවයක් පවතින ශ්‍රී ලාංකීය කර්මාන්ත හඳුනා ගැනීමට කර්මාන්ත විමර්ශනයක් සිදු කරන ලදී, කර්මාන්තකරුවන් සහ අදාළ ක්ෂේත්‍රයේ කටයුතු කරන්නන් අතර දියුණු කළ ද්‍රව්‍ය පිළිබඳ දැනුවත්භාවයක් ඇති කරලීම පිණිස විභවයක් ඇති කර්මාන්ත සඳහා "දියුණු කළ ද්‍රව්‍ය: දේශීය කර්මාන්ත සඳහා ප්‍රතිලාභ සහ අවස්ථා යන මැයෙන් සම්මන්ත්‍රණයක් 2011 නොවැම්බර් 26 වන දින ජාතික විද්‍යා පදනමේ ශ්‍රවණාගාරයේ දී මෙම කමිටුව මගින් සංවිධානය කරන ලදී. කර්මාන්ත අංශය නියෝජනය කරමින් 27 දෙනෙක් ඊට සහභාගි වූහ.

## ප්‍රදාන ප්‍රතිඵල

1. **ප්‍රදාන අංකය** : **RG/2006/TFRD/01**

**ව්‍යාපෘති මාතෘකාව** : කිරි ආශ්‍රිත ගොවිපළ පද්ධතිවල කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම මගින් ග්‍රාමීය ප්‍රජාවේ ජීවන මට්ටම වැඩිදියුණු කිරීම

**ප්‍රදාන ලාභියා** : මහාචාර්ය එච්.ඩබ්. සිරිල්, සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය

**ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද ස්ථානය :**

1. සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය
2. සරසවිගම, මහකන්ද, ගලන පාර, පේරාදෙනිය

**ව්‍යාපෘතියේ අරමුණු** :

- කිරි ආශ්‍රිත ගොවිපළ පද්ධති වැඩිදියුණු කිරීමට පර්යේෂණ සොයා ගැනීම් යොදා ගැනීම
- දන්නා තාක්ෂණය යොදා ගැනීම සහ සහභාගිත්ව ප්‍රවේශය මගින් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම
- ගොවි ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම

**ව්‍යාපෘතියේ නිමැවුම් / ප්‍රතිඵල**

- දර්ශනපති (M.Phil) නිබන්ධය
- ඉහළ නැංවුණු කිරි නිෂ්පාදනය
- ගුණත්වය වැඩි දියුණු කරන ලද කිරි (බැක්ටීරියා සංයුතිය අඩු කරන ලද)
- රෝග නොමැති නිරෝගිමත් සතුන්
- අඩුකරන ලද පැටවුන්ගේ මරණ අනුපාතිකය
- ඉහළ නැංවූ ගොවි ආදායම
- මනා ගව කළමනාකරණ පුරුදු පිළිබඳ ගොවීන්ගේ ඉහළ නැංවුණු දැනුම්වත්භාවය සහ පුරුදු



ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර
ගව ගාලක්



ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමෙන් අනතුරුව
ගව ගාලක්

**2.** **ප්‍රදාන අංකය** : **RG/2006/TFRD/04**

**ව්‍යාපෘති මාතෘකාව** : සත්ව ආහාරයක් ලෙස රනිලමය පත්‍ර ආහාර කැටයක් සැකසීම

**ප්‍රදාන ලාභියා** : මහාචාර්ය එස්. ප්‍රේමරත්න, සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව, කෘෂි විද්‍යා පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය

**ව්‍යාපෘතිය සිදුකරන ලද ස්ථාන** : කෘෂිකර්ම පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය, පේරාදෙනිය හා පොල් පර්යේෂණ ආයතනය



පත්‍ර ආහාර කැටය සැකසීම සඳහා
ප්‍රයෝජනවත් වූ යන්ත්‍රය

**ව්‍යාපෘතියේ අරමුණු :** සත්ව ආහාරයක් ලෙස රනිලමය පත්‍ර කැටයක් (LM) සකස් කිරීම

**ව්‍යාපෘති නිමැවුම් / ප්‍රතිඵල :**

- දර්ශනපති (M.Phil) නිබන්ධය
- *ග්ලිරිසීඩියා*, පොල් සහ සහල් නිවුඩු භාවිත කිරීමෙන් *ග්ලිරිසීඩියා* පත්‍ර ආහාර කැටයක් නිෂ්පාදනය කිරීමට ප්‍රශස්තකරණය කරන ලද වට්ටෝරුවක්
- *ග්ලිරිසීඩියා* පත්‍ර කැට සැකසීම සඳහා ක්‍රමවේදයක්
- සත්ව ආහාරයක් ලෙස ග්ලිරිසීඩියා පත්‍ර ප්‍රශස්ත පරිභෝජනය පිළිබඳ ගොවීන් අතර ඉහළ නංවන ලද දැනුම්පත් භාවය

**3.** **ප්‍රදාන අංකය** : **RG/2007/W & E/03**

**ව්‍යාපෘති මාතෘකාව** : සායම් සංවේදී කළ සූර්ය කෝෂ ප්‍රායෝගිකව භාවිත කළ හැකි උපකරණ (DSSC) සැකසීම පිණිස සූක්ෂම අධ්‍යයනය

**ප්‍රදාන ලාභියා** : ආචාර්ය වී.පී.එස්. පෙරේරා, රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, විවෘත විශ්ව විද්‍යාලය

**ව්‍යාපෘතියෙහි විද්‍යාත්මක විෂය පථය :**
මෙම ව්‍යාපෘතිය සායම් සංවේදී කළ ප්‍රභා විද්‍යුත් රසායනික සූර්ය කෝෂ සහ ඝන අවස්ථා සූර්ය කෝෂ සම්බන්ධ ගැටළු ආමන්ත්‍රණය කරයි. මෙම විමර්ශනයේදී DSSC හා සම්බන්ධ දැනට පවත්නා ගැටළු නිරාකරණය කර ගැනීමට සහ විද්‍යාඥයින්ට ඉතාමත් අපැහැදිලි අහිතකර සිදුවීම් වටහා ගැනීමට ප්‍රයත්නයක් දරණ ලදී.

**ව්‍යාපෘතියේ අරමුණු :**

- විද්‍යුත් විච්ඡේදක කාන්දුව සහ සායම් බිඳ වැටීම පිළිබඳ ගැටළුව විසඳීම
- ප්‍රභා විද්‍යුත් රසායනික සූර්ය කෝෂ සඳහා ලෝහ රාමු සැකසීම
- DSSCවල ප්‍රභාවෝල්ටීයතාවය සහ ප්‍රකාශ ධාරා බිඳ වැටීමට හේතුව පිළිබඳ කරුණු සලකා බැලීම
- ඝන අවස්ථාවේ DSSCවල ඉහළ ප්‍රතිසංයෝජන වේගයට හේතුව හඳුනා ගැනීම

**සොයා ගැනීම් / ව්‍යාපෘති නිමැවුම්**

- දර්ශනපති (M.Phil) උපාධිය
- DSSCවල විද්‍යුත් විච්ඡේදකවල කාන්දුවීම වැළැක්වීමට ක්‍රමයක්
- විද්‍යුත් විච්ඡේදක පිරියාම සහ වාෂ්පීකරණය වැළැක්වීමට ක්‍රමයක්
- ක්ෂමතාභායනය වළක්වා ගැනීමට විශාල ක්ෂේත්‍ර සූර්ය කෝෂවල CTO වීදුරුවල තහඩු ප්‍රතිරෝධීතාවය අඩු කිරීමට ක්‍රමයක්
- ආරෝපණ වාහක ප්‍රතිසංයෝජනයට මග පාදන නැනෝ සඵටික අර්ධ සන්නායක පටලවල පෘෂ්ටය මත සහ කණිකා සීමාවල ග්‍රහණ තත්ව ඇතිවීම ප්‍රකාශ වෝල්ටීයතාවය සහ ඉන් අනතුරුව ප්‍රකාශ ධාරාව බිඳ වැටීමට හේතුව ලෙස හඳුනා ගැනීම
- ඉහළ විසරණ සංගුණකයක් තිබුණ ද ඝන තත්ව කෝෂවල ඉලෙක්ට්‍රෝන ජීවිත කාලය කෙටි බව සාක්ෂාත් වීම

4. **ප්‍රදාන අංකය** : **RG/2007/SI/02**

**ව්‍යාපෘති මාතෘකාව** : සංඥා මීටරයක් සැලසුම් කිරීම සහ සෑදීම

**ප්‍රදාන ලාභීන්** : ආචාර්ය කේ.ඞී.ආර්.ජගත් කුමාර, ආචාර්ය ඒ.යූ.ඒ.ඩබ්. ගුණවර්ධන, සහ ආචාර්ය දිසාල උඩවැවල

**අරමුණ** : ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේදී සකස් කළ හැකි පුළුල් පරාස RF ශක්ති/ක්ෂමතා මීටරයක් සැලසුම් කිරීම

**ව්‍යාපෘති නිමැවුම්** : ප්‍රධාන මොඩියුල තුනකින් එනම්, සංඥා ලබා ගන්නා සහ ශක්ති නිමානය කරන මොඩියුලයක්, ක්ෂුද්‍ර තරංග ඉහළ/පහළ පරිවර්තකයක් සහ නිවැරදි සැහැල්ලු වූ පුළුල් පරාස ඇන්ටනාවක් යන මොඩියුලවලින් සමන්විත මෙගා හර්ට්ස් 300 – 1300 දක්වා සංඛාත පරාසයක් සඳහා ආරම්භක මූලාකෘති සකස් කරන ලදී. ව්‍යාපෘති කාලය තුළ දී පහත සඳහන් මූලාකෘති සකස් කොට පරීක්ෂා කරන ලදී.

- ප්‍රතිබිම්බ හරණයත් සමග UHF ගිගාහර්ට්ස් 2.7 දක්වා ඉහළ පරිවර්තනය කිරීම සඳහා ක්ෂුද්‍ර තරංග පරිපථය
- USB සංඥා කියවනය සහ ප්‍රදර්ශකය
- මෙගාහර්ට්ස් 5 සංඛ්‍යාංක ඔරලෝසුව
- පුළුල් පරාස රැහැන් ඇන්ටෙනාව
- සංඛ්‍යාත ඔටෝ ස්කෑනරය
- මෙගාහර්ට්ස් 01 උච්ඡ ප්‍රතිග්‍රාහක විකාශන යන්ත්‍රය

මෙම ව්‍යාපෘතිය නිම කිරීම මගින් පුළුල් පරාස ක්ෂුද්‍ර තරංග පරිපථ සහ ඇන්ටෙනා මෙන්ම උච්ඡ වේග සංඛ්‍යාංක පරිපථ පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ DEEE විද්‍යාගාරය තුළ සකස් කළ හැකි බව අවබෝධ විය.



1වන අදියරෙහි පරිවර්තන ප්‍රතිග්‍රාහක මිණුම්

**5.** **ප්‍රදාන අංකය** : **RG/2007/SI/03**

**ව්‍යාපෘති මාතෘකාව** : උස සීරු මාරු කළ හැකි පොල් කඩන දණ්ඩ

**ප්‍රදාන ලාභියා** : එච්.එම්. සුගතදාස මයා, සමගි ඉන්ඩස්ට්‍රීස්, කුඹුක් වැව, නෑගම්පහ

**අරමුණ** :
අඩි 8 – 10 සිට අඩි 60 – 80 දක්වා විවිධ උස පරාසයකින් පිහිටි පොල් හෝ වෙනත් පලතුරු වර්ගයක් හෝ නෙලා ගැනීම සඳහා උස සීරු මාරු කළ හැකි පොල් කඩන දණ්ඩක් සැකසීම

**ව්‍යාපෘති නිමැවුම්** :
වර්තමානයේ භාවිත කෙරෙන උණ බම්බු/ලී සමග සන්සන්දනය කරන විට එච්.එම්. සුගතදාස මහතා විසින් නිර්මාණය කරන ලද උස සීරු මාරු කළ හැකි පොල් කඩන දණ්ඩ පරිසර හිතකාමී මූලාකෘතියක් ලෙස හැඳින්විය හැකිය. එහි තාක්ෂණික හැකියාව ද සතුටුදායක මට්ටමක පවතින අතර බුද්ධිමය දේපළ හිමිකම මගින් මෙම සංකල්පයට ආරක්ෂාවක් ලබා දීම සඳහා සලකා බලමින් පවතී.

**6.** **ප්‍රදාන අංකය** : **RG/2008/SI/01**

**ව්‍යාපෘති මාතෘකාව** :
රට අභ්‍යන්තරයේ ජල මාර්ගවල ප්‍රවාහනය සඳහා පරිසර හිතකාමී මෝටර් බෝට්ටුවක් නිෂ්පාදනය කිරීම.

**ප්‍රදාන ලාභියා** : ජී.අයි. කරුණාතිලක මයා, දෙමෝදර පාර, දේවමුල්ල, ගෝවින්න.

**අරමුණ** :
ඉවුර ආශ්‍රිත පරිසර පද්ධතියට හානියක් නොකර රට අභ්‍යන්තරයේ පිහිටි ජල මාර්ගවල භාවිතය සඳහා ආරක්ෂිත මෝටර් බෝට්ටුවක් සැලසුම් කිරීම සහ සෑදීම

**ව්‍යාපෘති නිමැවුම** :
මගීන් 50 දෙනෙකු ප්‍රවාහනය කළ හැකි ආරක්ෂිත මෝටර් බෝට්ටුවක් ජී.අයි. කරුණාතිලක මහතා විසින් සාදා නිම කර ක්ෂේත්‍ර පරීක්ෂාව ද සිදු කොට ඇත. මෙම මෝටර් බෝට්ටුව පරිසර හිතකාමී සහ ගං ඉවුර ආශ්‍රිත පරිසර පද්ධතිය කෙරෙහි සිදු කෙරෙන බලපෑම අවම බවට නිර්මාපකයා සහතික වේ.






කළුතර, කළු ගඟේ 'පරිසර හිතකාමී මෝටර් බෝට්ටුව' දියත් කිරීම

# ජාත්‍යන්තර සබඳතා අංශය (ILD)

## 1. විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් හැකියාව ඉහළ නැංවීම

### 1.1 ජාතික විද්‍යා පදනමේ චාරිකා ප්‍රදාන

මෙම වැඩසටහනෙහි අරමුණු වන්නේ, පර්යේෂණ සොයාගැනීම් ජාත්‍යන්තර සංසදවලදී ඉදිරිපත් කිරීමට, නව සොයාගැනීම්, ජයග්‍රහණ සහ සංවර්ධනයන් පිළිබඳව විද්‍යාත්මක දැනුම ලබා ගැනීමට සහ ජගත් ප්‍රයත්නවලදී අත්දැකීම් ලබා ගැනීමට ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ට අවස්ථාවක් සැපයීමය. 2011 වසර තුළ දී ජාතික විද්‍යා පදනම 2010 වර්ෂයේ ප්‍රදාන 06ක් සඳහා වූ රු.මිලියන 0.5ට එදිරිව, රු.මිලියන 7.7ක් වැයකර චාරිකා ප්‍රදාන 37ක් සපයා ඇත.

### 1.2 විදේශීය පුහුණු වැඩසටහන් (OSTP)

විදේශවල ඇති විශිෂ්ට ගණයේ ආයතනවල ඉහළ මට්ටමේ විද්‍යාගාර සහ පර්යේෂණ නිපුණතා, කාර්මික හා තාක්ෂණික අත්දැකීම් සහ විද්‍යාව ඉගැන්වීමේ සහ සන්නිවේදනය කිරීමේ නිපුණතා ලබා ගැනීමට පුහුණුවීමේ අවස්ථා සම්පාදනය කරමින් විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදනය යන අංශවල හෝ ජාතික මට්ටමේ හැකියා ඉහළ නැංවීම අරමුණු කොටගෙන, 2011 වර්ෂය තුළ දී OSTP අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

ශ්‍රී ලංකාව සඳහා වන, විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදන ක්‍රමෝපායෙහි හඳුනා ගත් ප්‍රමුඛතා ක්ෂේත්‍රවලට වැඩි අවධානයක් යොමු කරමින්, ශාස්ත්‍රීය අංශවල, පර්යේෂණ ආයතනවල, රාජ්‍ය අංශවල හෝ කර්මාන්ත අංශවල හෝ විද්‍යාඥයින් සහ තාක්ෂණ නිලධාරීන් සහ අදාළ අංශවල මාධ්‍ය කටයුතු හා සම්බන්ධ පුද්ගලයින් මෙම වැඩසටහන යටතේ ඉලක්ක කෙරේ.

ජාතික විද්‍යා පදනම 2011 වසර තුළ රු. මිලියන 1.8ක් වැය කරමින් OSTP (අයදුම්පත් 29ක් අතරින්) ප්‍රදාන 21ක් සපයා ඇත.

### 1.3 තරුණ විද්‍යාඥයින් සඳහා වාර්ෂික TWAS/NSF සම්මානය

ජෛව විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය සහ භෞතික විද්‍යාව යන ක්ෂේත්‍රවල සිදු කරන ලද පර්යේෂණවල ඉහළ තලයේ විශිෂ්ටත්වයකට ළඟා වූ දක්ෂතාවයෙන් හෙබි තරුණ විද්‍යාඥයින් සඳහා ජාතික විද්‍යා පදනම, තෙවන ලොව විද්‍යා ඇකඩමිය TWAS සමග එක්ව සම්මාන ප්‍රදානය කිරීම සඳහා වැඩසටහනක් සකස් කොට ඇත. සෑම සම්මානයක්ම තෙවන ලොව විද්‍යා ඇකඩමිය මගින් ප්‍රදානය කෙරෙන එක්සත් ජනපද ඩොලර් 20000කට සම වන මුදල් ත්‍යාගයකින් ද, ජාතික විද්‍යා පදනම මගින් ප්‍රදානය කෙරෙන සහතිකයකින් ද සමන්විතය.

මෙම සම්මාන ලබා දීමෙන් අදහස් කරන්නේ, දක්ෂතාවයෙන් හෙබි තරුණ විද්‍යාඥයින් හට තම පර්යේෂණ කටයුතුවල ඉහළ තලයේ විශිෂ්ටත්වයකට ළඟා වීමට දිරි දීමත්, එසේ විශිෂ්ටත්වයට ළඟාවූවන් ඇගයීමකට ලක් කිරීමත් ය. 2011 සම්මානය සඳහා අයදුම්පත් 08ක් ජාතික විද්‍යා පදනම වෙත ලැබී තිබුණි. එහෙත්, ඉන් එකදු අයදුම්කරුවෙක්වත් 2011 වාර්ෂික TWAS/NSF සම්මානය සඳහා සුදුසුකම් ලැබුවේ නැත.

## 2. ජාත්‍යන්තර සහයෝගීතාවය

නිරන්තරයෙන්ම, සහයෝගීතාවය මතින් වඩා යහපත් ප්‍රතිඵල ලැබුණු අතර වඩා පුළුල්, ජාතික හා අන්තර්ජාතික විද්‍යාත්මක ප්‍රජාවට ජාත්‍යන්තර සහයෝගිතා අංශයෙහි කටයුතු මගින් පෘථුල සේවයක් සපයනු ලැබීය.

## 2.1 ස්ටෙපාන් (STEPAN)

### 2.1.1 "ජාතික නවෝත්පාදන පද්ධති : මෙහෙයුම් ක්‍රමෝපාය සහ කළමනාකරණ අංශ" පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව සහ නොනිල කළමනාකරණ මණ්ඩල රැස්වීම

"ජාතික නවෝත්පාදන පද්ධතිය : මෙහෙයුම් ක්‍රමෝපාය සහ කළමනාකරණ අංශ" පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව 2011 නොවැම්බර් 2 - 3 යන දෙදින තුළ කොළඹ, ගලධාරී හෝටලයේ දී පවත්වනු ලැබුණි.

තායිලන්තය, කොරියාව, චීනය, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, මාලදිවයින, පාකිස්ථානය, මැලේෂියාව, පිලිපීනය, ඉරානය සහ ශ්‍රී ලංකාව යන සාමාජික රටවල් 11ක් මෙම වැඩමුළුවට සහභාගි විය.

යුනෙස්කෝ - ප්‍රංශය සහ යුනෙස්කෝ - ජකර්තා නිලධාරීන් ද ඇතුළත්ව 50 දෙනෙක් පමණ මෙම වැඩමුළුවට සහභාගි විය.

ජාතික නවෝත්පාදන පද්ධතිය, එහි පර්යේෂණ ක්‍රමවේද, විශ්ලේෂණය, විශ්ලේෂණ ක්‍රම භාවිතය සහ විවරණය යනාදිය පිළිබඳ සංකල්පය මනා ලෙස වටහා ගැනීම සහ වෙනත් රටවල සාර්ථක අත්දැකීම්වලින් පාඩම් උගෙන ගැනීම අරමුණු කොටගෙන මෙම වැඩමුළුව පවත්වන ලදී.

පළමු දිනයේ (2011.11.02) දෙවන සැසිය අවසන් වීමෙන් අනතුරුව ස්ටෙපාන්හි කළමනාකරණ රැස්වීමක්, සභාපතිනිය නොමැතිවීම හේතුකොට ගෙන, නොනිල මට්ටමින් පවත්වන ලදී. යුනෙස්කෝ-ජකර්තාහි මසාමි නකාටා සහ ජාත්‍යන්තර සබඳතා අංශයෙහි ප්‍රධානී අනුෂා අමරසිංහ යන මහත්මීන් මෙම රැස්වීමේ මැදිහත්කරුවන් ලෙස ක්‍රියා කළහ.

## 2.2 සාර්ක් (SAARC)

### 2.2.1 සාර්ක් සංවිධානයේ සිව්වන රැස්වීම

ජෛව තාක්ෂණය පිළිබඳ වැඩ කණ්ඩායම් සිව්වන රැස්වීම 2011 අප්‍රේල් 27වන දින කොළඹ, ගලධාරී හෝටලයේ දී පවත්වනු ලැබීය. ඇෆ්ගනිස්ථානය, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, නේපාලය සහ ශ්‍රී ලංකාව යන සාමාජික රටවල් හය මෙම රැස්වීම නියෝජනය කළේය. සාර්ක් ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ද මෙම රැස්වීමට සහභාගි විය. තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්වරිය වන ධාරා විජේතිලක මහත්මිය කාර්ය සැසිවල මුලසුන දැරුවාය. 2009 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පවත්නා ලද ජෛව තාක්ෂණය පිළිබඳ වැඩ කණ්ඩායමේ තෙවන රැස්වීම් වාර්තාවෙහි අන්තර්ගත නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විචාරයකට ලක් කළ ආරාධිතයෝ නිර්දේශ ඉදිරිපත් කළහ.

## 2.3 විද්‍යාත්මක සංගම් සඳහා ජාත්‍යන්තර සභාව (ICSU)

ජාතික කමිටුවේ සභාපති, ආචාර්ය එම්.සී.එන්. ජයසූරිය, 2011 අප්‍රේල් 16 සිට 18 දක්වා පැවති ආසියානු සහ පැසිෆික් කලාපය සඳහා වූ ICSU-UNESCO Rio+20 ප්‍රාදේශීය විද්‍යා හා තාක්ෂණ වැඩමුළුවට සහභාගි විය.

සමාජය, ආර්ථිකය සහ පරිසරය මත ධනාත්මක බලපෑමක් ඇති කළ හැකි මතුව එන සහ උත්පාදනය වෙමින් පවතින තාක්ෂණ සඳහා ගැනීමට බලවත් මෙවලමක් ලෙස පෙරදැක්ම යොදාගැනීම පිළිබඳ වැඩමුළුව 2011 ඔක්තොම්බර් 27 – 29 දක්වා පවත්වන ලදී. මෙම වැඩමුළුව තාක්ෂණ අංශයේ සහයෝගය ඇතිව සංවිධානය කෙරුණි. සම්පත් දායකයින් වන මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලයේ ආචාර්ය ඔසාකාන් සාරිටස් සහ ඕස්ට්‍රියාවේ එල්ක් ඩාල් මහත්මිය වැඩමුළුව සඳහා සම්පත් දායකයින් ලෙස ICSU මගින් හඳුනා ගනු ලැබූහ.

පෙරදැකුම් කටයුතු සංවිධානයට, කළමනාකරණයට සහ අධීක්ෂණයට සමත් දේශීය සම්පත් දායක කමිටුවක් ඇති කිරීමට පවත්වනු ලැබූ මෙම වැඩමුළුවට විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ සේවයේ නියතු සහ වයස 35 – 40 අතර වූ 30 දෙනෙක් පමණ සහභාගි වූහ.

## 2.4 ශ්‍රී ලාංකීය විද්‍යාඥයින්ගේ ජගත් සංසදය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව : ජාලකරණය සහ දැනුම බෙදා ගැනීම මගින් ශ්‍රී ලංකාව බලාත්මක කිරීම - 2011 දෙසැම්බර් 13 - 15

**අප රටේ පශ්චාත් ගැටුම්**

ආර්ථිකයට සහ සමාජ සංවර්ධනය සඳහා රටින් බැහැරව සිටි විද්‍යාඥයින්ගේ දැනුම යොදා ගැනීමට ශ්‍රී ලාංකීය විද්‍යාඥයින්ගේ ජගත් සංසදය, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශ විෂයපථය යටතේ, යුනෙස්කෝවේ සහයෝගය ඇතිව, ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කළාය. මෙම සංසදයේ ප්‍රධාන අරමුණු අතරින් එකක් වූයේ, ජාතියේ සංවර්ධනය උදෙසා තාක්ෂණයේ ඉදිරි ගමන සඳහා ශක්තිමත් බන්ධුතා පිහිටුවීම සහ ජාල සැකසීම පිණිස රටින් බැහැරව සිටින දේශීය විද්‍යාඥයින් එක් තැනකට ගෙන ඒමයි.

වර්තමානයේ අපනයනය කෙරෙන ශ්‍රී ලාංකීය නිෂ්පාන අතරින් උසස් තාක්ෂණය මත පදනම් වන්නේ 1.5%ක් පමණි. ශ්‍රී ලාංකීය විශේෂඥ ඥාණය සහ නවෝත්පාදනය මත පදනම්ව නව ප්‍රවණතා සමග එක්ව ගමන් කිරීම මෙන්ම නව වෙළෙපොළ අවස්ථා නිර්මාණය කිරීම පශ්චාත් - ගැටුම් සංවර්ධන සංදර්භයක් තුළ වත්මන් අවශ්‍යතාවය බවට පත්ව ඇත. එනිසා, මෙම සංසදය ආර්ථික සංවර්ධනය උදෙසා අඛණ්ඩ සහයෝගීතාවයක් ලබා ගැනීම පිණිස වූ ආයෝජනයක් විය.

**සංසදය**

රටින් බැහැරව සිටි විදේශීය විද්‍යාඥයින් 39ක්, දේශීය විද්‍යාඥයින් සහ ප්‍රතිපත්ති සාදන්නන්, රාජ්‍ය සහ පුද්ගලික අංශවල අදාළ ක්ෂේත්‍රයෙහි නියැලෙන්නන්, කර්මාන්තකරුවන් සහ ව්‍යවසායකයින් 225 දෙනෙක් කොළඹ දී 2011 දෙසැම්බර් 13, 14 සහ 15 යන දිනවල පැවති ජගත් සංසදයට සහභාගී වූහ.

සංසදය උත්සවාකාරයෙන් ආරම්භ කරන ලද්දේ තාක්ෂණ හා පර්යේෂණ ගරු අමාත්‍යතුමිය, පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය, විද්‍යාත්මක කටයුතු පිළිබඳ ගරු ජ්‍යෙෂ්ඨ අමාත්‍ය, මහාචාර්ය තිස්ස විතාරණ මැතිතුමා, යුනෙස්කෝ ජාතික කොමිසමේ මහ ලේකම්, ප්‍රීති පෙරේරා මහතා, සහ ජාතික විද්‍යා පදනමේ සභාපතිනිය හා අධ්‍යක්ෂ විසිනි.

එක්සත් රාජධානිය, එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, අයර්ලන්තය, ජපානය, හොංකොං, සිංගප්පූරුව, තායිවානය, ප්‍රංශය හා නෝර්වේ යන රටවලින් රටින් බැහැරව සිටි සහ විදේශීය විද්‍යාඥයෝ මෙම සංසදයට සහභාගි වූහ. ප්‍රථම දිනයේ උදෑසන සමාරම්භක උළෙලට වෙන් කෙරුණු අතර ඉතිරි දිනවලදී සියලු දෙනා සහභාගි වූ රැස්වීම්, මඩුලු සාකච්ඡා සහ ප්‍රධාන දේශන පවත්වන ලදී. ප්‍රතිපත්ති අංශය, සියලු දෙනා සහභාගි වූ සාකච්ඡා මගින් ආවරණය කෙරුණු අතර සාමාන්‍ය තේමා මූලික යෝග්‍යතාවයට අදාළ විද්‍යාත්මක ඉදිරිපත් කිරීම් සිදු කෙරුණි. විද්‍යාඥයින්, ආයතන සහ එවැනි ක්ෂේත්‍ර පිළිබඳව අවධානයෙන් සිටින කර්මාන්තකරුවන් සහභාගි වූ මඩුලු සාකච්ඡා වඩා විශේෂිත විද්‍යාත්මක ක්ෂේත්‍ර ඉලක්ක කර ගෙන තිබුණි.

රාජ්‍ය හා පෞද්ගලික අංශ තාක්ෂණවේදීන්, ව්‍යවසායකයින්, ව්‍යාපාරික ප්‍රජාව සහ කර්මාන්තකරුවන් සමග නව නිෂ්පාදකයින් හා විභවයක් සහිත ආයෝජකයින් එකම වේදිකාවක් මතට එක්රැස් කෙරුණු සංසදයක් වන “ඉනො-වෙස්ටර්” සඳහා සංසදයේ අවසන් දිනය වෙන් කරණු ලැබීය. ජාතික විද්‍යා පදනමෙහි මෙම උත්සාහය බොහෝ දෙනෙකු විසින් ඉහළින් අගය කරන ලද අතර මෙය එවැනි අනාගත සංසදවල පළමුවැන්න වනු ඇතැයි සුබපතන ලදී. රටේ තාක්ෂණ විද්‍යාත්මක අවශ්‍යතා පරිවර්තනයක් කරා රට රැගෙන යා හැකි තාක්ෂණයන්ට මූලාරම්භය සැපයීමට බොහෝමයක් නව මං පෙත් මතුකර දක්වමින්, සහයෝගීතාවය ශක්තිමත් කරමින් සහ නව අභියෝග කරා යොමු වන සාමූහික ප්‍රයත්නයක් ගෙනහැර දක්වමින් සිදු කරන ලද සාකච්ඡා ඉතාමත් සාර්ථක විය. සංසදය පැවැත්වෙන කාලය තුළ දී නව සොයා ගැනීම් නිරූපණය කරමින් තෝරා ගත් පෝස්ටර් රාශියක් ප්‍රදර්ශනය කරන ලදී.

**බලශක්තිය, සෞඛ්‍ය ආරක්ෂාව, කෘෂිකර්මය, සංචාරක කර්මාන්තය, පාරිභෝගික ආරක්ෂාව, අපනයන යනාදිය ඔස්සේ ආර්ථික සංවර්ධනය පිළිබඳ ඉහළ සැලකිල්ලක් සහිත ජාතික අභිරුචියක් සංසදයේ (පහත සඳහන්) තේමා මගින් පිළිබිඹු කෙරුණි.**

- නැනෝතාක්ෂණය සහ නැනෝ ද්‍රව්‍ය
- ජෛව තාක්ෂණය
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය
- හරිත බලශක්ති තාක්ෂණය

- දියුණු කළ සැලසුම් සහ නිෂ්පාදන
- ස්වභාවික සම්පත්
- ආහාර සහ ජල සුරක්ෂිතතාවය

**ප්‍රධාන නිමැවුම් පහත සඳහන් දෑ වලින් සමන්විතය.**

- විද්‍යාවෙහි විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීමට සහ දැනුම් පරතරය පියවීමට විදේශීය ආයතන/විද්‍යාඥයින් සමග හවුල් සම්බන්ධතා ගොඩනැගීම
- කර්මාන්ත දිශාභිමුඛ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම
- දේශීය විද්‍යාඥයින් විදේශ රටවල පුහුණු කිරීමට මතුව එන අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සඳහා ජාල සැකසීම
- බුද්ධිමය දායකත්වය ඉහළ නැංවීම සහ සමෝධානය කිරීමට වේදිකාවක් සැපයීම
- ඵලදායී සහයෝගීතාවයක් සඳහා දැනුම සහ තාක්ෂණය ගෙන යෑමට මග පාදන යාන්ත්‍රණවලට එකඟතාවයක් ඇති කර ගැනීම
- සහයෝගීතාවය සහිත කාර්ය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රවේශ මාර්ගයක් ස්ථාපිත කිරීම පිණිස මනා ලෙස සකස් කරන ලද සැලසුමක්

## 2.5 මිනිසා සහ ජෛව ගෝලය (MAB) පිළිබඳ ජාතික වැඩසටහන

### 2.5.1 ජෛවගෝල සංරක්ෂිතයක් ලෙස මහනුවර නාමයෝජනා කිරීම

ජෛවගෝල සංරක්ෂිතයක් ලෙස මහනුවර නාම යෝජනා කිරීමට ඇති ශක්‍යතාවය පිළිබඳ සාකච්ඡා සහ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී. නාම යෝජනා ඩොසියරය සැකසීම සඳහා උප කමිටුවක් පත් කරන ලදී.

### 2.5.2 මන්නාරම් ජෛවගෝල සංරක්ෂිතය ස්ථාපිත කිරීම

මන්නාරම් බොක්ක ජෛවගෝල සංරක්ෂිතය ස්ථාපිත කිරීමේ මූලික වැඩකටයුතු සිදු කරන ලද අතර ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර පෝක් සමුද්‍ර සන්ධියෙහි වූ ආදම්ගේ පාලම පුරා විද්‍යා ස්ථානය නිර්මාණය කිරීම සඳහා ඇති ඉඩකඩ සොයා බලන ලදී. මන්නාරම් ජෛවගෝල සංරක්ෂිතය නාම යෝජනා කිරීම පිළිබඳ කටයුතු කිරීමට සමාජිකයන් දස දෙනෙකුගෙන් යුත් උප කමිටුවක් පත් කරන ලදී.

යෝජිත ජෛවගෝල  සංරක්ෂිත ප්‍රදේශයෙහි, ජෛව විද්‍යාත්මක, පුරාවිද්‍යාත්මක හා සංස්කෘතිමය අංශ පිළිබඳ සාකච්ඡා කිරීම සහ නාමකරණ ෆෝරමයෙහි අන්තර්ගත කිරීමට අවශ්‍ය කරන තොරතුරු එකතු කිරීම යන අරමුණු සහිතව, යෝජිත මන්නාරම් ජෛවගෝල සංරක්ෂිත ප්‍රදේශය තුළ පර්යේෂණ/සමීක්ෂණ සිදු කර ඇති පර්යේෂකයින් මෙන්ම යෝජිත මන්නාරම් ජෛව සංරක්ෂිත ප්‍රදේශය පිළිබඳ සැලකිල්ලක් දක්වන විවිධ ආයතනවලට සම්බන්ධ පුද්ගලයින් 35 දෙනෙකු පමණ සම්බන්ධ වූ පළමු රැස්වීම පවත්වන ලදී.

### 2.5.3 නකල්ස් ජෛවගෝල සංරක්ෂිත නාමයෝජනාව පැරිසියේ යුනෙස්කෝව වෙත ඉදිරිපත් කිරීම

ජාත්‍යන්තර ජෙවගෝල සංරක්ෂිතයක් ලෙස නකල්ස් ජෛවගෝල සංරක්ෂිතය සඳහා වූ නාමයෝජනා කෙටුම්පතෙහි  ඩොසියරය උපදේශකවරයා විසින් සකස් කරන ලදී. සංක්‍රමණ කලාප මිනිසුන් ජීවත්වන ප්‍රදේශවීම නිසා එකී ප්‍රජාවේ ජීවන මට්ටම ඉහළ නැංවීම පිණිස සංවර්ධන කටයුතු හඳුන්වා දීමේ අවස්ථාවක් පවතින බැවින් යුනෙස්කෝවේ නව නිර්ණායකවලට අනුව ජෛවගෝල සංරක්ෂිතවලට අවකාශමය වශයෙන් අර්ථ විවරණය කරන ලද සංක්‍රමණ කලාප අන්තර්ගත කිරීම සිදු කළ යුතුවේ. යෝජිත නකල්ස් ජෛවගෝල සංරක්ෂිතයේ සංක්‍රමණ කලාපය සඳහා මායිම් හඳුනාගන්නා ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් සිදු කර ඇත. සංක්‍රමණ කලාපයෙහි මායිම් හඳුනාගැනීම සම්පූර්ණ කෙරෙන තෙක් ඉදිරිපත් කිරීම් කල් දැමීමට සිදු වී තිබේ.

### 2.5.4 උස්සන්ගොඩ භූ උද්‍යානය නාමයෝජනා කිරීම

නාමයෝජනා කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමේ මාර්ග සෙවීම සඳහා අදාළ අංශයේ නියැලෙන්නන් සමග සාකච්ඡා මාලාවක් පරිසර සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශ පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙම ප්‍රදේශය ජාතික උද්‍යානයක් ලෙස ගැසට් මගින් නිවේදනය කර ලදී. උප කමිටුව නාම යෝජනා ඩොසියරය සකස් කළාය.

# විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශය (SPD)

## 1. හැඳින්වීම

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළ “සැමට විද්‍යාව” යන තේමාව යටතේ විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශය පාසල් ප්‍රජාව සහ ජනතාව වෙත විද්‍යාව ව්‍යාප්ත කිරීම සඳහා වැඩකටයුතු මාලාවක් අඛණ්ඩව සිදු කළා ය.

**විශේෂ අවස්ථා**

- **මිහිමඬල වීඩියෝ මාලාව ජාතික සහ ජාත්‍යන්තර සම්මාන ද්විත්වයකින් පිදුම් ලැබීම.**
    - o දකුණු ආසියා 2011 මන්තන් සම්මානය
    - o ඉ - ස්වාභිමානී 2011 විශේෂ කුසලතා සම්මානය
- **පාඨශාලීය විද්‍යා සමාජ වැඩසටහන :** එක් වසරක් තුළ ලියාපදිංචි වූ ඉහළම සංඛ්‍යාව වාර්තා කරමින් පාඨශාලීය විද්‍යා සමාජ 141ක් ලියාපදිංචි කරන ලදී. ජාතික විද්‍යා පදනම සමග ලියාපදිංචි වූ දෙමළ මාධ්‍ය පාඨශාලීය විද්‍යා සමාජ සංඛ්‍යාවෙහි (87) කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි.
- **කුටුම්භ සඳහා විද්‍යාව වැඩසටහන :** රට තුළ ප්‍රථම වතාවට විද්‍යාත්මක කටයුතු පිළිබඳ අත්දැකීම් තුළින් විද්‍යාව ඉගෙන ගැනීමට ප්‍රාථමික පන්තිවල ළමුන්ට සහ ඔවුන්ගේ දෙමව්පියන් සඳහා අධ්‍යාපනික වැඩසටහනක් හඳුන්වා දෙන ලදී. හිඳගල, සීවලී මහා විද්‍යාලයේ දී වැඩසටහන පවත්වන ලදී.
- **නැනෝතාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන :** “නැනෝතාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන -1 වන අදියර” සාර්ථකව නිම කරන ලදී. වැඩමුළු හයක් මගින් දිවයිනේ සියලුම පළාත් නියෝජනය කරමින්, පළාත් විද්‍යා අධ්‍යක්ෂවරු, කලාප විද්‍යා අධ්‍යක්ෂවරු, සහ ගුරු උපදේශකවරු 315 දෙනෙකු පුහුණු කරවනු ලැබුණි.
- **ඔලිම්පියාඩ් ෆෙඩරේශනය :** රට තුළ සියලුම ඔලිම්පියාඩ් ක්‍රියාකාරකම් සම්බන්ධීකරණයට සහ ජාතික මට්ටමේ සමස්ත වගකීම් දැරීමට ශ්‍රී ලංකා ඔලිම්පියාඩ් ෆෙඩරේශනය පිහිටවනු ලැබී ය.
- **ශ්‍රී ලංකා ජාතික විද්‍යා මධ්‍යස්ථානය :** සිංගප්පූරු විද්‍යා මධ්‍යස්ථානයෙන් සපයනු ලැබූ, අත්හදා බැලීමෙන් ඉගෙන ගත හැකි ප්‍රදර්ශන භාණ්ඩ යොදාගෙන “සයන්ස් වර්ක්ස්” විද්‍යා ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී. මේ ආකාරයේ අත්හදා බැලීමෙන් ඉගෙන ගත හැකි ප්‍රදර්ශන භාණ්ඩ සමග ශ්‍රී ලංකාවේ පවත්වනු ලැබූ ප්‍රථම ප්‍රදර්ශනය මෙය වේ.
- **විද්‍යා පර්යේෂණ ව්‍යාප්ති තරඟය (SRPC) :** අවසන් තරඟය සඳහා ව්‍යාපෘති 47ක් තරඟ වදිමින් මීට පෙර වර්ෂයේ හා සසඳන විට කැපී පෙනෙන ප්‍රගතියක් SRPC පෙන්නුම් කර ඇත. ව්‍යාපෘතිවල ගුණාත්මක බව ද බොහෝ සේ ඉහළ ගොස් තිබුණි.

## 2. ප්‍රකාශන

### 2.1 විදුරාව විද්‍යා සඟරාව

විදුරාව විද්‍යා සඟරාවෙහි 28වන කලාපයෙහි (භාෂාත්‍රයෙන්ම) නිකුතු තුනම නියමිත වේලාවට ප්‍රකාශනය කරන ලදී. පිළිවෙළින්; **එදිනෙදා ජීවිතයට රසායන විද්‍යාව**, **ප්‍රවේණි විද්‍යාව: වර්තමානය සහ අනාගතය** සහ **තිරසර සංවර්ධනය සඳහා නවෝත්පාදන**, යන තේමා යටතේ මෙම නිකුතු ප්‍රකාශනය කරන ලදී. අදාළ ක්ෂේත්‍රවල නියැලි විද්‍යාඥයින් විසින් ශිෂ්‍යයින්ට වැටහෙන පරිදි සරල භාෂාවෙන් ලිපි සම්පාදනය කරන ලදී. සඟරාවෙහි 27වන කලාපයෙහි විශේෂ නිකුතුව වන **දේශගුණ විපර්යාස : අවම කිරීම සහ අනුහුරුවීම** සහ 27වන කලාපයේ දෙවන අංකය, **ජාතික සංවර්ධනය සඳහා සාගර සම්පත්** යන තේමා යටතේ දෙමළ මුද්‍රණය ද 2011 වසර තුළ දී ප්‍රකාශනය කරන ලදී. මෙම සෑම නිකුතුවකම පිටපත් ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචි පාඨශාලීය විද්‍යා සමාජවලට (440), විශ්ව විද්‍යාලයීය විද්‍යා පුස්තකාලවලට (25) සහ විද්‍යා මධ්‍යස්ථානවලට (240) බෙදා හරින ලදී.

### 2.2 විද්‍යා ප්‍රවෘත්ති පත්‍රිකාව

මෙම වසර තුළ සංවිධානය කෙරුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ වැනි ජාතික විද්‍යා පදනමෙන් සිදු කෙරුණු වැඩකටයුතුවල තොරතුරු ආවරණය කෙරෙමින් ප්‍රවෘත්ති පත්‍රිකාවේ, ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තොම්බර් යන නිකුතු ප්‍රකාශනය කරන ලදී. සමාලෝචනයට ලක්

කෙරෙන වසර තුළ දී ප්‍රදානය කෙරෙන පර්යේෂණ ප්‍රදාන, නිමකරන ලද පර්යේෂණ ව්‍යාපෘති සහ චාරිකා ප්‍රදාන පිළිබඳ තොරතුරු මෙහි අන්තර්ගත වේ. සෑම නිකුතුවකම පිටපත් 250ක් පමණ ජාතික විද්‍යා පදනම් කමිටු, විශ්ව විද්‍යාලයීය පුස්තකාල, සහ විද්‍යා හා තාක්ෂණ ආයතන අතර බෙදා හරිනු ලැබේ.

### 2.3 විද්‍යා ග්‍රන්ථ මාලාව

විද්‍යා ග්‍රන්ථ මාලාව යටතේ “ශ්‍රී ලංකාවේ ආක්‍රමණශීලි ශාක” නැමති ග්‍රන්ථය මේ වසර තුළ ප්‍රකාශනය කරන ලදී. මෙම විද්‍යා ග්‍රන්ථ මාලාවේ අරමුණ වන්නේ, මහජනතාව අතර විද්‍යා හා තක්ෂණයට අදාළ පොතපත සුලබ කිරීම ය.

## 3. පාඨශාලීය විද්‍යා සමාජ වැඩසටහන (SSS)

2011 දෙසැම්බර් 31 වන විට ලියාපදිංචි වී ඇති විද්‍යා සමාජ සංඛ්‍යාව 630ක් ලෙස වාර්තා විය. 2011 තුළ නව ලියාපදිංචිවීම් 137ක් වාර්තා විය. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් ලියාපදිංචි වූ සංඛ්‍යාව පිළිවෙළින් 53,87 සහ 01ක් විය. ලියාපදිංචි වූ දෙමළ මාධ්‍ය පාඨශාලීය විද්‍යා සමාජ සංඛ්‍යාවෙහි කැපී පෙනෙන වැඩි දියුණුවක්, 2010 වසර සමග සසඳන විට පෙන්නුම් කෙරුණි. එය 2010 වසරේ දී 03ක් වූ අතර 2011 වර්ෂයේ දී 82ක් විය.

### 3.1 පාසල් වෙත ඉටු කරන ලද සේවය - අද්‍යතන මාතෘකා යටතේ දේශන මාලාව

ලියාපදිංචි පාඨශාලීය විද්‍යා සමාජ මගින් සංවිධානය කරන ලද විද්‍යා දින 15ක් සඳහා දේශීය විද්‍යාඥයින්ගේ සේවය සපයන ලදී. මෙහි අරමුණ වූයේ, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ නවතම සංවර්ධනයන් පිළිබඳ දැනුම සිසුන් වෙත සම්පාදනය කිරීමවේ. පාසල්වලින් සිදු කරණ ඉල්ලීම්වලට අනුව, තේමා 10ක් යටතේ දේශන පවත්වන ලදී. මේ යටතේ, මිනිසා සහ පරිසරය (02), පරිසරය මත මානව ක්‍රියාවල බලපෑම (02), නැනෝ තාක්ෂණය (04), ශාක ප්‍රජා ආශ්‍රිත නිෂ්පාදන (01), අකුණු සහ හෙණ (01), වනාන්තර : සොබාදහම ඔබගේ සේවයට (01), සාගර සම්පත් (01), තොරතුරු සන්නිවේදන තාක්ෂණය (01), රසායන විද්‍යාව : අපගේ ජීවිතය සහ අනාගතය (01) සහ ජාතික විද්‍යා පදනම සහ පාසල් ප්‍රජාව (02) යන මාතෘකා ආවරණය කරන ලදී.

### 3.2 අන්තර් පාඨශාලීය විද්‍යා සමාජ තරඟාවලිය

2011 නොවැම්බරයේ පැවැත්වීමට නියමිතව තිබුණු ජගත් විද්‍ය දිනය පාසල් වැඩසටහන 2012 ජනවාරිය දක්වා කල් දමන ලදී. කෙසේ වෙතත්, මෙම වැඩසටහනට සමගාමීව පැවැත්වීමට නියමිතව තිබුණු තරඟ වසරේ තේමාව වන “තිරසර සංවර්ධනය සඳහා නවෝත්පාදන” යටතේ සැලසුම් කරන ලද ආකාරයට පවත්වන ලදී. මෙම තරඟවල අභිමතාර්ථය වන්නේ, විද්‍යා හා තක්ෂණය විවිධ ක්ෂේත්‍රවල නවතම සංවර්ධනයන් පිළිබඳ දැනුම ලබාගැනීමට ඉඩ සැලසීම මගින් පාසල් දරුවන්ගේ විද්‍යාත්මක දැනුම පෝෂණය කිරීම සහ එම දැනුම එදිනෙදා කටයුතුවල දී යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීමයි. ඉහත තේමාව යටතේ ජාතික විද්‍යා පදනමෙන් ලියාපදිංචි පාඨශාලීය විද්‍යා සමාජ අතර පහත සඳහන් තරඟ පවත්වන ලදී. ‘විද්‍යා ප්‍රබන්ධ’ තරඟය මෙවර පවත්වන ලද්දේ ප්‍රථම වතාවට ය.

- කෙටි විද්‍යා නාට්‍ය
- විද්‍යාඥ භූමිකා රංගනය
- හස්තමය පෝස්ටර්
- ඩිජිටල් කතාන්දරකරණය
- විද්‍යා ප්‍රබන්ධ

මහරගම, ජාතික අධ්‍යාපන ආයතනය (NIE ; ඔක්තොම්බර් 17) සහ හැව්ලොක් පාරේ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (ඔක්තොම්බර් 22) යන ස්ථානවල පිළිවෙළින් භූමිකා රංගන සහ කෙටි විද්‍යා නාට්‍ය අවසන් වටයේ තරඟ පවත්වන ලදී. අවසන් වටය සඳහා තරඟකරුවන් තෝරා ගනු ලැබුවේ රටේ විවිධ පළාත්වල ස්ථාන හතරක එනම්; ගාල්ල - සිරිධම්ම විද්‍යාලය, ලබුදූව, මහනුවර - මූලික අධ්‍යාපන ආයතනය, අනුරාධපුරය - විවෘත විශ්ව විද්‍යාලය, කොළඹ - ජාතික අධ්‍යාපන ආයතනය යන ස්ථානවල පවත්වනු ලැබූ දූරස්ථ වැඩසටහන් (පළමු වටයේ තරඟ) වලිනි. විනිශ්චය මණ්ඩලය, විද්‍යාඥයන්ගෙන්, මාධ්‍යකරුවන්ගෙන්, කලාකරුවන්ගෙන් සහ ජාතික විද්‍යා පදනමෙහි නියොජිතයකුගෙන් සමන්විත විය. හස්තමය පෝස්ටර්, ඩිජිටල් කතාන්දරකරණය සහ විද්‍යා ප්‍රබන්ධ යන තරඟ ජාතික විද්‍යා පදනම් පරිශ්‍රයේ දී පවත්වන ලදී. ජයග්‍රාහකයින්ගේ ලැයිස්තුව අමුණා ඇත.

### 3.3 විශිෂ්ට ලෙස ක්‍රියාත්මක වූ පාඨශාලීය විද්‍යා සමාජ සඳහා සම්මාන

පහත සඳහන් විද්‍යා සමාජ 2010 වසර තුළ දක්වන ලද විශිෂ්ට ක්‍රියාකාරිත්වය සඳහා සහතික පත්‍ර සහ සම්මානවලින් පිදුම් ලැබූහ. ලැබූ තරු සංඛ්‍යාව විශිෂ්ට ක්‍රියාකාරිත්වයේ මිණුම් දණ්ඩ විය. විද්‍යාවට සම්බන්ධ කටයුතුවල දී පාසල් සිසුන්ගේ හැකියා වැඩිදියුණු කිරීම උදෙසා සුදුසු ක්‍රියාකාරකම් සිදු කිරීම පිණිස පාඨශාලීය විද්‍යා සමාජ අභිප්‍රේරණය කිරීමේ අදහස ඇතිව මෙම වැඩසටහන වාර්ෂිකව පවත්වනු ලැබේ.

| | | |
|---|---|---|
| 1) | ශ්‍රී සංඝමිත්තා බාලිකා ජාතික පාසල, මාතලේ | තරු 05යි |
| 2) | ඩඩ්ලි සේනානායක විද්‍යාලය, කොළඹ - 05 | තරු 05යි |
| 3) | ඥානෝදය මහා විද්‍යාලය, කළුතර | තරු 05යි |
| 4) | ස්වර්ණ ජයන්ති විද්‍යාලය, කෑගල්ල | තරු 05යි |
| 5) | වික්‍රමබාහු මහා විද්‍යාලය, ගම්පොළ | තරු 05යි |
| 6) | රත්නාවලී බාලිකා විද්‍යාලය, ගම්පහ | තරු 05යි |
| 7) | හරිස්චන්ද්‍ර ජාතික පාසල, මීගමුව | තරු 04යි |

### 3.4 පාසල් ළමන් අතර විද්‍යාව ප්‍රවර්ධනය කිරීම සඳහා ගුරුවරුන්ට පිදෙන සම්මානය

පාසල් ළමුන් අතර විද්‍යාව ප්‍රවර්ධනය කිරීම සඳහා ලබා දෙන්නා වූ දායකත්වය පදනම් කොටගෙන ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචි පාඨශාලීය විද්‍යා සමාජවල ගුරුවරුන් වාර්ෂිකව ඇගයීමට ලක් කරනු ලැබේ.

2011 දී ප්‍රදානය කරන ලද 2010 වර්ෂය සඳහා ගුරුවරුන්ට පිදෙන සම්මානයේ ජයග්‍රාහිකාව වූයේ කෑගල්ල, ස්වර්ණ ජයන්ති මහා විද්‍යාලයේ ඩිලන්ති කළුආරච්චි මහත්මියයි.

ප්‍රශංසාත්මක සහතික දිනූවෝ,

1. ඩී.ඩී. ප්‍රේමකාන්ති මිය, ඩඩ්ලි සේනානායක මහා විද්‍යාලය, කොළඹ - 05
2. එච්.එච්. තිලකරත්න මයා, වික්‍රමබාහු මහා විද්‍යාලය, ගම්පොළ
3. බී.එල්. චන්ද්‍රිකා ලාලනී මිය, හරිස්චන්ද්‍ර විද්‍යාලය, මීගමුව
4. පී.ජේ.එල්.ජේ. නෝනිස් මයා, ඩිමැසනොද් විද්‍යාලය, කඳාන
5. එච්.එම්.සී. බන්දුමිනී මැණිකේ මිය, මලියදේව විද්‍යාලය, කුරුණෑගල

ඇගයීම් සහතික දිනූවෝ,

1. ඩී.ඒ. ලලිතා ද සිල්වා මිය, සිරිධම්ම විද්‍යාලය, ලබුදූව
2. එල්.ඒ.ඒ. පුෂ්පකාන්ති මිය, ශ්‍රී නිශ්ශංක මධ්‍ය මහා විද්‍යාලය, ඉඳුල්ගොඩකන්ද

### 3.5 විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා මහාචාර්ය වූ එම්.ටී.එම්. ජිෆ්රි අනුස්මරණ සම්මානය

විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශය වර්ෂ 2005දී පිහිට වූ දා සිට එහි උපදේශක මණ්ඩලයේ සභාපතිවරයා ලෙස සේවය කළ සහ පාඨශාලීය විද්‍යා සමාජ වැඩසටහන ඇතුළු විවිධ විද්‍යාත්මක වැඩසටහන් ආරම්භ කිරීමට මුල් වූ, නැසී ගිය, මහාචාර්ය එම්.ටී.එම්. ජිෆ්රි මැතිතුමාට ගෞරව කරනු වස්, "විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා වූ ජාතික සම්මානය", "විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා වූ මහාචාර්ය එම්.ටී.එම්. ජිෆ්රි අනුස්මරණ සම්මානය" ලෙස නම් කරන ලදී. ආචාර්ය තිලක් තුසිත රණසිංහ, විද්‍යාව ජනතාව වෙත ගෙන යෑම සඳහා ජාතික මට්ටමින් කරන ලද සේවාව වෙනුවෙන් ඉහත සම්මානය 2011 වසර සඳහා දිනා ගත්තේ ය.

### 3.6 නාට්‍යානුසාරයෙන් විද්‍යාව ප්‍රචලිත කිරීම පිළිබඳ ගුරුවරුන් සඳහා පුහුණු වැඩමුළුව

මූලික අධ්‍යාපන ආයතනයෙහි සහයෝගය ඇතිව, මධ්‍යම පළාතේ ගුරුවරුන් සඳහා 'නාට්‍ය අනුසාරයෙන් විද්‍යාව ප්‍රචලිත කිරීම' පිළිබඳ පුහුණු වැඩමුළුව මහනුවර, මූලික අධ්‍යයන ආයතන ශ්‍රවණාගාරයේදී 2011 ජුනි 17 දින සංවිධානය කරනු ලැබුණි. මධ්‍යම පළාතේ පාසල් 18කින් ගුරුවරුන් 25 දෙනෙක් මෙම වැඩමුළුවට සහභාගී වූහ. විද්‍යාත්මක නාට්‍ය ඉගැන් වූ ගුරුවරියක්,පොදු රාජ්‍ය මණ්ඩල සම්මානලාභිනියක් සහ ජාතික විද්‍යා පදනමෙහි ප්‍රදානලාභියෙක් වන චන්ද්‍රා වරකාදෙණිය මහත්මිය, ආචාර්ය ජයන්ත වත්තවිදානගේ සහ තුසිත මලලසේකර මහතා යන සම්පත් දායකයින් විසින් වැඩමුළුව පවත්වන ලදී.

සමාජය වෙත පහසුවෙන් සහ පිළිගත හැකි ආකාරයකට විද්‍යාත්මක සංකල්ප ගෙන යාම සඳහා නාට්‍ය භාවිතය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් මෙම වැඩමුළුවේ දී සපයන ලදී. ලබා ගත් දැනුමින් අන්තර් පාඨශාලීය විද්‍යා සමාජ තරඟවලට ඉදිරිපත් කෙරෙන කෙටි විද්‍යා නාට්‍යවල ප්‍රමිතිය ඉහළ නංවනු ඇතැයි ද, ශිෂ්‍යයින්ගේ විභව හැකියාවන් ගුරුවරුන් විසින් උපරිම අන්දමින් යොදාගනු ඇතැයි ද මෙහිදී අපේක්ෂා කෙරේ.

## 4. පාසල් ප්‍රජාව අතර විද්‍යා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම

### 4.1 විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟය

#### 4.1.1 විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟය - 2010

විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟය - 2010 ජාතික විද්‍යා පදනම් ශ්‍රවණාගාරයේ දී 2011 ජනවාරි 20 දින පවත්වනු ලැබීය. තරඟවලට පෙර, 2009 වර්ෂයේ දී, සිසුන්ට මග පෙන්වීමට සහ ව්‍යාපෘති වැඩිදියුණු කිරීමට වැඩමුළු තුනක් පවත්වන ලදී. තරඟ වැදුණු ව්‍යාපෘති 16ක් අතරින් හොඳම ව්‍යාපෘති 10, ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සන්දර්ශනය 2010 සඳහා තරඟ වැදීම පිණිස තෝරාගන්නා ලදී. මහාචාර්ය ජනිතා ලියනගේ, ආචාර්ය මයුරි විජේසිංහ, ආචාර්ය මහේෂ් එදිරිසිංහ, ආචාර්ය ජී.ඒ.එස්. ප්‍රේමකුමාර සහ විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශයේ ප්‍රධානී සුනේත්‍රා පෙරේරා මහත්මිය විසින් ව්‍යාපෘති ඇගයීම සහ මගපෙන්වීම සිදු කරන ලදී.

#### 4.1.2 විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟය - 2011

මෙම වැඩසටහන ශක්තිමත් කිරීමට සහ වැඩිදියුණු කිරීමට 2011 වසර තුළ බොහෝ ක්‍රම සහ ක්‍රමෝපාය හඳුන්වා දෙනු ලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, පසුගිය වසර හා සසඳන විට, 2011 වසරේ ඉදිරිපත් කෙරුණු ව්‍යාපෘතිවල සංඛ්‍යාව සහ ඒවායේ ගුණාත්මක බවෙහි කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි. වර්ෂ 2012 මුල් කාලය තුළ පැවැත්වීමට නියමිත අවසන් තරඟය සඳහා තෝරා ගන්නා ලද ව්‍යාපෘති සංඛ්‍යාව 2010 වසරේ ඉදිරිපත් කෙරුණු ව්‍යාපෘති සංඛ්‍යාව වන 16ට එදිරිව 47ක් විය. විද්‍යාත්මක ක්‍රමවේදය ශිෂ්‍යයින් විසින් සතුටුදායක අන්දමකට යොදා ගෙන ඇති බැවින් ඔවුන්ගේ ඉදිරිපත් කිරීමේ හැකියාව කැපී පෙනෙන ලෙස වැඩි දියුණු වී ඇති බවක් නිරීක්ෂණය කෙරුණි. ව්‍යාපෘතිවල ගුණාත්මක බව විශාල ලෙස වැඩිදියුණු කර තිබුණි.

### 4.2 ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනය (SLSEF)

#### ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනය - 2010

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, ඉන්ටෙල් EM පුද්ගලික සමාගම සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව, ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනය 2010 ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතන ශ්‍රවණාගාරයේ දී 2011 පෙබරවාරි 18 දින පවත්වනු ලැබීය. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය සංවිධානය කළ "වසරේ කනිෂ්ඨ නව නිපැයුම්කරු තරඟයෙන් (JIY)" තේරුණු නව නිපැයුම් නවයක් (09) සහ ජාතික විද්‍යා පදනම සංවිධානය කළ 'විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟයෙන් (SRPC)" තේරුණු විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති දහයක් (10) සංදර්ශනයේ දී ඉදිරිපත් කරන ලදී. ව්‍යාපෘති ඇගයීම සිදු කරන ලද්දේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) අධ්‍යක්ෂ, මහාචාර්ය රීස්වි ෂෙරිෆ්ගේ සහභාගිත්වයෙන් යුත් සමාජිකයින් හත් දෙනෙකුගේ මඩුල්ලක් මගිනි. SLSEF 2010 යෙන් තේරුණු පහත සඳහන් ව්‍යාපෘති ත්‍රිත්වය, එක්සත් ජනපදයේ ලොස් ඇන්ජලීස්හි 2011 මැයි 8 – 13 දක්වා පැවති ඉන්ටෙල් ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයේ දී තරඟ වැදුණි.

| ශිෂ්‍යයාගේ නම | ව්‍යාපෘතිය | පාසල |
|---|---|---|
| ආර්.එම්.ඒ.පී. කීර්තිරත්න | විදින කටු තෙරපනය සමග වයර් නොමැති ලේසර් මධ්‍යගතකරණ උපකරණ | විද්‍යාර්ථ මහා විද්‍යාලය, මහනුවර |
| ටී.එස්. තිලකරත්න | පරිගණක රූකවරණ වැඩසටහන | ආනන්ද විද්‍යාලය, කොළඹ - 10 |
| එච්.එම්.එන්. සචිත්තා සුබසිංහ<br>එච්.එම්.එන්. බුද්ධිනී සුබසිංහ | විවිධ පැලෑටි සාර භාවිතයෙන් කැරපොත්තන් *(Periplaneta americana)* පාලනයට වඩාත්ම ඵලදායක විකර්ශකය සොයා ගැනීම සඳහා විමර්ශනයක් | සංඝමිත්තා බාලිකා ජාතික පාසල, මාතලේ |

### 4.3 විදූනෙත වැඩසටහන

කනිෂ්ඨ ද්විතියික මට්ටමේ ශිෂ්‍යයින්ගේ (6-9 ශ්‍රේණි) විමර්ශනාත්මක හැකියාව වැඩිදියුණු කිරීමේ සහ විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීමට ඔවුන්ව උනන්දු කිරීමේ අරමුණු සහිතව විද්‍යා හා තාක්ෂණ හා ගණිත අධ්‍යාපනය පිළිබඳ ජාතික කමිටුව යටතේ විදූනෙත වැඩසටහන සංවිධානය කරනු ලැබුණි. වැඩසටහන ආරම්භ කරන ලද්දේ 2011 ජූනි මාසයේ දී වන අතර මේ යටතේ හංවැල්ල අධ්‍යාපන කලාපයේ ග්‍රාමීය පාසල් 30කින් ගුරුවරුන් 31 දෙනෙකු සඳහා වැඩමුළු 04ක් පවත්වන ලදී. ගුරුවරුන්ගේ මගපෙන්වීම යටතේ ශිෂ්‍යයින් හට පාසලේ දී පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කිරීමට සලස්වන ලදී. අවසාන වැඩමුළුවේ දී පාසල් 17ක් මගින් පර්යේෂණ ව්‍යාපෘති 34ක් ඉදිරිපත් කරනු ලැබීය. මෙම වැඩසටහනෙහි අවසන් අංගය වූයේ හොඳම ව්‍යාපෘති ඉදිරිපත් කිරීම සඳහා ප්‍රදර්ශනයක් සංවිධානය කිරීම සහ ජයග්‍රාහකයින් තේරීමය.

### 4.4 කුටුම්භ සඳහා විද්‍යා වැඩසටහන

විද්‍යාත්මක කටයුතු අත්දැකීම් තුළින් විද්‍යාව පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ළමුන් සහ දෙමව්පියන් සඳහා අධ්‍යාපනික වැඩසටහනක් වූ "කුටුම්භ සඳහා විද්‍යා වැඩසටහන" ප්‍රථම වරට හඳුන්වා දෙනු ලැබීය. මෙම වැඩසටහන මගින් තරුණ ළමුන් සහ දෙමව්පියන් අතර විද්‍යාව පිළිබඳ උනන්දුවක් ඇති කිරීම විශේෂයෙන් ඉලක්ක කරන ලදී. විද්‍යාව, තාක්ෂණය හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ජාතික කමිටුවේ සාමාජිකා, ආචාර්ය සුනේත්‍රා කරුණාරත්න, හිඳගල, සීවලි මහා විදුහලේ ප්‍රාථමික සිසුන් 60 දෙනෙකුට සහ ඔවුන්ගේ දෙමව්පියන්ට වැඩසටහනක් පැවැත්වූවාය. ගතවුණු වසර තුළ දී මෙවැනි වැඩසටහන් තුනක් (03) සාර්ථකව පවත්වන ලදී. මෙවැනිම සැසි හතක් (07) 2012 දී සංවිධානය කිරීමට නියමිතය.

## 5. පාසල් සඳහා විද්‍යා අධ්‍යාපන වැඩසටහන්

### 5.1 පාසල්, කර්මාන්ත සහ විද්‍යාත්මක / පර්යේෂණ ආයතන අතර සම්බන්ධතා ස්ථාපිත කිරීම

වසර 2010 දී ආරම්භ කරන ලද මෙම කටයුත්ත ගතවුණු වසර තුළ දී ද අඛණ්ඩව සිදු කරන ලදී. බොහොමයක් කර්මාන්තවලට මෙම වැඩසටහනට දායක විය හැක්කේ කෙසේ ද යන්න පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා එකී කර්මාන්ත නියෝජිතයින් සමග රැස්වීමක් පවත්වන ලදී. තම කර්මාන්තශාලා වෙත ශිෂ්‍යයින්ගේ පැමිණීම පිළිබඳ පහසුකම් සැපයීම ද ඇතුළත්ව මෙම වැඩසටහනට සහභාගිවීමට කර්මාන්ත 11ක් කැමැත්ත ප්‍රකාශ කළහ. සහභාගි වන සිසුන්ගේ දැනුම සහ කුසලතා සංවර්ධනය කිරීමෙහි ලා මෙම වැඩසටහනින් ලැබෙන ප්‍රතිලාභ චාරිකාවට සහභාගිවීමට පෙර සහ සහභාගිවීමෙන් අනතුරුව ඇගයීම පිණිස ගුරුවරුන් සහ සිසුන් විසින් සම්පූර්ණ කළ යුතු පෝරමයක් සකස් කරන ලදී. මෙම වැඩසටහන පිළිබඳව පාසල් වෙත දන්වා යැවීමට සහ ඒවා කර්මාන්ත සමග සම්බන්ධ කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය අවශ්‍ය පියවර ගෙන ඇත. පළාත් සහ කලාප විද්‍යා අධ්‍යක්ෂකවරුන් වෙත මෙම වගකීම පවරනු ලැබ ඇත. විද්‍යාත්මක සංකල්ප ප්‍රායෝගිකව යොදා ගැනීමේ අවස්ථා අධ්‍යයනය කිරීමට පාසල් ළමුන් හට අවස්ථාවක් මෙම වැඩසටහන මගින් සපයනු ලැබෙතැයි අපේක්ෂා කෙරේ.

### 5.2 ඔලිම්පියාඩ් ෆෙඩරේශනය

ශ්‍රී ලංකා ඔලිම්පියාඩ් ෆෙඩරේශනය 2011 නොවැම්බර් 24 වන දින පිහිටුවන ලද අතර ඒ සඳහා ජාතික විද්‍යා පදනම පහසුකම් සැපයීය. රට තුළ සියලුම ඔලිම්පියාඩ් කටයුතු සම්බන්ධීකරණය කිරීමේ අධිකාරි බලය ෆෙඩරේශනය සතු වන අතර ජාතික මට්ටමේ සමස්ත වගකීම ද එය සතු වේ. පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත කිරීම පිණිස පනතේ කෙටුම්පත් සකස් කොට ඇත.

**ලියාපදිංචිවීමේ ගාස්තුව**

ඔලිම්පියාඩ් අයදුම්කරුවන් තිදෙනෙකුට පිළිවෙළින්, 12වන ආසියාතික ඔලිම්පික් තරඟාවලිය (ඊශ්‍රායලය), ජාත්‍යන්තර තොරතුරු විද්‍යා තරඟාවලිය (තායිලන්තය) සහ 8 වන ජාත්‍යන්තර කනිෂ්ඨ විද්‍යා ඔලිම්පියාඩ් තරඟාවලිය යන තරඟවලට සහභාගිවීමේ දී ලියාපදිංචි ගාස්තුව සඳහා අනුග්‍රහය දක්වන ලදී.

### 5.3 නැනෝතාක්ෂණය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන

මෙම වසර තුළ නැනෝතාක්ෂණය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනෙහි පළමු අදියර සාර්ථකව නිම කරන ලදී. වැඩමුළු හයකින් සමන්විත වූ වැඩසටහන් මාලාවක් මගින් රටේ සෑම පළාතක්ම නියෝජනය වන පරිදි මුළු එකතුව 315ක් වූ පළාත් විද්‍යා සම්බන්ධීකාරකවරුන්, කලාප විද්‍යා අධ්‍යක්ෂවරුන්, ගුරු උපදේශකවරුන් හට නැනෝතාක්ෂණ මූලධර්ම සහ එහි යොදා ගැනීම් පිළිබඳ මූලික වැටහීමක් ලබා දෙන ලදී. මහාචාර්ය කේ.එම්. නලින් ද සිල්වා, ආචාර්ය රෝහිණී ද සිල්වා

(රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්ව විද්‍යාලය) ආචාර්ය රොහාන් මුණසිංහ (විදුලි සංදේශ සහ ඉලෙක්ට්‍රොනික විද්‍යා දෙපාර්තමේන්තුව - මොරටුව විශ්ව විද්‍යාලය), සහ ආචාර්ය ශාන්ත අමරසිංහ (ශ්‍රී ලංකා නැනෝතාක්ෂණ ආයතනය; SLINTEC) වැඩමුළුවෙහි සම්පත් දායකයෝ ලෙස ක්‍රියා කළහ. වැඩසටහන් මාලාවේ එක් අරමුණක් වූයේ, අ.පො.ස. (සා.පෙළ) සහ උ.පෙළ විෂය ධාරාවලට අලුතින් එක් කරණ ලද නැනෝතාක්ෂණය පිළිබඳ විෂය පථය ආවරණය කිරීම සඳහා සහභාගිවූවන් සූදානම් කිරීමය.

### 5.4 ශ්‍රී ලංකා ජාතික විද්‍යා මධ්‍යස්ථානය "සයනස් වර්ක්ස්" ප්‍රදර්ශනය

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සහ සිංගප්පූරු විද්‍යා මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව 2011 ඔක්තොම්බර් 21 සිට නොවැම්බර් 01 දක්වා BMICH හි "C" ශාලාවේ දී "සයන්ස් වර්ක්ස්" ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී.

ප්‍රදර්ශන භාණ්ඩ සිංගප්පූරු විද්‍යා මධ්‍යස්ථානයෙන් නොමිලයේ සපයන ලද අතර එම ප්‍රදර්ශන භාණ්ඩ, ආලෝකය, දෘශ්‍ය මායාව, ගණිතය සහ චුම්බකත්වය යන ක්ෂේත්‍ර පිළිබඳ සැකසුණු ඒවා විය. ප්‍රදර්ශනයේ අරමුණ වූයේ, විද්‍යා මධ්‍යස්ථානයක් යනු කුමක් ද යන්න පිළිබඳව පාසල් සිසුන්ට අවබෝධයක් ලබා දීමය. අත්හදා බැලිය හැකි ප්‍රදර්ශන භාණ්ඩ පරිහරණයට අවස්ථාවක් ලබා දෙමින් අත්දැකීම් තුළින් සරල විද්‍යාත්මක සංකල්ප පිළිබඳ පාසල් සිසුන්ට අවබෝධයක් ලබා ගැනීමට මෙහිදි ඉඩප්‍රස්ථාවක් සැපයිණි. මේ ආකාරයේ ප්‍රදර්ශනයක් ලංකාවේ සංවිධානය කෙරුණේ ප්‍රථම වතාවටය.

පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 3000ක් පමණ සහ සාමාන්‍ය ජනතාව 1500ක් පමණ මෙම ප්‍රදර්ශනය නැරඹූහ. ප්‍රදර්ශනය ඉතාමත් ප්‍රයෝජනවත් වූ බව ද එය වෙනස් ආකාරයක අත්දැකීමක් ලබා දුන් බව ද ප්‍රදර්ශනයට සහභාගිවූවන් විසින් සටහන් කොට තිබුණි.

## 6. මහජනතාව විද්‍යාව වටහාගැනීම පිළිබඳ සමීක්ෂණය

"මහජනතාව විද්‍යාව වටහාගැනීම" පිළිබඳ සමීක්ෂණය අඛණ්ඩව සිදු කරන ලදී. කොළඹ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල දත්ත රැස් කිරීම නිම කරන ලදී. සකසන ලද ප්‍රශ්නාවලියක ආධාරයෙන් මහජනතාව නියෝජනය කරමින් පුද්ගලයින් 554 දෙනෙක්ගෙන් ද පාසල් ප්‍රජාව නියෝජනය කරමින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 645 දෙනෙක්ගෙන් ද දත්ත රැස්කිරීම සිදු කරන ලදී. තාක්ෂණ වාර්තාවක් සකස් කොට කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

## 7. මහජනතාව වෙත විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා වැඩසටහන

### 7.1 සම්මාන දිනූ මිහිමඬල වැඩසටහන් මාලාව

#### 7.1.1 ඉ - ස්වාභිමානි විශේෂ කුසලතා සම්මානය

විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශය මගින් නිෂ්පාදනය කරන ලද මිහිමඬල වීඩියෝ වැඩසටහන් මාලාව (ඩොකියුමෙන්ටරි 13ක්) ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) මගින් සංවිධානය කරන ලද ඉ - ස්වාභිමානී 2011 සම්මාන උළෙලේ දී විශේෂ කුසලතා සම්මානයක් දිනා ගන්නා ලදී.

#### 7.1.2 දකුණු ආසියා 2011 මන්තන් සම්මානය

ඉන්දියාවේ, නව දිල්ලි නුවර, හැබිටැට් සෙන්ටර්හි 2011 දෙසැම්බර් 01 සහ 02 දිනවල පැවති සම්මාන උළෙලේ දී ඉ - විද්‍යා කැටගරිය යටතේ දකුණු ආසියා 2011 මන්තන් සම්මානය නම් වූ ජාත්‍යන්තර සම්මානය මිහිමඬල වීඩියෝ වැඩසටහන් මාලාව මගින් දිනා ගන්නා ලදී.

## 8. මහජනතාව වෙත විද්‍යාව සන්නිවේදනය කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව

"මහජනතාව වෙත විද්‍යාව සන්නිවේදනය කිරීම" යන තේමාව යටතේ දෙදින පුහුණු වැඩමුළුවක් රජරට විශ්ව විද්‍යාලයේ දී 2011 අගෝස්තු 18 සහ 19 යන දිනවල දී පවත්වනු ලැබිය. මෙහි අරමුණ වූයේ, විද්‍යාඥයින් සහ සමාජය (මහජනතාව) අතර පවතින දැනුම් පරතරය පියවීම සහ එමගින් විද්‍යාව මිනිසුන්ගේ ජීවිතයේ කොටසක් ලෙස සැලකීමට හුරුකරවීම සඳහා විද්‍යාඥයින් විද්‍යා සන්නිවේදකයින් ලෙස පුහුණු කරවීමය.

මෙම වැඩමුළුවට, උතුරු මැද පළාතේ විශ්ව විද්‍යාල සහ විද්‍යාත්මක ආයතනවලින් විද්‍යාඥයින් 30 දෙනෙකු පමණ සහභාගි වූහ. විද්‍යා සන්නිවේදකයින්ගේ කිට්ටුවක් සෑදීම සඳහා විද්‍යාඥයින් 100 දෙනෙකු පුහුණු කිරීම පිණිස 2005 දී ආරම්භ කරන ලද වැඩසටහනේ තවත් එක් අංගයක් ලෙස මෙම වැඩසටහන සංවිධානය කරන ලදී. පර්සි ජයමාන්න මහතා (හිටපු ප්‍රධාන කර්තෘ, ලංකාදීප) ආචාර්ය ජයන්ත වත්තවිදානගේ, තුසිත මලලසේකර මහතා සහ වෛද්‍ය පාලිත බණ්ඩාර යන අය වැඩමුළුවෙහි සම්පත් දායකයන් ලෙස ක්‍රියා කළහ. දේශන, සාකච්ඡා සහ ප්‍රායෝගික අභ්‍යාසවලින් මෙම වැඩමුළුව සමන්විත විය.

## 9. දැයට කිරුළ - 2011 ප්‍රදර්ශනයේ ජාතික විද්‍යා පදනම් ප්‍රදර්ශන කුටිය

බුත්තල දී 2011 පෙබරවාරි 04 සිට 10 දක්වා සංවිධානය කෙරුණු දැයට කිරුළ 2011 ප්‍රදර්ශනය සඳහා ජාතික විද්‍යා පදනම සක්‍රීය ලෙස සහභාගි විය. මෙයට අමතරව දැයට කිරුළ 2011 සහ 2012 ප්‍රදර්ශනවලට සමගාමීව ප්‍රදේශයේ සංවර්ධනය කෙරෙහි යොමුවුණු වැඩසටහන් කිහිපයක්ද ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කරනු ලැබුණි.

### 9.1 දැයට කිරුළ 2011 ප්‍රදර්ශනයට සමගාමීව සංවිධානය කළ විද්‍යා දින වැඩසටහන්

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සහභාගිත්වය ඇතිව විද්‍යා දින වැඩසටහන් දෙකක් තණමල්විල සහ බුත්තල පාසල් සිසුන් සඳහා පිළිවෙළින් 2011 ජනවාරි 07 සහ 21 යන දිනවල දී සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන් දෙකට ම පාසල් ළමෝ 250ක් පමණ සහභාගි වූහ. මෙම වැඩසටහන්වල අරමුණ වූයේ, තෝරාගත් මාතෘකා යටතේ විද්‍යාත්මක දැනුම සැපයීම සහ පැමිණ සිටි පාසල් සිසුන් සහ ගුරුවරුන් ජාතික විද්‍යා පදනම මගින් පාසල් ප්‍රජාව වෙත සිදු කෙරෙන සේවාව පිළිබඳව දැනුවත් කිරීමය. වැඩසටහන් සඳහා සහභාගිවූවන් හට විදුරාව විද්‍යා සඟරාවෙහි (27 වන කලාපය, විශේෂ නිකුතුව, සිංහල මුද්‍රණය) පිටපත බැගින් බෙදා දෙන ලදී. මානව ක්‍රියාකාරකම් සහ පරිසර සංරක්ෂණය (ආචාර්ය ජයන්ත වත්තවිදානගේ), බෝ නොවන රෝග (තුසිත මලලසේකර මහතා), ජාතික විද්‍යා පදනම සහ පාසල් ප්‍රජාව (කේ.ජී. ජනක කරුණාසේන මහතා) සහ නැනෝතාක්ෂණය (ආචාර්ය රෝහාන් මුණසිංහ) යන ඉදිරිපත් කිරීම්/දේශන මෙම වැඩසටහන්වල දී සිදුකරන ලදී.

## 10. මාධ්‍ය ආයතන සමග සහයෝගයෙන් පවත්වනු ලැබූ ජාතික විද්‍යා පදනමේ කටයුතු

### 10.1 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (SLRC)

- 2010 දී පවත්වනු ලැබූ අන්තර් පාඨශාලීය විද්‍යා සමාජ තරඟාවලියේදී ජයග්‍රහණය කරන ලද පාසල් නාට්‍ය දෙක රූගත කර "රූපවාහිනී" නාලිකාව ඔස්සේ විකාශය කරන ලදී. නාට්‍ය දෙක ඉදිරිපත් කරන ලද්දේ, පොළොන්නරුව, මැදිරිගිරිය මහා විද්‍යාලය සහ මාතලේ, ශ්‍රී සංඝමිත්තා බාලිකා ජාතික පාසල මගින් වන අතර නාට්‍ය රූගත කිරීම 2011 මාර්තු 3වන දින සිදු කරන ලදී.

- රූපවාහිනී ප්‍රවෘත්ති විකාශය වන අතරතුර තිරයට පහළින් දිස්වන ප්‍රවෘත්ති තීරයේ විකාශය කිරීම මගින් ජාතික විද්‍යා පදනම් කටයුතු සඳහා ප්‍රසිද්ධියක් ලබා දීම සඳහා කටයුතු කරන ලදී.

### 10.2 ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව (SLBC)

ජාතික විද්‍යා පදනමෙන් ඉටු කෙරෙන සේවාව සඳහා ප්‍රසිද්ධියක් ලබා දීම පිණිස ගුවන් විදුලි සංස්ථාවේ "සුබාරතී" වැඩසටහන ඔස්සේ සජීවී සාකච්ඡා අටක් (08) විකාශය කරන ලදී.

### 10.3 විජය ප්‍රවෘත්ති පත්‍රය

පුවත්පත් ලිපි කිහිපයක් විජය ළමා පුවත්පතෙහි පළ කරන ලදී. එක් ලිපියකින් ජාතික විද්‍යා පදනමෙහි කාර්යභාරය පිළිබඳ ප්‍රචාරයක් ලබා දුන් අතර ඉතිරි ලිපි තුන මගින් ජාතික විද්‍යා පදනමේ ප්‍රදානලාභීන්ගේ පර්යේෂණ සොයා ගැනීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලදී. මෙම ලිපි ළමුන්ට කියවා පහසුවෙන් වටහා ගත හැකි පරිදි සරල භාෂාවෙන් ලියා පළ කරන ලදී. ලිපි පිළිබඳ විස්තර පහත දැක්වේ.

I. ජාතික විද්‍යා පදනම (2011 අප්‍රේල් 05 විජය පුවත්පත)
II. ශ්‍රී ලංකාවේ පවතින මධුමේහය සහ ඊට බලපාන සාධක (RG/2005/HS/16) මෙම පර්යේෂණ කමිටුවේ සමාජික වෛද්‍ය ප්‍රසාද් කටුලන්ද සමග කරන ලද සාකච්ඡාවක් ඇසුරෙන් (2011 මැයි 24, විජය පුවත්පත)

III. ශ්‍රී ලංකාවේ ජලජ පරිසරය දූෂණය ජෛව විද්‍යාත්මකව අධීක්ෂණය කිරීමේ විභවයක් සහිත මෙවලමක් ලෙස ආහාරයට ගන්නා තිලාපියා මත්ස්‍යයාගේ ජෛව සළකුණු ඇගයීම (RG/2003/Z00/05) මහාචාර්ය අසෝකා පතිරත්න සමග සිදුකරන ලද සාකච්ඡාවක් ඇසුරෙනි.

IV. ශ්‍රී ලංකාවේ ලයිකනවලින් ඖෂධීය වටිනාකමින් සහිත සංයෝග (RG/2005/FR/02) මහාචාර්ය වෙරන්ජ කරුණාරත්න සමග සිදුකරන ලද සාකච්ඡාවක් ඇසුරෙනි.

## 11. සිංගප්පූරු විද්‍යා මධ්‍යස්ථානය වෙත සිදු කළ චාරිකාව

විද්‍යා මධ්‍යස්ථානය පිළිබඳ තාක්ෂණික කමිටුවේ සාමාජික, ආචාර්ය ජයන්ත වත්තවිදානගේ, සහ එම කමිටුවේ සම්බන්ධීකාරක කේ.ජී. ජනක කරුණාසේන මහතා සිංගප්පූරු විද්‍යා මධ්‍යස්ථානය වෙත 2011 ජූනි 01 සහ 02 යන දිනවල චාරිකාවක් සිදු කළ අතර "සයන්ස් වර්ක්ස්" ජංගම ප්‍රදර්ශනය කොළඹ දී පැවැත්වීමට නිර්දේශ කළහ. අත්හදා බැලිය හැකි ප්‍රදර්ශන භාණ්ඩ සඳහා වූ සරල විද්‍යාත්මක සංකල්ප හැදෑරීමට පාසල් සිසුන් හට මෙම ප්‍රදර්ශනය මගින් අවස්ථාවක් සැලසිණි.

# විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය (STPRD)

විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශයෙහි (STPRD) මෙහෙවර වනුයේ, ප්‍රතිපත්ති සකස් කරන්නන්ට හා රට තුළ වෙනත් අදාළ අංශවල නියුතු වූවන්ට විද්‍යාව, තාක්ෂණය, අධ්‍යාපනය සහ අනෙකුත් අදාළ ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු සම්පාදනය කිරීම සහ රටේ සමාජ - ආර්ථික සංවර්ධනය උදෙසා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය (STI) හා සම්බන්ධ වැදගත් කරුණු පිළිබඳ සමාජය දැනුවත් කිරීමට කටයුතු කිරීමවේ. ඒ අනුව, විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය පිළිබඳ ගැටළු, තත්වය සහ ඒ හා සම්බන්ධ අතීත, වර්තමාන සහ අනාගත සිදුවීම් පෙළ විශ්ලේශනය පිණිස ප්‍රධාන වශයෙන් දිවයින පුරා සමීක්ෂණ ඔස්සේ පර්යේෂණ ව්‍යාපෘති මෙම අංශය මගින් සිදු කෙරෙන අතර අවශ්‍ය කෙරෙන ප්‍රතිපත්ති සැකසීමේ දී සහ කර්තව්‍ය සැලසුම් කිරීමේදී ඒ පිළිබඳ සාක්ෂි පදනම් වූ දත්ත හා නිර්දේශ සම්පාදනය සිදු කෙරේ. එමෙන්ම, අවශ්‍ය වූ අවස්ථාවල දී ප්‍රතිපත්ති සැලසුම් ආයතන සහ අදාළ අංශවල නියුක්ත වූවන් (විද්‍යාඥයින්, පර්යේෂකයින්, ශිෂ්‍යයන්, විදේශීය ආධාර නියෝජිතායතන යනාදිය) වෙත යාවත්කාලීන කරන ලද තොරතුරු සම්පාදනය සඳහා විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවලට සම්බන්ධ විවිධ දත්තපාදක පවත්වාගෙන යැම ද මෙම අංශය ඔස්සේ සිදු කෙරේ.



## 1. විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් හැකියාව ඉහළ නැංවීම

**ජාතික පර්යේෂණ සහ සංවර්ධන සමීක්ෂණය**

වර්ෂ 2004 සිට දෙවසරකට වරක් පැවැත්වෙන ජාතික පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය මෙම අංශය මගින් සංවිධානය කරනු ලබයි. මෙම සමීක්ෂණය, පර්යේෂණ සහ සංවර්ධනය සඳහා සිදු කෙරෙන ආයෝජනය සහ ඒ සඳහා වියදම, මානව සම්පත් සහ විද්‍යා හා තාක්ෂණ අංශයෙහි නිමැවුම් යනාදිය මගින් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පවත්නා තත්වය පිළිබඳව මැන බැලීමක් සහ වාර්තා සම්පාදනය කිරීමක් සිදු කරයි.

2008 දී සිදු කළ ජාතික පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය මගින් රැස් කරන ලද දත්ත සහ වෙනත් අදාළ තොරතුරු විශ්ලේශණය මත පදනම්ව, විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදන යන ක්ෂේත්‍රවල දර්ශක සපයන ලද අතර "විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදන සංඛ්‍යාන විද්‍යාත්මක අත්පොත - 2008" නැමති ග්‍රන්ථය 2008 වර්ෂයේ දී මුද්‍රණය කොට තිබුණි. පර්යේෂණ සහ සංවර්ධන සමීක්ෂණය 2008 පිළිබඳ සවිස්තරාත්මක තාක්ෂණ වාර්තාව 2011 වර්ෂය තුළ දී සකස් කෙරෙමින් පැවතුණි.

මින් පසුව එන සිව්වන සමීක්ෂණය වන පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය - 2010, 2011 මැයි මාසයේ දී ආරම්භ කරන ලදී. මෙම සමීක්ෂණය 2010 වර්ෂයට අදාළ දත්ත රැස් කිරීම සිදු කරයි. 2011 වසර තුළ උසස් අධ්‍යාපන අංශය, විද්‍යා හා තාක්ෂණ ආයතන, පර්යේෂණ හා සංවර්ධන ආයතන, දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන (NGO) ආවරණය කෙරෙමින් දත්ත රැස් කිරීම සිදු කරන ලදී. කර්මාන්ත අංශයෙහි දත්ත රැස් කිරීමේ කටයුතු ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව 2012 වර්ෂය තුළ සම්පූර්ණ කෙරෙනු ඇත.

## 2. විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන ප්‍රතිපත්ති පර්යේෂණ ව්‍යාපෘතිය

### 2.1 ශ්‍රී ලංකාවේ කාන්තා විද්‍යාඥයින් පිළිබඳ පසු විපරම් අධ්‍යයනය

ශ්‍රී ලංකාවේ කාන්තා විද්‍යාඥයින් පිළිබඳ පසු විපරම් අධ්‍යයනය ශ්‍රී ලංකාවේ විවිධ අංශවල කාන්තා විද්‍යාඥයින්ගේ ව්‍යාපෘතිය සහ ඔවුන් මුහුණ දෙන ගැටළු හා බාධක පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා සමීක්ෂණයක් සිදු කරන ලදී. දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය නිමකොට ප්‍රතිපත්ති නිර්දේශ සමග තාක්ෂණික වාර්තාව 2011 දී සකස් කරන ලදී.

### 2.2 කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත (SME) සමූහ අධ්‍යයන

#### 2.2.1 බිම්මල් පාදක කොට ගත් කර්මාන්ත පිළිබඳ සිද්ධි අධ්‍යයනය

රට තුළ බිම්මල් වගාව සහ බිම්මල් පාදක කොටගත් කර්මාන්ත ආශ්‍රිත නවෝත්පාදන ක්‍රියාවලිය සහ ඒවායේ සම්බන්ධය විමර්ශනය කිරීමට සහ වටහාගැනීමට 2010 වසරේ දී මෙම අධ්‍යයනය ආරම්භ කරන ලදී. පවතින පද්ධතිය නියමාකාරයෙන් ක්‍රියාත්මක වීම සඳහා ජාලගත කරන ලද රාජ්‍ය ආයතන, අමාත්‍යාංශ, පර්යේෂණ සහ සංවර්ධන ආයතන, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රවර්ධනය හා සැලසුම් සකස් කරන ආයතන, විශ්ව විද්‍යාල, රාජ්‍ය නොවන සංවිධාන, අපනයනකරුවන්, ගොවීන් හා අනෙකුත් සියලු අංශවල කාර්යභාරය සහ ආයෝජනය පිළිබඳ මෙම අධ්‍යයනය මගින් සොයා බලන ලදී. රැස් කරන ලද දත්ත; අ) සම්බන්ධතාවල ශක්තිමත්භාවය සහ දුර්වලතා, ආ) පද්ධතියෙහි පවතින බාධක සහ ගැටළු, ඇ) පර්යේෂණ සහ තාක්ෂණ පරතර පිළිබඳ මැන බැලීම, යනාදිය සඳහා විශ්ලේෂණය කරන ලදී. මෙම අධ්‍යයනය 2011 දී නිම කරන ලද අතර කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා වන ප්‍රතිපත්ති නිර්දේශ පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වමින් අදාළ තාක්ෂණික වාර්තාව සකස් කරන ලදී.

#### 2.2.2 රොටැං (වේවැල්) පාදක කොටගත් කර්මාන්ත පිළිබඳ සිද්ධි අධ්‍යයනය

ශ්‍රී ලංකාවේ වේවැල් පාදක කොටගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයෙහි ව්‍යාපෘතිය, සම්බන්ධතා සහ ඊට සම්බන්ධවන ක්‍රියාකාරීන් මෙන්ම, ජාලයෙහි තිබෙන්නා වූ ගැටළු, බාධක පරතර පිළිබඳ වටහාගැනීමට මෙම අධ්‍යයනය ආරම්භ කරන ලදී. දත්ත රැස් කිරීම 2011 මැයි මාසයේ දී ආරම්භ කෙරුණි. එය 2012 වර්ෂයේ දී ද අඛණ්ඩව සිදු කෙරුණු ඇත. කර්මාන්තයේ සංවර්ධනය සහ තිරසරභාවය ඉලක්ක කොටගත් ප්‍රතිපත්ති නිර්දේශ 2012 දී ව්‍යාපෘතිය නිම කෙරෙන විට අදාළ අධිකාරීන් වෙත දන්වා යවනු ඇත.

### 2.3 1998 – 2008 දක්වා කාලය තුළ ප්‍රදානය කෙරුණු ජාතික විද්‍යා පදනම් පර්යේෂණ ප්‍රදාන ඇගයීම: ක්‍රියාවලිය, නිමැවුම්, ප්‍රතිඵල සහ සමාජ ආර්ථික බලපෑම

ජාතික විද්‍යා පදනමෙහි පර්යේෂණ ප්‍රදාන වැඩසටහන සවිස්තරාත්මකව ඇගයීමකට ලක් කිරීමේ අරමුණ ඇතිව, i) දැනුම උත්පාදනය සහ තාක්ෂණය ජනනය, ii) විද්‍යා හා තාක්ෂණ හැකියා ගොඩනැගීම සහ පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන ප්‍රචාලනයක යෙදීමට ජාතික පර්යේෂණ පද්ධතිය උනන්දු කිරීම, iii) ජාතික නිෂ්පාදිතතාවන්, නිෂ්පාදන සංවර්ධනය සහ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම, සහ iv) විද්‍යා හා තාක්ෂණ තොරතුරු උත්පාදනය, සැසඳීම, සකස් කිරීම සහ ව්‍යාප්තිය යනාදිය දෙසට යොමු වෙමින් මෙම පර්යේෂණ ව්‍යාපෘතිය 2011 දී ආරම්භ කරන ලදී.

මෙම අංශය මගින් නියාමක ව්‍යාපෘතියක් සිදු කරන ලද අතර එයින් ලැබුණු තොරතුරු පදනම් කොට ගෙන, කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද උප කමිටුවෙහි මග පෙන්වීම යටතේ සවිස්තරාත්මක පර්යේෂණ ව්‍යාපෘතියක් සකස් කරන ලදී. මෙම ව්‍යාපෘති යෝජනාවලිය කළමනාකරණ මණ්ඩලය වෙත 2011 දෙසැම්බර් මාසයේ දී අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

## 3. වෙනත් විද්‍යා හා තාක්ෂණ දත්තපාදක :

- ශ්‍රී ලංකාවේ විදෙස්ගත විද්‍යාඥයින් පිළිබඳ දත්ත පාදකය ක්‍රියාත්මක තත්වයේ පවතින දත්ත පාදකයකි. වසර පුරාම දත්ත රැස් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.
- තාක්ෂණික පුද්ගලයින් පිළිබඳ දත්ත පාදකය - දත්ත රැස් කිරීම 2011 මැයි මාසයේ දී ආරම්භ කරන ලද අතර වසර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.
- අ.පො.ස. උ.පෙළ උපාධිධාරී ගුරුවරු පිළිබඳ දත්ත පාදකය -දත්ත රැස්කිරීම 2011 ජූනි මාසයේ දී ආරම්භ කෙරුණු අතර දැනට සේවක මණ්ඩල දැඩි හිඟය නිසා තාවකාලිකව නවතා ඇත.
- ශ්‍රී ලංකාවේ නව නිෂ්පාදකයින් පිළිබඳ දත්ත පාදකය - ක්‍රියාත්මක තත්වයේ පවතින ව්‍යාපෘතියකි. දෛනිකව සිදු කෙරෙන දත්ත යාවත්කාලීන කිරීම සිදු කරන ලදී.

## 4. විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය පිළිබඳ තරඟකාරී පර්යේෂණ ප්‍රදාන

වසර තුළ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ පිළිබඳ ප්‍රදාන අයදුම්පත් හතරක් (04) ලැබුණු අතර පහත සඳහන් ව්‍යාපෘති දෙක (02) සඳහා මූල්‍යාධාර සපයන ලදී.

| ප්‍රදාන අංකය | ප්‍රධාන ලාභියා / ආයතනය | ව්‍යාපෘති මාතෘකාව/කාලය | වෙන් කරන ලද මුළු මුදල |
|---|---|---|---|
| RD/2011/STP/01 | ආචාර්ය පරාක්‍රම සමරතුංග, ප්‍රතිපත්ති අධ්‍යයනය පිළිබඳ ආයතනය | ශාක වර්ග සහ ගොවීන්ගේ දැනුම සුරැකීමෙහි ලා බුද්ධිමය දේපළ අයිතිය : ශ්‍රී ලංකාවේ වී පිළිබඳ සිද්ධි අධ්‍යයනයක් | 702,400.00 |
| RG/2011/STP/02 | මහාචාර්ය අජිත් ඩී. අල්විස් - මොරටුව විශ්ව විද්‍යාලය | ශ්‍රී ලංකාවේ ප්‍රවාහන අංශය සඳහා ජෛව ඉන්ධන පිළිබඳ පුළුල් විශ්ලේෂණයක්. කාබන් වෙළෙඳාම සඳහා තාක්ෂණ - ආර්ථික සහ ජාතික අවස්ථා | 2,967,000.00 |

## 5. සමාජ විද්‍යාව පිළිබඳ ජාතික කමිටුව

රට තුළ සමාජ විද්‍යා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමට සහ ජාතික සංවර්ධනය උදෙසා සමාජ විද්‍යාඥයින්ගේ කටයුතු එක්ව සිදු කිරීම පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් 2011 වසරේ දී පිහිටුවන ලද සමාජ විද්‍යාව පිළිබඳ ජාතික කමිටුව වසර 3ක් සඳහා තම කාර්ය සැලැස්ම සකස් කළාය. 2011 වසර තුළ මෙම කමිටුව පහත සඳහන් කාර්යය සිදු කළාය.

### 5.1 ජාතික වශයෙන් වැදගත්වන පර්යේෂණ ප්‍රමුඛතා ක්ෂේත්‍ර පිළිබඳ වාර්තාවක් සැකසීම

### 5.2 "සමාජ විද්‍යා පර්යේෂණ සහ සවිස්තරාත්මක පර්යේෂණ යෝජනාවලි සැකසීම" පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව 2011 නොවැම්බර් 7 – 8 දිනවල දී පැවැත්වීම

### 5.3 කමිටු සමාජිකයන් දෙසැම්බර් 7 සහ 8 යන දෙදින තුළ පහත සඳහන් තේමා ඔස්සේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ (SLBC) ජාතික ස්වදේශ සේවයෙහි 'සුබාරතී" වැඩසටහන් දෙකකට සහභාගිවීම.

අ) සමාජ විද්‍යා පර්යේෂණ සහ ජාතික සංවර්ධනය
ආ) සමාජ විද්‍යා පර්යේෂණ සහ ජාතික ප්‍රමුඛතා

## 6. "ජාතික නවෝත්පාදන පද්ධතිය : මෙහෙයුම් ක්‍රමෝපාය සහ කළමනාකරණ අංශ" (2011 නොවැම්බර් 02 – 03)

ජාතික විද්‍යා පදනම වර්ෂ 2008 ඔක්තොම්බර් සිට 2011 සැප්තැම්බර් දක්වා වසර 03ක කාලයක් විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආසියාතික ජාලයෙහි (STEPAN) සභාපතිත්වය දැරුවාය. කොළඹ, ගලධාරි හෝටලයේ දී 2011 නොවැම්බර් 02 – 03 දිනවල පැවති "ජාතික නවෝත්පාදන පද්ධතිය: මෙහෙයුම් ක්‍රමෝපාය සහ කළමනාකරණ අංශ" නමැති වැඩමුළුව විද්‍යාව හා තාක්ෂණ ප්‍රතිපත්ති සැලසුම් අංශය (STPRD) හා ජාත්‍යන්තර සබඳතා අංශය (ILD) මගින් ඒකාබද්ධව සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාව ඇතුළු සාමාජික රටවල් 11ක් මෙම වැඩමුළුවට සහභාගි විය.

වැඩමුළුවේ දී පහත සඳහන් කරුණු හඳුනාගෙන අනුමත කරන ලදී.

- ශ්‍රී ලංකාවේ ජාතික නවෝත්පාදන පද්ධතියෙහි (NIS) සියලු අවශ්‍යතා කැටි කරමින් කුඩා, මධ්‍යම සහ විශාල පරිමාණයේ විවිධ අධ්‍යයන සිදු කිරීමේ වැදගත්කම
- නවෝත්පාදන ක්‍රියාවලි පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් විශ්ව විද්‍යාල අධ්‍යාපන පද්ධතිය වෙනසකට භාජනය කිරීමේ අවශ්‍යතාවය

- වටිනාකම ආදේශ කරන ලද අපනයන භාණ්ඩවලින් සෙස් බද්දක් අයකර ගැනීම තුළින් පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා සහන සැලසීම, ජාතික මට්ටමෙන් අපනයනය සඳහා දිරි දීමනා ලබාදීම, නිර්මාණශීලීත්වය පිළිබඳ නිපුණතා දියුණු කිරීමේ සහ වැඩිදියුණු කිරීමෙන් අධ්‍යාපනය සහ උසස් අධ්‍යාපන පද්ධතිය ශක්තිමත් කිරීම, ව්‍යවසායකත්ව නිපුණතා හැඩගැස්වීම පිළිබඳ විෂය මාලාවල අන්තර්ගත කිරීම යනාදිය සඳහා පද්ධතියක් සකස් කිරීම.
- ජාතික නවෝත්පාදන පද්ධතිය ශක්තිමත් කිරීම පිණිස රටකට විශේෂිත වූ සුදුසු මෙහෙයුම් ක්‍රමෝපාය සකස් කිරීම. ක්ෂේත්‍රයේ කටයුතු කරන ප්‍රවීණයින් එකිනෙකට වෙනස් ප්‍රවේශ සලකා බලනු ඇත.
- NIS අධ්‍යයන සැලසුම් කරන විට, පර්යේෂණයේ අරමුණ හඳුනාගැනීම, එහි සන්දර්භානුගත සලකා බැලීම් සහ ජාතික වැදගත්කම මෙන්ම සමාජ වගකීම සමග වෙනත් අවශ්‍යයෙන් කළ යුතු දෑ පිළිබඳ අවධානය යොමු කළ යුතුය.
- කල්පවත්නා තිරසර නවෝත්පාදන ආකෘතියක් සඳහා නවෝත්පාදන අංශයේ නියැළෙන්නන් අතර සම්බන්ධතාවය ශක්තිමත් කිරීමේ සහ යුනෙස්කෝ ඩිස්කවරි සම්මානය යනාදිය වැනි විශේෂිත නාමයක් යටතේ නවෝත්පාදන සම්මාන සම්ප්‍රදායක් සමග නවෝත්පාදන පිළිගැනීමකට ලක් කිරීම සඳහා පහසුකම් සැපයීමෙහි ලා යුනෙස්කෝව මැදිහත්වීමේ වැදගත්කම හඳුනාගනු ලැබුණි.

# 7. ප්‍රධාන නිමැවුම්

## 7.1 තාක්ෂණික වාර්තා

- ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ ආචාර්ය උපාධි පිළිබඳ පසු විපරම් අධ්‍යයනය
- ශ්‍රී ලංකාවේ කාන්තා විද්‍යාඥයින් පිළිබඳ පසු විපරම් අධ්‍යයනය

## 7.2 ප්‍රකාශන (විචාරයට ලක් කරන ලද)

**සීතා අයි. වික්‍රමසිංහ (2011),** ශ්‍රී ලංකාවේ SMEවල තත්වය සහ විද්‍යා හා තාක්ෂණ ආයතන ජාලකරණය තුළින් නවෝත්පාදන නිමැවුම් ප්‍රවර්ධනය කිරීම. ටෙක් මොනිටර්, 2011 ජූලි - අගෝස්තු, පිටු 11 – 19.

# 8. විවිධ ජාතික සහ ආයතනික කමිටු සඳහා කාර්යමණ්ඩල නියෝජනය :

- ආචාර්ය සීතා අයි. වික්‍රමසිංහ, ප්‍රධානී / STPRD පහත සඳහන් කමිටුවල සේවය කළා ය.
  - අ) ඩී අංශයේ සභා සාමාජිකා සහ සභාපතිනිය (ජීව සහ පෘථිවි විද්‍යා කමිටුව), 2011 ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (SLAAS), විද්‍යා මාවත, කොළඹ - 07, 2011 වසර සඳහා
  - ආ) සාමාජිකා ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින්ගේ සංසදය, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම (NASTEC), නාවල, නුගේගොඩ, 2011 වසර සඳහා
- ආචාර්ය පී.ආර්.එම්.පී. දිල්රුක්ෂි, විද්‍යාත්මක නිලධාරිනී / STPRD පහත සඳහන් කමිටුවේ සේවය කළා ය.
  - අ) ලේකම්, ඩී. අංශය (ජීව සහ පෘථිවි විද්‍යාව කමිටුව), 2011. ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (SLAAS), විද්‍යා මාවත, කොළඹ - 07, 2011 වසර සඳහා

# 9. කාර්යමණ්ඩලයේ අමතර ක්‍රියාකාරකම්

- **ආචාර්ය සීතා අයි. වික්‍රමසිංහ, ප්‍රධානී/ STPRD** පහත සඳහන් කාර්යයන්හි අඛණ්ඩව නියැලුනාය.

  1) ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම් වාරසඟරාවෙහි සහාය සංස්කාරක
  2) ජාතික විද්‍යා පදනමෙහි සුළු-ප්‍රසම්පාදන කමිටු සභාපතිනිය, 2009 වර්ෂයේ සිට
  3) විද්‍යා අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති උපාධිය සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍යයින් දෙදෙනෙකුගේ අධීක්ෂකවරිය, විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය (PGIS), පේරාදෙනිය විශ්ව විද්‍යාලය

අ) සුජීවා පොල්ගම්පොල මිය - PGIS/SE/MSc/BE/08/07

ආ) සභානායගම් අභිලාන් මයා - PGIS/SE/MSc/PE/08/05 නිබන්ධනය ඉදිරිපත් කර ඇත.

- **ආචාර්ය පී.ආර්.එම්.පී. දිල්රුක්ෂි, විද්‍යාත්මක නිලධාරිනී,** පහත සඳහන් කටයුතුවල නියැලුනාය.
  1) ජාතික විද්‍යා පදනමෙහි තත්ව කළමනාකරණ පද්ධතියෙහි (QMS) සම කණ්ඩායම් සාමාජිකා
  2) පේරාදෙනිය විශ්ව විද්‍යාලය, විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙහි ජෛව රසායනික සහ අණුක ජීව විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය යටතේ ලියාපදිංචි වූ (පූර්ණ කාලීන) දර්ශනපති ශිෂ්‍යයකුගේ ව්‍යාපෘති අධීක්ෂකවරිය

# ජාතික විද්‍යා පුස්තකාලය හා සම්පත් මධ්‍යස්ථානය (NSLRC)

## 1. හැඳින්වීම

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළ ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ තොරතුරු ජාලයේ (SLISTINET) කේන්ද්‍රස්ථානය ලෙස ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය අඛණ්ඩව කටයුතු කළාය. භාවිත කරන්නන්ගේ වෙනස්වන අවශ්‍යතාවලට අනුරූපව තාක්ෂණික සංවර්ධනයන් පිළිබඳ තොරතුරු සපුරාලීම පිණිස මෙම වසර තුළ බොහෝමයක් ක්‍රමෝපාය හඳුන්වා දී අනුගත කරන ලදී.

**විශේෂ සිදුවීම් :** මෙම වසර තුළ පහත සඳහන් කැපී පෙනෙන ජයග්‍රහණ ලබා ගන්නා ලදී.

**ශ්‍රී ලංකා විද්‍යා දර්ශකය :**
පූර්ණ පාඨ ලේඛන සංඛ්‍යාංක පුස්තකාලයක් බවට ශ්‍රී ලංකා විද්‍යා දර්ශකය (SLSI) දත්ත පාදකය පරිවර්තනය කිරීමේ කටයුතු මෙම වසර තුළ ශීඝ්‍ර ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි. NSFLAN ඔස්සේ මාර්ගගතව පූර්ණ පාඨ ලේඛන වෙත ප්‍රවේශවීම් මුළු ගණන 2011 දෙසැම්බර් 31 වන විට 23,553ක් ලෙස වාර්තා විය. මෙය, දත්තපාදකයෙහි මුළු වාර්තා ගණනින් 50% ක් විය.

**ජාතික සංඛ්‍යාංකකරණ ව්‍යාපෘතිය :**
ජාතික විද්‍යා පදනමෙහි මූලිකත්වය යටතේ පස් අවුරුදු ජාතික සංඛ්‍යාංකකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. රට තුළ වූ ආයතනවල සහ පුස්තකාලවල තබා ඇති දේශීයව උත්පාදනය කෙරුණු විද්‍යාවට හා තාක්ෂණයට අදාළ තොරතුරු සංඛ්‍යාංකකරණය කිරීම මෙම ව්‍යාපෘතියෙන් ඉලක්ක කෙරේ. නවෝත්පාදනය සහ ඵලදායී පර්යේෂණ ප්‍රවර්ධනයට රට තුළ සියලුම විද්‍යාත්මක පාර්ශවකරුවන් හට පූර්ණ පාඨ ලේඛන සඳහා මාර්ගගතව ප්‍රවේශවීමට ඉඩප්‍රස්තා සැපයීම මෙහි අරමුණයි.

**ඉ - ස්වාභිමානී සම්මානය :**
ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන නියෝජිතායතනය (ICTA) මගින් සංවිධානය කරන ලද ඉ - ස්වාභිමානී - 2011 සම්මාන උළෙලේ දී ඉ - විද්‍යා කැටගරිය යටතේ ශ්‍රී ලංකා විද්‍යා දර්ශක දත්තපාදකය විශේෂ කුසලතා සම්මානයක් දිනා ගත්තාය.

**ජාතික ඉ - කෝෂ්ඨාගාරය :**
වෙනත් ඉ - කෝෂ්ඨාගාර සහ දේශීයව ප්‍රකාශනය කරන්නා වූ අනෙකුත් මාර්ගගත වාරසඟරා (SLJOL හි අඩංගු සියලුම සඟරා ද ඇතුළත්ව බොහෝ දෙනෙකුට එක විට සෙවුම් කිරීමේ පහසුකම මෙම දත්තපාදකයෙහි අන්තර්ගත කරන ලදී. එනිසා එක් සෙවුමකින් තනි/බොහෝ/සියලුම අඩවි සෙවුම් සඳහා පහසුකම් සැපයිණි.

**ආයතනික ඉ - කොෂ්ඨාගාරවල ජාතික ජාලය :** ඉ - කොෂ්ඨාගාරවල ජාතික ජාලය ශක්තිමත් කරන ලදී.

**ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගම් (SLAAS) දත්ත පාදකය :**
SLAAS දත්ත පාදකය කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී. පසුගිය වසර 25 තිස්සේ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගම් සැසිවල ඉදිරිපත් කරන ලද සියලුම පර්යේෂණ පත්‍රවල (ආශ්‍රේය විෂය සහ සාර සංග්‍රහ) තොරතුරු වාර්තා කිරීම නිම කරන ලදී.

## 2. දත්තපාදක සංවර්ධනය

### 2.1 ශ්‍රී ලංකා විද්‍යා දර්ශකය (SLSI)

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළ දත්තපාදකය කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කොට ඇත. වාර්තා සහ පූර්ණ පාඨ ලේඛන සංඛ්‍යාව යන ද්විත්වයම කැපී පෙනෙන වර්ධන වේගයක් පෙන්නුම් කොට ඇත. වසර තුළ එක් කරන ලද වාර්තා සහ අන්තර්ගත කරන ලද ලේඛන සංඛ්‍යාව පිළිවෙළින් 5,616ක් සහ 7,086ක් විය.

2006 දී ආරම්භ කරන ලද දිනයේ සිට දත්තපාදකය පූර්ණ පාඨ ලේඛන සංඛ්‍යාංක පුස්තකාලයක් බවට ක්‍රමයෙන් විකාශය විය. 2010 සහ 2011 යන දෙවසර තුළ ඉහළම වර්ධන වේගය පෙන්නුම් කෙරුණි. දත්තපාදකයෙහි වූ පූර්ණපාඨ අයිතම 59%කට (ලේඛන 23,553කට) 2011 දෙසැම්බර් 31 වන විට NSFLAN තුළින් ප්‍රවේශවීමට හැකි විය. මෙයින්, දේශීය වාර සඟරා 15කට අන්තර්ජාලය

ඔස්සේ දුරස්ථ ප්‍රවේශය ලබා දෙන ලදී. දුරස්ථ ප්‍රවේශ සම්පාදනය සඳහා අනෙක් ප්‍රකාශකයින්ගේ හිමිකම් අයිතිය පිළිබඳ අවසර ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.







## 2.2 ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගම් (SLAAS) දත්තපාදකය

ගත වූ වසර තුළ SLAAS දත්තපාදකය කැපී පෙනෙන පුළුල්වීමක් පෙන්නුම් කරන ලදී. දත්තපාදකය 2011 දෙසැම්බර් 31වන විට අයිතම 8,311ක් වාර්තා කර තිබේ. පසු ගිය වසර 25 (1976 – 2010) තුළ SLAAS සැසිවල ඉදිරිපත් කරන ලද අධි දත්ත (ආශ්‍රේය ප්‍රකාශන) මෙමගින් ආවරණය කෙරේ. සාරසංග්‍රහ එකතු කිරීම මගින් 1987 – 2010 කාලය තුළ එකතු කරන ලද වාර්තා තවදුරටත් ශක්තිමත් කරන ලදී. අන්තර්ජාලය ඔස්සේ මෙම දත්ත පාදකයට ප්‍රවේශවීමට ඉඩකඩ සලසා ඇත.

## 2.3 පර්යේෂණ ප්‍රදාන දත්තපාදකය (RGRA)

RGRA දත්තපාදකය මනාව සංවිධිත කිරීම සිදු කරන ලද අතර එහි අන්තර්ජාල අතුරුමුහුණත වැඩිදියුණු කරන ලදී. 2011 දෙසැම්බර් 31 වන විට මෙහි අඩංගු වූ වාර්තා සංඛ්‍යාව 1,881 ක් විය. NSFLANවලින් ප්‍රවේශ විය හැකි පූර්ණ පාඨ වාර්තා සංඛ්‍යාව 967ක් විය.

## 2.4 පුවත්පත් ලිපි දත්තපාදකය

වසර තුළ එක් කරන ලද වාර්තා ගණන 1,587ක් වූ අතර 2011 දෙසැම්බර් 31 වන විට මුළු වාර්තා සංඛ්‍යාව 20,250ක් විය. මෙම අධි දත්තපාදකය ක්‍රමයෙන් සංඛ්‍යාංක පුස්තකාලයක් බවට පරිවර්තනය වෙමින් පවතී.

## 2.5 SLISTIC නාමාවලිය

2011 දෙසැම්බර් 31 වන විට වාර්තා සංඛ්‍යාව 26,777ක් විය.

## 2.6 ජාතික ඉ - කෝෂ්ඨාගාර

වෙනත් ඉ - කෝෂ්ඨාගාර ඔස්සේ සෙවුම් කිරීම පිණිස බොහෝ දෙනෙකුට එක විට සෙවුම් කිරීමේ පහසුකම දත්තපාදකයෙහි අන්තර්ගත කරන ලදී. ඒ අනුව, ජාතික විද්‍යා පදනම් ඉ - කෝෂ්ඨාගාර අඩවියෙහි දේශීය ඉ - කෝෂ්ඨාගාර/මාර්ගගත වාරසඟරා දෙකක් හෝ වැඩි ගණනක් ඔස්සේ සෙවුම් කිරීම තනි සෙවුමක් මගින් සිදු කිරීමට අවස්ථාව මෙහිදී සපයා ඇත. තම පර්යේෂණ හා තාක්ෂණික පත්‍රිකා දත්තපාදකයට එක් කිරීමට දේශීය විද්‍යාත්මක ප්‍රජාවට ඉඩකඩ ලබා දීමේ අරමුණින් මෙම කෝෂ්ඨාගාරය විශාල සර්වරයක් වෙත මාරු කරන ලදී. වඩා පහසු සහ ආකර්ශනීය, භාවිත අතුරුමුහුණතක් සැපයීම පිණිස අතුරුමුහුණත වැඩිදියුණු කරන ලදී.

## 3. සපයන ලද සේවා

සියලුම දේශීය පුස්තකාල නාමාවලි, ජාල නාමාවලි සහ විශේෂ මාර්ගගත දත්තපාදකවලට කේන්ද්‍රීය ද්වාරයක් ලෙස ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථාන වෙබ් අඩවිය අඛණ්ඩව තම සේවය සැපයුවාය. පර්යේෂකයින්ගේ පහසුව සඳහා සියලුම දේශීය සහ ජාත්‍යන්තර යන දෙඅංශයෙහිම සම්පත් වෙත වඩාත් ප්‍රයෝජනවත් සම්බන්ධතා ඇති කරන ලදී.

### 3.1 අද්‍යතන දැනුවත් කිරීමේ සේවා (CAS)

රට තුළ වූ 4,000කට අධික පර්යේෂකයින් වෙත සයිනොටෙක් ඉ - ප්‍රවෘත්ති පත්‍රිකාව මගින් අද්‍යතන දැනුවත් කිරීමේ සේවයක් සපයන ලදී. මෙම සේවාව ඔස්සේ පර්යේෂකයින්ගේ සහ ශාස්ත්‍රඥයින්ගේ මේසය මතට ම NSLRC වෙත සෑම මසකම එක් කරන ලද නව අයිතම 40ක පමණ තොරතුරු ගෙන යන ලදී.

### 3.2 ආශ්‍රේය තොරතුරු සෙවීමේ සේවාව

භාවිත කරන්නන්ගේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමක් ලෙස තොරතුරු සෙවුම් 316ක් සිදු කරන ලද අතර විමසීම් 120කට පිළිතුරු සපයා ඇත. දේශීය සහ ජාත්‍යන්තර උත්පාදක පිළිබඳව සෙවුම් සිදු කර ඇත. තොරතුරු සෙවීමේ සහ ආශ්‍රේය තොරතුරු සේවාවලට සමගාමීව පිටපත් කිරීමේ සේවයක් ද සපයන ලදී.

### 3.3 පුස්තකාල නාමාවලි දරා සිටීම

සම්පත් බෙදා ගැනීමේ අදහස ඇතිව තම සම්පත් විද්‍යාත්මක ප්‍රජාවගේ දෘශ්‍ය පථයට ගෙන ඒමට උපකාර කරනු වස් පහත සඳහන් ආයතන තුනෙහි මාර්ගගත නාමාවලි ජාතික විද්‍යා පදනම් සර්වරයෙහි දරා සිටින ලදී.

- මානව හිමිකම් අධ්‍යයන සඳහා කේන්ද්‍රය - කොළඹ විශ්ව විද්‍යාලය
- පවුල් සංවිධාන සංගමය
- මධ්‍යම පරිසර අධිකාරිය

### 3.4 බාහිර පුද්ගලයෝ

ජාතික විද්‍යා පදනම් උත්පාදකවලට ප්‍රවේශවීමේ සහ සෙවුම් කිරීමේ පහසුකම් සපයා ඇති බැවින් පසු ගිය වසර කිහිපය මුළුල්ලේ පුස්තකාලය වෙත බාහිර පුද්ගලයින්ගේ පැමිණීම අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය කරන ලදී. 2011 වසර තුළ පැමිණි බාහිර පුද්ගලයින්ගේ සංඛ්‍යාව 124ක් විය.

### 3.5 සම්මන්ත්‍රණ

පුස්තකාලයාධිපතිවරුන් 52ක් සහභාගි වූ "තොරතුරු වෘත්තිකයින් සඳහා ආචාර ධර්ම" යන මැයෙන් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී.

## 4. එකතුව සංවර්ධනය කිරීම

නව ග්‍රන්ථ සහ වාර්තා 176ක් එක් කිරීම මගින් ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයෙහි එකතුව ශක්තිමත් කරන ලදී. "නවෝත්පාදන" සහ "නැනෝතාක්ෂණය" යන ක්ෂේත්‍රවල ග්‍රන්ථ ලබා ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදී. ජාතික විද්‍යා පදනම් ප්‍රදානවලින් අවසන් වාර්තා 9ක් ලැබුණි. වසර පුරා වාරසඟරා (දේශීය සහ විදේශීය) 65ක් නිතිපතා පුස්තකාලය වෙත ලැබීම සිදුවිය. "නවෝත්පාදන කළමනාකරණය" පිළිබඳ නව වාරසඟරා මාතෘකාවක් දායකවීමේ ලැයිස්තුවට එක් කරන ලදී.

**ජාත්‍යන්තර දත්තපාදකවලට ප්‍රවේශ වීම :** ජාතික විද්‍යා පදනම් පරිශ්‍රය තුළ පහත සඳහන් ජාත්‍යන්තර දත්තපාදකවලට ප්‍රවේශවීමේ අවස්ථාව වසර පුරාම සපයනු ලැබුණි.

**HINARI පූර්ණ පාඨ වාරසඟරා දත්තපාදකය :** ලෝක සෞඛ්‍ය සංවිධානය ප්‍රධාන පෙළේ ප්‍රකාශකයින් සමග එක්ව HINARI වැඩසටහන ලබා දී ඇති අතර එය ජෛව විද්‍යා සහ ආශ්‍රිත සමාජ විද්‍යා යන ක්ෂේත්‍රවල ප්‍රධාන වාරසඟරා වෙත මාර්ගගත ප්‍රවේශය සපයයි. වාරසඟරා 8,500කට අධික සංඛ්‍යාවක් වෙත සහ ඉ - ග්‍රන්ථ 7,000කට අධික ප්‍රමාණයකට HINARI මගින් ප්‍රවේශය සපයනු ලැබේ.

**AGORA පූර්ණ පාඨ දත්තපාදකය :** එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය ප්‍රධාන පෙළේ ප්‍රකාශකයින් සමග එක්ව; ආහාර, කෘෂිකර්මය, පරිසර විද්‍යාව සහ ආශ්‍රිත සමාජ විද්‍යාවල කැපී පෙනෙන පුස්තකාල එකතුවක් වෙත ප්‍රවේශවීමට මෙම දත්තපාදකය ඔස්සේ ඉඩකඩ ලබා දෙයි. වාරසඟරා 1,900ක පමණ එකතුවක් මෙම දත්තපාදකයෙහි අන්තර්ගතය.

අන්තර් ජාලයෙහි ඇති අයකිරීමකින් තොර අනෙකුත් දත්තපාදක සහ සම්පත් ගණනාවක් හඳුනාගෙන ඇති අතර තොරතුරු සෙවීමේ සහ පූර්ණ පාඨ ලේඛන ලබා ගැනීමේ පහසුකම් සැපයීම සඳහා එම දත්ත පාදක ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයෙහි වෙබ් අඩවියට සම්බන්ධ කරන ලදී.

## 5. ජාතික සංඛ්‍යාංකකරණ ව්‍යාපෘතිය

විද්‍යාත්මක ප්‍රජාවට පහසු මාර්ගගත ප්‍රවේශයක් ලබා දීමේ අදහස ඇතිව දේශීය පුස්තකාලවල ඇති දේශීයව උත්පාදනය කෙරුණු විද්‍යා හා තාක්ෂණ තොරතුරු සංඛ්‍යාංක ආකාරයට පරිවර්තනය කිරීමේ අරමුණ ඇතිව ජාතික සංඛ්‍යාංකකරණ ව්‍යාපෘතියක් (NDP) දියත් කරන ලදී. පස් වසරක ව්‍යාපෘතියක් වන මෙහි පළමු අදියර 2011 දී ආරම්භ කරන ලදී. මේ යටතේ, අප රටේ පුස්තකාල හයක (06) එනම්; පොල් පර්යේෂණ ආයතනය, කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, නවීන තාක්ෂණය සඳහා වන ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය, කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය, මධ්‍යම පරිසර අධිකාරිය, සහ කාර්මික තාක්ෂණ ආයතනය යන ආයතන පුස්තකාලවල දේශීය විද්‍යා හා තාක්ෂණ තොරතුරු සංඛ්‍යාංකකරණය පිණිස හඳුනාගන්නා ලදී. ව්‍යාපෘතියෙහි ප්‍රගතිය අධීක්ෂණය කිරීමට මෙහෙයුම් කමිටුවක් පත් කිරීම සහ ජාතික විද්‍යා පදනම සහ සෑම හවුල්කාර පුස්තකාලයක් අතර අත්සන් තැබීම සඳහා අවබෝධතා ගිවිසුමක් සකස් කිරීම ද සිදු කරන ලදී. දේශීය පුස්තකාලවල වූ අදාළ ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු රැස් කරන ලද අතර පස් අවුරුදු ව්‍යාපෘති කාලය සඳහා කාර්ය සැලැස්මක් ද පිළියෙළ කරන ලදී. සංඛ්‍යාංකකරණය බාහිර පාර්ශවයකට ලබා දීම පිණිස සුදුසු සැපයුම්කරුවෙකු ද හඳුනා ගනු ලැබුණි. සංඛ්‍යාංකකරණ ව්‍යාපෘතියට සමගාමීව, ආයතනික කෝෂ්ඨාගාර (IR) සැකසීම ද ප්‍රවර්ධනය කරන ලදී. තෝරාගත් පුස්තකලායාධිපතිවරුන් කණ්ඩායමකට 2009 වර්ෂයේ දී ඩී අවකාශයෙහි ඉ - කොෂ්ඨාගාර පිහිටුවීම සඳහා අවශ්‍ය කෙරෙන පුහුණුවක් ලබා දී තිබේ. කෙසේ වෙතත් පරිපාලනමය ක්‍රියාවලියෙහි විවාදය හේතුකොට ගෙන සැලසුම් කළ පරිදි සංඛ්‍යාංකකරණ කටයුතු 2011 දී ආරම්භ කිරීමට අවකාශ නොලැබුණි. අදාළ දෑ සංඛ්‍යාංකකරණය කිරීම 2012 වසරේ මුල් භාගයේ දී ආරම්භ කෙරෙනු ඇත.

## 6. SLISTINET දත්තපාදකයෙහි වූ තොරතුරු තාක්ෂණ යොදාගැනීම් ඉහළ නැංවීම

### 6.1 මෘදුකාංග බෙදා හැරීම :

පුස්තකාල කළමනාකරණ මෘදුකාංගය වන CDS/ISIS (වින්ඩෝස් සංස්කරණය) හි පිටපත් 32ක් රට තුළ වූ පුස්තකාල අතර බෙදා හරින ලදී.

### 6.2 පුහුණු කිරීමේ වැඩසටහන්/වැඩමුළු

#### 6.2.1 WINISIS වැඩමුළුව :

පුස්තකාල වෘත්තිකයින් 29 දෙනෙකු පුහුණු කිරීම සඳහා WINISIS මෘදුකාංගයේ මූලික යොදාගැනීම් පිළිබඳ වැඩමුළු තුනක් පවත්වන ලදී.

#### 6.2.2 විවෘත ලේඛනාගාර සැකසීම සඳහා ඩී. අවකාශ මෘදුකාංගය යොදා ගැනීම පිළිබඳ වැඩමුළුව

ආසියානු කලාපයේ පුස්තකාල/තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් සඳහා සංවිධානය කරන ලද ඩී අවකාශ මෘදුකාංගය පිළිබඳව ප්‍රාදේශීය වැඩමුළුව 2011 ජූලි 27 – 30 දක්වා පවත්වනු ලැබීය. මැලේසියාව, තායිලන්තය, කාම්බෝජය, ලාඕසය, වියට්නාමය, නේපාලය සහ ඉරානය යන රටවලින් නව දෙනෙක් මෙම වැඩසටහනට සහභාගී වූහ. මෙම සෑම රටක ම ජාතික ඉ - කෝෂ්ඨාගාර පිහිටුවීමට සහ එමගින් ආසියානු කලාපය තුළ සම්පත් බෙදා ගැනීමට හැකි වන පරිදි ජාලයක් සැකසීම සඳහා අවශ්‍ය කෙරෙන ඩී අවකාශ විවෘත ප්‍රභව මෘදුකාංගය පිළිබඳ දැනුම සහභාගිවූවන්ට ලබාදීමේ අරමුණ සහිතව මෙම වැඩමුළුව සංවිධානය කරන ලදී. එක්සත් රාජධානියේ විද්‍යා ප්‍රකාශන සුලබතාවය සඳහා වූ ජාත්‍යන්තර ජාලය (INAP) මෙම වැඩසටහනෙහි සම අනුග්‍රාහකත්වය දැරුවාය. ඉන්දියාවේ, බැංගලෝරයෙහි සංඛ්‍යාන විද්‍යාත්මක ආයතනයේ මහාචාර්ය ඒ.ආර්.ඩී. ප්‍රසාද් සහ ආචාර්ය දේවිකා වේදාලී වැඩමුළුවෙහි සම්පත් දායකයන් ලෙස ක්‍රියා කළහ.

## 7. ප්‍රකාශන ඉදිරිපත් කිරීම්

කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් 2011 සැප්තැම්බර් 30 දින පවත්වනු ලැබූ AGRINET භාවිත කරන්නන් සඳහා වූ සම්මන්ත්‍රණයේ දී ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ ප්‍රධානී, සුනේත්‍රා පෙරේරා මහත්මිය ජාතික විද්‍යා පදනමේ “තොරතුරු ද්වාරය” පිළිබඳ ඉදිරිපත් කිරීමක් සහ ගෙනහැර දැක්වීමක් සිදු කළාය.

## පරිපාලන අංශය

අවශ්‍ය කෙරෙන සේවා සම්පාදනය කිරීමට සහ ජාතික විද්‍යා පදනමෙහි ප්‍රධාන කර්තව්‍ය ප්‍රශස්ත මට්ටමින් සිදු කිරීමට හැකිවන පරිදි පහත සඳහන් ප්‍රධාන කාර්ය පරිපාලන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලැබුවාය.

- සාමාන්‍ය පරිපාලනය
- මානව සම්පත් කළමනාකරණය
- දේපළ කළමනාකරණය
- ජාතික විද්‍යා පදනමෙහි සංවිධාන කටයුතු සඳහා අවශ්‍යතා සපුරා ලීම.

තවදුරටත්, බාහිර වටපිටාවේ වූ රජයේ සහ ව්‍යවස්ථාපිත ආයතන අතර සම්බන්ධතා සහ සන්නිවේදන ශක්තිමත් කරගැනීම පිණිස අවශ්‍ය කටයුතු ද සිදු කරනු ලැබීය. ජාතික විද්‍යා පදනමෙහි මෙහෙවර සපුරාලීම සඳහා එහි සේවක දායකත්වය කාර්යක්ෂම ලෙස ඉහළ නැංවීමට උපකාර කළ කාර්යමණ්ඩලයේ හැකියාව සහ සඵල බව සංවර්ධනයට සහ ප්‍රතිලාභිමුඛව විවෘත සංස්කෘතියක් පවත්වාගැනීමට ප්‍රයත්නයක් දරණ ලදී.

### 1. කාර්යමණ්ඩලය

අනුමත කාර්යමණ්ඩලය වූ 144න් 94ක කාර්යමණ්ඩලයක් ජාතික විද්‍යා පදනම සතු වූ අතර ඉන් 23 දෙනෙකු විද්‍යාත්මක කාර්ය මණ්ඩලය විය.
2011.12.31 වන විට සේවය කළ ප්‍රධාන කාර්යමණ්ඩලයෙහි ලැයිස්තුව 3වන ඇමුණුමෙහි දක්වා ඇත.
මෙම කාලය තුළ එක් විධායක කාර්යමණ්ඩල සමාජිකයෙක් ඉල්ලා අස්විය.

#### 1.1 කාර්යමණ්ඩල නියෝජනය

ජාතික විද්‍යා පදනම නියෝජනය කරමින් කාර්යමණ්ඩලය විදේශීය රැස්වීම්/වැඩමුළු/සම්මන්ත්‍රණ 11ක් සඳහා සහභාගි වී ඇත. ජාතික විද්‍යා පදනමේ කාර්යමණ්ඩලය විවිධ ජාතික සහ ආයතනික කමිටු ආයෝජනය කර ඇත.

ජාතික විද්‍යා පදනමෙහි කාර්යමණ්ඩලය ජාතික විද්‍යා පදනම නියෝජනය කරමින්, දේශීය සම්මන්ත්‍රණ, සමුළු සහ වැඩමුළුවලට සහභාගි වී තිබේ.

### 2. ගුණත්ව කළමනාකරණ පද්ධතිය (QMS) නැවත දියත් කිරීම

2011 වසර තුළ, ජාතික විද්‍යා පදනම සඳහා ගුණත්ව කළමනාකරණ පද්ධති වැඩසටහන නැවත දියත් කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ගුණත්ව කළමනාකරණ පද්ධති වැඩකටයුතු ජාතික විද්‍යා පදනම් අධ්‍යක්ෂගේ උපදෙස් පරිදි 2009 නොවැම්බර් මාසයේ දී නැවත දියත් කරන ලදී. පද්ධතිය නැවත පිහිටුවීමේ වගකීම සහිතව සෑම අංශයකින්ම නියෝජිතයින් සහිත සමාජිකයින් 12 දෙනෙකුගෙන් සමන්විත වන සම-කණ්ඩායමක් මේ සඳහා පත් කරන ලදී. ISO9001 : 2008 සහතිකය ලබා ගැනීම ඉලක්ක කොට ගෙන 2011 වසර තුළ පහත සඳහන් වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදී. කාලය සහ කාර්යමණ්ඩලය සීමාවීම නිසා 2011 සඳහා සැලසුම් කරන ලද සමහර කටයුතු සිදු කිරීමට නොහැකි විය.

- සම්මත මෙහෙයුම් ක්‍රියාවලි විචාරයට ලක් කර යාවත්කාලීන කිරීම
- ලේඛනවල ප්‍රධාන ලැයිස්තුව සහ තත්ව වාර්තා න්‍යාසය පිළියෙළ කරන ලදී.
- සහතිකය ලත් හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත QMS ක්ෂේත්‍ර චාරිකාව සූදානම් කරන ලදී.
- කේත ගැන්වීම පාර්ශ්විකව නිම කරන ලදී.

## මූල්‍ය අංශය

පවතින මූල්‍ය රෙගුලාසිවලට යටත්ව පදනමෙහි සියලුම මූල්‍ය කටයුතු හා සම්බන්ධ තාක්ෂණික සහ කාලීන ප්‍රතිචාර සහතික කෙරෙන කාර්යක්ෂම මූල්‍ය සේවාවක් සපයනු වස් මූල්‍ය අංශය සියලුම මූල්‍ය කටයුතු පරිපාලනය කරයි.

### 1. මූල්‍ය අංශයේ ප්‍රධාන කර්තව්‍ය

- ගිණුම් පොත් පවත්වාගෙන යාම
  උදා - ස්ථාවර වත්කම් රෙජිස්ටරය, පොදු ලෙජරය, ප්‍රදාන පිළිබඳ ලෙජරය, තොග පොත් ආදිය
- වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, ඇස්තමේන්තු යනාදිය ඇතුළත්ව මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඒවා නියමිත දිනවල අදාළ අධිකාරීන් වෙත ඉදිරිපත් කිරීම
- ආයතනයෙහි සියලුම අංශවලට සම්බන්ධ ගෙවීම් සිදු කිරීම
- ගබඩාව නඩත්තු කිරීම
- ප්‍රකාශන ගබඩාව නඩත්තු කිරීම සහ ප්‍රකාශන අලෙවි කිරීම සමග ප්‍රදර්ශන අලෙවි කුටි, පොත් ප්‍රදර්ශන සහ වැඩමුළුවලදී අලෙවි ඒකක සංවිධානය කිරීම
- ආයතන වෙත අරමුදල් ලබා ගැනීමේ දී මුදල් අමාත්‍යාංශයේ සහ රේඛීය අමාත්‍යාංශ නිලයන් සමග කටයුතු කිරීම

### 2. මූල්‍ය අංශයන්හි පිරිස් බලය

ප්‍රධානී, පරිපාලන/මූල්‍ය, ගණකාධිකාරිනිය, ගිණුම් නිලධාරිනිය, කළමනාකරණ සහකාර සහ කාර්යාල කාර්ය සහායකයින්ගෙන් මූල්‍ය අංශයෙහි පිරිස් බලය සමන්විතවේ.

## මුද්‍රණ අංශය

ජාතික විද්‍යා පදනමෙහි සියලුම අංශවල කටයුතු සඳහා මුද්‍රණ අංශයෙහි සහයෝගය ලබා දීම අඛණ්ඩව සිදු කෙරුණි.

2010 වසර තුළ සිදු කරන ලද ප්‍රකාශන 25ක් මුද්‍රණය කිරීම සහ වෙනත් මුද්‍රණ කටයුතු 63ට එදිරිව ග්‍රන්ථ සහ වාරසඟරා ඇතුළුව ප්‍රකාශන 20ක් සහ වෙනත් මුද්‍රණ කටයුතු 80ක් සිදු කරන ලදී.

## තොරතුරු තාක්ෂණ අංශය

ආයතනයෙහි කටයුතුවලට සහයෝගය දැක්වීම පිණිස තොරතුරු තාක්ෂණ ඒකකය තාක්ෂණ විද්‍යාත්මක දියුණුව යොදා ගැනීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය කළමනාකරණය කිරීම අඛණ්ඩව සිදු කළාය.

අන්තර්ජාල පහසුකම්, වෙබ්/දත්තපාදක දරා සිටීමේ පහසුකම්, අවසන් භාවිත කරන්නාට තොරතුරු තාක්ෂණ සහයෝගය ලබා දීම සහ විද්‍යුත් සන්නිවේදනය යනාදිය සපයමින් මෙම ඒකකය ජාතික විද්‍යා පදනම වෙත සේවය කරයි. පවතින තොරතුරු සහ සන්නිවේදන යටිතල පහසුකම් ඇගයීමට සහ වැඩිදියුණු කිරීම සහ අනාගත අවශ්‍යතා සැපිරීමට මෙම ඒකකය වගකීමෙන් බැඳී ඇත.

ආයතනයෙහි ව්‍යාපාරික ක්‍රියාවලියෙහි වැඩකටයුතු දියුණු කිරීම සඳහා සමෝධානිත මාර්ගගත මෘදුකාංග විසඳුමක් සකස් කිරීම පිණිස කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසල (UCSC) සමග මේ වසර තුළ ගිවිසුමක් අත්සන් කරන ලදී. මූල්‍ය, පරිපාලන සහ විද්‍යාත්මක අංශවල ප්‍රධාන කටයුතු මෙම ව්‍යාපෘතිය මගින් සමෝධානය කෙරෙනු ඇත. මෙම ව්‍යාපෘතියෙහි එක් අංගයක් ලෙස පදනමෙහි වෙබ් අඩවිය නැවත සැලසුම් කර යළි දියත් කිරීම සිදු කරන ලදී.

## අභ්‍යන්තර විගණක අංශය

යහපාලනය කරා මෙහෙයවමින්, ආයතනයෙහි අභ්‍යන්තර පාලනය පවත්වා ගැනීමට අභ්‍යන්තර විගණන අංශය පිහිටුවනු ලැබුණි. අභ්‍යන්තර විගණක, කළමනාකරණ මණ්ඩලයට/සභාපතිනියට ඍජුවම වාර්තා කරනු ලබයි. පහත සඳහන් දෑවලට විශේෂ අවධානය යොමු කරමින් අභ්‍යන්තර විගණක අංශය මෙම වසර තුළ රාජකාරි ඉටු කළාය.

- ආයතනයෙහි සාමාන්‍ය අභ්‍යන්තර පාලනය
- විද්‍යාත්මක කටයුතු පිළිබඳ ප්‍රගතිය
- ප්‍රකාශන අලෙවියෙහි සුරක්ෂිතභාවය
- ණයකරුවන්, ණයහිමියන් සහ මුදල් අත්තිකාරම් පිළිබඳ දෛනික සොයා බැලීම්
- ගබඩා ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

**කාර්යසාධනය පිළිබඳ ගිණුම් නිලධාරිනියගේ නිරීක්ෂණ**

**පුනරාවර්තන වියදම්** රු.’000

| | **ඇස්තමේන්තුව** | **වියදම** |
|---|---|---|
| පුද්ගලික වේතන | 46,520 | 44,710 |
| වෙනත් පුනාරාවර්තන | 30,480 | 24,121 |
| | 77,000 | 68,831 |

පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු පුනරාවර්තන වියදම් රු. 68,951 කි.

| | **ප්‍රාග්ධන වියදම්** | **වියදම් ඇස්තමේන්තුව** | **භාණ්ඩාගාරයෙන් ලැබුණු අරමුදල්** |
|---|---|---|---|
| විෂයනිශ්‍රිත කේතය -133-02-05-3-2201 | **300,000** | **110,700** | **154,948** |
| **අතිරේක වෙන් කිරීම** | | | |
| IDRC | | 5,864 | |
| UNESCO | | 1,402 | |
| **ආදායම්** | **379** | | |

**වසර තුළ ලැබුණු අරමුදලට එදරිව ප්‍රග්ධන වියදම පිළිබඳ විස්තර**

| | **විස්තරය** | **2011 වියදම්** |
|---|---|---|
| 1 | පර්යේෂණ සහ අනෙකුත් කටයුතු සඳහා ප්‍රදාන | 46,122 |
| 2 | විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය | 1,422 |
| 3 | තාක්ෂණ අංශය | 8,303 |
| 4 | ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය | 2,653 |
| 5 | විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශය | 5,118 |
| 6 | ජාත්‍යන්තර සබඳතා අංශය | 19,058 |
| 7 | තොරතුරු තාක්ෂණ අංශය | 2,004 |
| 8 | කාර්යාල ලී බඩු පිරිද්දුම් සහ උපකරණ | 4,493 |
| 9 | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය | 885 |
| 10 | වාහන | 4,800 |
| 11 | අධ්‍යක්ෂ කාර්යාලයේ වැය ශීර්ෂය | 4,986 |
| 12 | සමෝධානිත මෘදුකාංග වැඩසටහන | 2,999 |
| 13 | ශ්‍රී ලංකාවේ උතුරු මැද ප්‍රදේශයේ නිධන්ගත වකුගඩු රෝගය පිළිබඳ විමර්ශනය සහ ඇගයීම | 46,000 |
| 14 | ජාතික විද්‍යා මධ්‍යස්ථානය | 4,303 |
| 15 | විදේශීය විශේෂ පුහුණු වැඩසටහන | 1,812 |
| | **මුළු එකතුව** | **154,948** |

**මූල්‍යමය කරුණු**

ජාතික විද්‍යා පදනම යනු රජයේ අරමුදල් මත යැපෙන මූල්‍යාධාර සපයන ආයතනයකි. 2011 වසර තුළ ජාතික අයවැය දෙපාර්තමේන්තුව පුනරාවර්තන වියදම් රු. මිලියන 68.9ක් ද ප්‍රාග්ධන වියදම් රු. මිලියන 215.9ක් ද ලබා දීමට නිර්දේශ කළේ ය. භාණ්ඩාගාර කටයුතු දෙපාර්තමේන්තුව නිර්දේශිත පුනරාවර්තන වියදම වන රු. මිලියන 68.9 නිදහස් කරන ලද නමුදු ප්‍රාග්ධන වියදම් සඳහා ලබා දුන්නේ රු. මිලියන 110.7ක් පමණි. එනිසා, දෙසැම්බර් මාසය තුළ අනුමත වූ ප්‍රදානවලින් කිහිපයකට පමණක් මූලාධාර ලබා දීමට ජාතික විද්‍යා පදනමට සිදු වුණි.

කෙසේ වෙතත්, එක් එක් අංශ මගින් ලබා දෙනු ලැබූ ආයතනික අරමුණු අනුව යමින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද සහ අලුතින් ආරම්භ කරන ලද වැඩසටහන්වල කැපී පෙනෙන සාර්ථකභාවයක් ලබා ගැනීමට ජාතික විද්‍යා පදනම සමත් විය.

ශ්‍රී ලංකාවේ නැනෝතාක්ෂණයට අදාළ කටයුතු සඳහා යාමන රාමුවක් සකස් කිරීම පිණිස IDRC වෙතින් රු. මිලියන 5.9ක් ද, ඕ අවකාශ විවෘත මෘදුකාංගය භාවිතයෙන් ඉ . කෝෂ්ඨාගාර සකස් කිරීම පිළිබඳ ප්‍රාදේශීය වැඩමුළුව සඳහා යුනෙස්කෝ ආයතනයෙන් රු. මිලියන 1.4ක් ද සහ ජගත් සංසදය සඳහා UNDP සහ යුනෙස්කෝ ආයතනය වෙතින් රු. මිලියන 20ක් ද ලබා ගැනීමට ජාතික විද්‍යා පදනමට හැකි විය.

| වර්ෂය | අනුමත මුදල | නැවත සකසන ලද මුදල | ලැබුණු මුදල | අනුමත මුදලේ % | නැවත සකසන ලද මුදලේ % |
|---|---|---|---|---|---|
| රු. '000 | | | | | |
| 2007 | 307,500 | 257,500 | 80.98 | 50.08 | 59.80 |
| 2008 | 320,000 | 297,600 | 43.33 | 43.33 | 46.59 |
| 2009 | 217,192 | 184,613 | 31.47 | 31.47 | 37.00 |
| 2010 | 238,000 | 107,000 | 44.96 | 44.96 | 44.96 |

**කළමනාකරණය පිළිබඳ කරුණු**

- පර්යේෂණ ප්‍රදානවල ප්‍රතිලාභීන් වන්නේ ශාස්ත්‍රීය සහ පර්යේෂණ ආයතන වන අතර ඒවායේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් යටතේ පර්යේෂණ සිදු කෙරේ. එකී පර්යේෂකයින් ඍජුවම පාලනය කිරීමේ හැකියාවක් ජාතික විද්‍යා පදනම සතු නොවේ. ප්‍රදාන වැඩසටහන සඳහා වූ නිරවුල් නිර්ණායකවලට අමතරව ව්‍යාපෘතිය නිසි කලට ක්‍රියාත්මක කිරීම මත ප්‍රදානලාභියාගේ ආයතනය තුළ වූ ක්‍රියාමාර්ග සහ ක්‍රමවේද මගින් යම් ප්‍රමාණයක බලපෑමක් ඇති වී තිබේ. පර්යේෂකයින්ට මුහුණ දීමට සිදුවන බාධක සාඳහා ජාතික විද්‍යා පදනමෙහි පාලන වපසරිය තුළ, පිළියමක් යෙදීමට, පවතින ක්‍රමය මත ජාතික විද්‍යා පදනම පද්ධතිය වැඩිදියුණු කිරීමේ කාර්යයේ නිරතව සිටී.

- ජාතික විද්‍යා පදනමට විදේශ ආධාර ලබා ගැනීම සඳහා විශාල විභවයක් තිබුණ ද දීර්ඝ සහ අධෛර්ය කරවන සුළු ක්‍රියාමාර්ග මගින් එකී අවස්ථාවට බාධා පමුණුවා ඇත.

<u>2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා ආදායම සහ වියදම</u>

| | | | | රු.'000 |
|---|---|---|---|---|
| **ආදායම** | **2011** | | **2010** | |
| රජයේ ප්‍රදානය | 68,951 | | 60,976 | |
| **වෙනත් ආදායම්** | | | | |
| ලැබුණු පොලිය | 201 | | 195 | |
| සුළු ආදායම් | 53 | | 25 | |
| ප්‍රකාශන අලෙවිය | (1,127) | | (1,639) | |
| ඡායා පිටපත් කුවිතාන්සි | 18 | | 47 | |
| අන්තර්ජාල සාමාජික ගාස්තු | 24 | | 14 | |
| NSLRC ආදායම | 39 | | 9 | |
| ස්ථාවර වත්කම් අලෙවියෙන් ලද ලාභය | 3 | | 166 | |
| අතිරික්ත සැපයීම් | 123 | | 8,682 | |
| පාඨශාලීය විද්‍යා සමාජවලින් ලැබීම් | - | | - | |
| බාහිර මුද්‍රණ කටයුතුවලින් ලැබීම් | 42 | | - | |
| අසමාන අයභාරය | 8,855 | | 9,283 | |
| | | **77,182** | | **77,758** |
| **වියදම** | | | | |
| **පුද්ගල වේතන** | | | | |
| වැටුප් සහ දීමනා | 38,559 | | 34,695 | |
| සේවක සකසුරුවම් අරමුදල | 4,211 | | 4,054 | |
| සේවක භාරකාර අරමුදල | 842 | | 811 | |
| විශ්‍රාම පාරිතෝෂිකය සඳහා සැපයීම් | 2,983 | | 1,450 | |
| අතිකාල | 709 | | 617 | |
| නිවාඩු දින සඳහා ගෙවීම් | 43 | | 49 | |
| නිල ඇඳුම් | 108 | | 111 | |
| කාර්ය මණ්ඩල පුහුණුව | 185 | | 448 | |
| | **47,640** | | **42,235** | |

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රවාහනය | 496 | | 338 | |
| සැපයුම් | 2,697 | | 913 | |
| නඩත්තු කටයුතු | 1,618 | | 3,159 | |
| ගිවිසුම් ප්‍රකාර සේවය | 8,235 | | 7,845 | |
| වෙනත් | 10,315 | | 8,715 | |
| ක්ෂයවීම් | 10,840 | | 9,832 | |
| | **34,201** | 81,841 | **30,802** | 73,037 |
| විශේෂ අයිතමවලට පෙරටුව | | | | |
| අදායමට එරෙහි අතිරික්තය / හිඟය | | (4,659) | | 4,721 |
| විශේෂ අයිතම (ශුද්ධ ලාභය හෝ පාඩුව) | | - | | - |
| අදාළ කාලය සඳහා ශුද්ධ අතිරික්තය / හිඟය | | (4,659) | | 4,721 |

## <u>2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය</u>

(විස්තරාත්මක ශේෂ පත්‍රය අමුණා ඇත.)

**රු. '000**

| **වත්කම්** | **2011** | | **2010** | |
|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපොළ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 442,743 | | 335,553 | |
| | | 442,743 | | 335,553 |
| ආයෝජන | | 661,522 | | 631,522 |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| ඉන්වෙන්ටරි/තොග | 4,096 | | 5,214 | |
| වෙළෙඳ සහ වෙනත් ලැබීමට ඇති දේ | 17,246 | | 10,528 | |
| පූර්ව ගෙවීම් | 1,024 | | 17,379 | |
| මුදල් සහ මුදල් සංචිත | 13,351 | | 33,811 | |
| | | 35,717 | | 66,932 |
| **මුළු වත්කම්** | | **1,139,982** | | **1,034,007** |
| **ශුද්ධ වත්කම් සහ වගකීම්** | | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | | |
| සමුච්ඡිත අරමුදල | 6,256 | | 21.476 | |
| සංචිත - ප්‍රතිප්‍රමාණන සංචිත | 422,549 | | 316,061 | |
| රාජ්‍ය ප්‍රදාන | 661,522 | | 631,522 | |
| | | 1,090,327 | | 969,059 |

**ජංගම නොවන වගකීම්**

| | | | | |
|---|---|---|---|---|
| පාරිතෝෂික සඳහා සැපයීම් | 19,178 | | 17,294 | |
| අසමාන අයභාරය | 21,074 | | 37,811 | |
| | | 40,252 | | 35,105 |

**ජංගම වගකීම්**

| | | | | |
|---|---|---|---|---|
| ගෙවිය යුතු | 2,835 | | 6,676 | |
| උපචිත වියදම් | 6,568 | | 3,167 | |
| | | 9,403 | | 9,843 |
| | | **1,139,982** | | **1,034,007** |

**<u>මුදල් සංචරණ ප්‍රකාශය - 2011</u>**

**රු. '000**

| | 2011 | 2010 |
|---|---|---|
| **<u>මෙහෙයුම් කටයුතුවලින් මුදල් සංචරණ</u>** | | |
| ආදායමට එරෙහි වියදමෙහි | | |
| ශුද්ධ අතිරික්තය | (4659) | 4,721 |
| එකතු කළා: ජාතික විද්‍යා පදනමේ පෙර වසර සැකසීම් | (270) | 33,037 |
| | **(4,929)** | **37,758** |
| **<u>සැකසීම්</u>** | | |
| ක්ෂයවීම් සඳහා | (10,840) | (9,832) |
| ප්‍රකාශනවලින් වූ ආලාභය | (1,127) | (1,640) |
| වසර තුළ ගෙවන ලද පාරිතෝෂිකය | 1,099 | - |
| පාරිතෝෂිකය සඳහා සැපයීම් | (2,983) | (1,450) |
| අවිනිශ්චිත ණය සඳහා සැපයීම් | 123 | 7,367 |
| අතිරික්ත සැපයීම් | - | 1,315 |
| බොල් ණය | - | (1) |
| ස්ථාවර වත්කම් අලෙවියෙන් ලද ලාභය | 3 | 166 |
| අසමාන අයභාරය | 8,855 | 9,283 |
| අත්හැර දමන ලද සභරා සහ | | |
| වාරසභරා තොග | (1,301) | (1,307) |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට | | |
| පෙර මෙහෙයුම් ලාභය/පාඩුව | **1,242** | **33,876** |
| වෙනත් ලැබීම් | | |
| වෙළෙඳාමෙන් ශුද්ධ අඩුවීම/වැඩිවීම | 9,761 | (2,230) |
| ඉන්වෙන්ටරිවල අඩුවීම | 1,117 | 1291 |

| | | | | |
|---|---|---|---|---|
| වෙළෙඳ ගෙවීම්වල ශුද්ධ අඩුවීම/වැඩිවීම | (440) | | (7,409) | |
| මෙහෙයුම්වලින් උපයන ලද මුදල් | 10,438 | | (8,348) | |
| මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල | | **11,680** | | **25,528** |
| **<u>ආයෝජන කටයුතුවලින් මුදල් සංචරණ</u>** | | | | |
| කටයුතුවලින් බැහැරට ගලායෑම | (143,575) | | (110,403) | |
| වත්කම් මිලදී ගැනීම | (4,482) | | (4,712) | |
| ආයෝජන | (30,000) | | (147,000) | |
| ගොඩනැගීම් සඳහා අතිරික්ත සැපයීම් | - | | 10 | |
| උපකරණ අලෙවියෙන් ලද ලාභය | 5 | | 215 | |
| ග්‍රන්ථ අලෙවියෙන් ලද ලාභය | 404 | | 581 | |
| ආයෝජන කටයුතුවල දී භාවිත ශුද්ධ මුදල | | **(177,648)** | | **(261,305)** |
| **<u>මූල්‍ය කටයුතුවලින් මුදල් සංචරණ</u>** | | | | |
| රජයේ දායකත්වය | 110,710 | | 107,000 | |
| රජයේ ප්‍රදාන | 30,000 | | 147,000 | |
| විදේශාධාර | 4,797 | | - | |
| | | 145,507 | | 254,000 |
| මූල්‍යමය කටයුතුවලින් ශුද්ධ මුදල් | | (20,461) | | 18,819 |
| ආරම්භක කාලසීමාවේ දී මුදල් හා මුදල් සමක | | 33,812 | | 15,593 |
| කාල සීමාව අවසානයේ දී මුදල් සහ මුදල් සමක | | **13,351** | | **33,812** |

## ගිණුම් පිළිබඳ සටහන්

### 1. පොදු ගිණුම්කරණය

ඓතිහාසික පිරිවැය පදනම් කර ගත් පොදුවේ පිළිගත හැකි ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇත. ගිණුම්කරණයට අදාළ මූලික ගිණුම්කරණ උපකල්පන සහ ප්‍රතිපත්ති පසුගිය වසරේ දී මෙන් නොවෙනස් පදනමක ස්ථිරව යොදා ගෙන ඇත.

වත්කම්වලට අදාළ ක්ෂයවීම් සැලකීම සලකනු ලැබ ඇත්තේ, අසමාන අයහාර වශයෙන් වන අතර එම ආදායමට ශ්‍රී ලංකා පරිපාලන සේවය 24 (SLAS 24) ප්‍රකාර ප්‍රයෝජනවත් ආයුකාල පුරා විධිමත් වූ ද, සහේතුක වූ ද ඇගයීම් ලෙස පිළිගනු ලැබේ.

#### 1.1 ප්‍රලේඛන ඒකකයේ ප්‍රාග්ධන අරමුදල් වියදම්

| | | රු. |
|---|---|---|
| 1. | NSLRC උපකරණ | 491,571.00 |
| 2. | NSLRC ග්‍රන්ථ | 398,870.30 |
| 3. | සංඛ්‍යාංක ලිපිගොනු බවට මුද්‍රිත ප්‍රලේඛන පරිවර්තනය කිරීම | 669,801.53 |
| 4. | උපදේශක මණ්ඩලය | 13,065.00 |

| | | |
|---|---|---|
| 5. | NSLRC කාර්යමණ්ඩල පුහුණුව | 11,500.00 |
| 6. | දත්තපාදකය | 637,370.00 |
| 7. | NSLRC වැඩමුළු සහ සම්මන්ත්‍රණ | 157,365.02 |
| 8. | දත්තපාදක ඒකාබද්ධ ලැයිස්තුව | 273,688.29 |
| | | **2,653,231.14** |

## 1.2 පර්යේෂණ සහ වෙනත් විද්‍යාත්මක කටයුතු සඳහා ප්‍රදාන

පර්යේෂණ ප්‍රදාන පිළිබඳ එකඟතා ගිවිසුමෙහි පැහැදිලිව දක්වා ඇති පරිදි පර්යේෂණ ප්‍රදානවලට අරමුදල් සැපයීමේ දී අපගේ ප්‍රතිපත්තිය වන්නේ, ප්‍රදානලාභියා සේවයේ නියුතු ආයතනයට වාරික වශයෙන් එම මූල්‍යාධාර සැපයීමයි. ව්‍යාපෘතිය නිම කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය සඳහා ලබා දුන් අරමුදලේ භාවිත නොකරන ලද ශේෂයක් තිබේ නම් එය, අදාළ ආයතනය විසින් ජාතික විද්‍යා පදනම වෙත ආපසු එවිය යුතු වේ. එනිසා, ආයතනය වෙත සපයන ලද අරමුදල අපි වියදමක් ලෙස සලකන්නෙමු. ව්‍යාපෘතිය නිම කිරීමෙන් අනතුරුව උපයෝජනය නොකරන ලද අරමුදල් තිබේ නම්, අපි එම ආයතනය ණයකරුවෙකු බවට පරිවර්තනය කර ගන්නෙමු.

| | රු. |
|---|---|
| පර්යේෂණ ප්‍රදාන සහ වෙනත් විද්‍යාත්මක කටයුතු සඳහා වියදම | 41,752,302.07 |
| පර්යේෂණ ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්ව | 3,629,410.00 |
| නිධන්ගත වකුගඩු රෝගය පිළිබඳ ව්‍යාපෘතිය | 46,000,000.00 |
| වසර සඳහා සැබෑ වියදම | 91,381,712.07 |
| උපචිත වියදම් | 741,254.63 |
| | 92,122,966.70 |

## 1.3 විවිධ දෑ පිළිබඳ අරමුදලේ වියදම්

| | | රු. |
|---|---|---|
| 1. | ජාත්‍යන්තර සම්බන්ධවීම් | 7,639,644.72 |
| 2. | විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශය | 5,118,156.39 |
| 3. | තොරතුරු තාක්ෂණ ආයතනය | 2,004,157.18 |
| 4. | වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා | 885,265.84 |
| 5. | අධ්‍යක්ෂගේ කාර්යාල වැය ශීර්ෂය | 4,985,987.95 |
| 6. | විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති සැලසුම් අංශය | 1,412,278.02 |
| 7. | තාක්ෂණ අංශය | 7,956,202.99 |
| 8. | ජාත්‍යන්තර සබඳතා අංශය | 4,493,860.94 |
| 9. | ජගත් සංසදය | 6,926,145.00 |
| 10 | IDRC ජාතික විද්‍යා පදනම් වියදම් | 347,140.00 |
| 11. | සමෝධානිත මෘදුකාංග වැඩසටහන | 2,999,000.00 |
| 12. | ජාත්‍යන්තර සම්බන්ධකම් OSTD | 1,811,766.69 |
| 13. | ජාතික විද්‍යා මධ්‍යස්ථානය | 4,303,443.04 |
| | | **50,883,048.76** |

## 2. වත්කම් සහ ඒවායේ වටිනාකම තක්සේරු කිරීමේ පදනම ක්ෂයවිය හැකි වත්කම් සහ ක්ෂයවීම

මුල් පිරිවැය මත හෝ පූර්ව වසර සමග සංගත වන, ඍජු රේඛා පදනමක් මත හෝ ක්ෂයවීම් සපයනු ලැබ ඇති අතර ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයට එදිරිව වත්කම් අත්හැර දැමීම සඳහා ගණන් බලා ඇත.

### වත්කම් ප්‍රාග්ධානායනය

